# අල් කුර්ආනයේ කර්තෘ කවුද?

[ සිංහල – Sinhala – سنهالي ]

අල් කුර්ආනයේ කර්තෘත්වය ගැන පවතින මත පිළිබඳ වැදගත් විවේචන

ජාසිම් ඉබ්න් දඉයාන්

2013 - 1434

IslamHouse.com

# مصدر القرآن الكريم

« باللغة السنهالية »

## رد على شبهات المستشرقين

جاسم بن دعيان

2013 - 1434

IslamHouse.com

| | |
|---|---|
| Title of the book | : Sources of the Quran |
| Compiled by | : Jassim Ibn Daeeyan |
| Language | : Sinhala |
| Date | : 25th July 2013 |

# පටුන


1. පෙරවදන

2. හඳුන්වා දීම

3. මුහම්මද් (සල්) වරයා එහි කතුවරයාද?

4. ලෞකික සම්පත් එතුමාගේ අරමුණද?

5. බලය සහ කීර්තිය කෙරෙහි ආශාවෙන් පෙළුණේද?

6. අරාබි ජාතිකයින්ගේ සමගිය හා විමුක්තිය සඳහාද?

7. සදාචාර ගුණ වර්ධනය කිරීම එතුමාගේ අරමුණද?

8. චේතනාවකින් තොරව බොරු ගෙතීම

9. අපස්මාර රෝග සිද්ධාන්තය

10. ආගමික මිත්‍යාවේ සිද්ධාන්තය

11. ආගමික මිත්‍යාමේ සිද්ධාන්තය

12. යුදෙව් සහ ක්‍රිස්තියානු මූලාශ්‍රිතයේ ප්‍රශ්න

13. පැරණි කථාවන්හී සමානකමේ ප්‍රශ්න

14. දේව නිවේදනයක් වීමේ සිද්ධාන්තය

15. විද්‍යාත්මක තොරතුරු

16. නවීනතම විද්‍යාත්මක තොරතුරු තවත් සමහරක්

# පෙරවදන

ඉස්ලාමයට, එහි අවසන් නබිවරයා මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි සල්ලම්) තුමාණන්ට සහ එතුමාට හෙළිදරව් කරන ලද ශුද්ධ වූවූ අල් කුර්ආනයට එරෙහිව නිර්දය ලෙස විවේචනය කිරීමේ ව්‍යාපාරය ආරම්භයේ සිට අද දක්වා දිගටම සිදුවී ගෙන යන බව අප දන්නා කරුණකි. මෙවැනි විවේචකන්ට ස්ථිර පිළිතුරු ඉස්ලාමය සපයා තිබෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සෑම රටකම උසස් අධ්‍යාපන ලත් කාන්තාවන් සහ පිරිමින් විශාල පිරිසක් ඉස්ලාම් දහමට පිවිසීම දිනෙන් දින වැඩි වන බව අපි දකිමු. එවැනි පහදා දීම් අරාබි, ඉංග්‍රීසි හෝ වෙනත් භාෂා වල දක්නට තිබෙන අතර සිංහල බසින් මෙයට අදාළ පොත්පත් අවශ්‍ය ප්‍රමාණයක් නොමැති හෙයින් මෙම කුඩා පොත් පිංචය සකස් කරන්නට වුයෙමි.

මගේ මෙම ක්‍රියාවට තවත් වැදගත් හේතුවක් තිබේ. එනම්, ලාංකේය අපේ නිවස් වලට පැමිණ, තමන්ගේ ආගම ප්‍රචාර කරන ඇතැම් පිරිස් ශුද්ධ වූ අල් කුර්ආනය වෙනත් ආගමික ග්‍රන්ථයන්ගෙන් උපටා ගත් බව කිසිදු පැකිළිමකින් තොරව පවසන්නට පටන් ගෙන ඇත.

මෙලෙස චෝදනා නගන පිරිස ශුද්ධ වූ අල් කුර්ආනය ගැන කිසිදු දැනුමක් නොමැති නුගත් අය බව, මෙම කෘතිය කියවන කොයි කාටත් පෙනී යන බව මම විශ්වාස කරමි.

මෙම පොත් පිංචය ඉතා ඕනෑකමින් සංස්කරණය කර, වැදගත් උපදෙස් දුන් ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයට අයත් විශ්‍රාම ලත් පාඨශාලාචාර්ය ඒ.ඇම්.ඇම් ඉස්හායිල් සහ මුහම්මද් අසාද් යන මහත්වරුන්ට මගේ අවංක ස්තූතිය හිමිවේ.

මෙම කෘතිය කියවා සත්‍ය දැනගන්නටද අල් කුර්ආනය ගැන නිසි අවබෝධ ලබන්නටද මුස්ලිම් හෝ මුස්ලිම් නොවන හෝ කිසිවෙකුට අවස්ථාවක් ලැබුනේ නම් සියලු දෙනාගේ වෑයම සාර්ථක වූ බව සළකමු. මෙම කෘතිය ඉස්ලාම් පිළිබඳ නිවැරදි තොරතුරු සපයන තවත් පියවරකි.

සියලු ප්‍රශංසා සර්ව බලධාරි අල්ලාහ්ට හිමිවේවා. අවසාන නබි මුහම්මද් (සල්) තුමාණන්ට එතුමාණන්ගේ පවුලේ සාමාජිකයන්ට සහ එතුමාණන්ගේ අනුගාමික යන්ට අල්ලාහ්ගේ ආශීර්වාදය සහ සාමය හිමිවේවා.

**ජාසිම් ඉබ්න් දඉයාන්**

# හඳුන්වා දීම

ශුද්ධ වූ අල් කුර්ආනයේ කතෘවරයා කවුද? මෙම විෂය පිළිබඳව ඕරියන්ටලිසිට් යනුවෙන් හැඳින්වන පෙරදිග පිළිබඳ විශේෂඥ දැනුම ලත් යුරෝපානු විද්වතුන් ලෙස පෙනී සිටින පිරිස නොයෙක් තර්ක ඉදිරිපත් කළහ. එහෙත් අල් කුර්ආනයට සහ මුහම්මද් (සල්) තුමාට එරෙහිව අදහස් ඉදිරිපත් කිරීමේදී මෙම යුරෝපානු විද්වතුන් අතර තරඟයක් පමණක් නොව එකතරා එකඟත් වයක් ද තිබුණි. අල් කුර්ආනයේ කතෘ පිළිබඳව ඔවුන් ඉදිරිපත් කළ ප්‍රධාන සිද්ධාන්ත පිළිබඳව අපක්ෂපාතී හා අවදානම් සහිත සමාලෝචනයක් කිරීමට මෙම කුඩා පොත් පිංචයෙන් බලා බොරොත්තුවෙමු. මෙම ක්‍රියාවෙහිලා යුක්ති සහගත තර්ක, ඓතිහාසික සාක්ෂි, පාඨ පිළිබඳ විමර්ශන සහ නවීන විද්‍යාත්මක තොරතුරු උපයෝගී කරන්නට අදහස් කරමි.

අරාබියේ මක්කා නගරයේ හය වන ශත වර්ෂයේ උපන් මුහම්මද් (සල්) නම් කෙනෙකු විසින් අල් කුර්ආනය ප්‍රථම වරට පාරායන කරනු ලැබූ බව සියලු දෙනාම එකඟ වන කරුණකි. අල් කුර්ආනයේ කර්තෘ ගැන විවිධ සංකල්ප ඉදිරිපත් කරන විද්වතුන්, ප්‍රධාන වශයෙන් පිල් තුනකට අයත් වෙති.

මුහම්මද් (සල්) තුමා එහි කර්තෘ යයි එක් පිලක් තර්ක කරති.

මුහම්මද් (සල්) තුමා අල් කුර්ආනයේ සැබෑ කර්තෘ නොවන බවද. තව මිනිසෙනු ගෙන් හෝ කිහිප දෙනෙකු ගෙන් එතුමා එය ඉගෙන ගත් බවද තව පිරිසක් පවසති.

අල් කුර්ආනයට මානව කර්තෘවරයෙක් නොමැති බවද, එය දෙවියන් වහන්සේ විසින් මිනිසාට හෙළිදරව් කරනු ලැබූ බවද තෙවන පිරිස පවසති.

නවීන දැනුම සහ අපක්ෂපාතීව තීරණයක් ගැනීමේ නිදහස භුක්ති විඳීමේ හේතූන් මත අල් කුර්ආනය අල්ලාහ්ගෙන් හෙළිදරව් කරනු ලැබූ බව අවංකව පිළිගෙන ඉස්ලාමයට පිවිසෙන සංඛ්‍යාව දිනෙන් දින වැඩි වෙමින් පැවතීමද, එයින් බහුතරයක් බටහිර රටවලින් උසස් අධ්‍යාපනය ලත් අය බවද මෙහිදී කැපී පෙනෙන ලක්ෂණය වේ.

## 2. අල් කුර්ආනයේ කර්තෘ වරයා මුහම්මද් (සල්) තුමා ද?

ශුද්ධ වූ කුර්ආනයේ කර්තෘ වරයා මුහම්මද් (සල්) තුමා යනුවෙන් සමහරු ඉදිරිපත් කරන තර්කය ගැන මුලින්ම සලකා බලමු. මේ අයගේ ස්ථාවරය ගැන පහදා දීමට පෙර, මේ විෂය පිළිබඳ අල් කුර්ආනය පවසන්නේ කුමක් දැයි අපි දැන සිටීම වැදගත් වේ.

"සකල ලෝක පෝෂකයා විසින් පහළ කරන ලද පුස්තකය බව කිසිඳු සැකයක් නැත." අල් කුර්ආන් 32-2.

*"පුස්තකය පහළ වීම බල සම්පන්න සර්වඥාන අල්ලාහුගෙන්ය."* අල් කුර්ආන් 39-1.

*"පැහැදිලි පුස්තකය මත (දිවුරමි) ඇත්තෙන්ම, ඔබ වටහා ගනු පිණිසි අපි අරාබි බසින් (පහළ) කෙළෙමු."* අල් කුර්ආන් 15-9.

*"ඇත්තෙන්ම, අපමය සිහිපත් කිරීම (අල් කුර්ආනය) පහළ කළේ. ඇත්තෙන්ම අපමය එය ආරක්ෂා කරන්නෝ."* අල් කුර්ආන් 15-9.

මේ හා සමාන තවත් වැකි කිහිපයක් අල් කුර්ආනයේ තිබේ. එනම් 3-3, 4-105, 16-44, 25-1, 26-192 සහ 193 එයින් සමහරකි. අල් කුර්ආනයේ ශෛලිය සියලු දැහි මැවුම් කරුගෙන් නිකුත් වූ බව පෙන්නුම් කරයි. නව වැනි පිරිච්ඡේදය හැර අන් සියලු පරිච්ඡේද ආරම්භ වන්නේ "දයාපු, පරම දයාලු අල්ලාහ් ගේ නාමයෙන්" යන වචන මාලාවෙන්ය. කෙනෙකුට අණ කරන ශෛලියෙන් මුහම්මද් (සල්) තුමාට "කුල්" පවසනු යනුවෙන් අල් කුර්ආනය අමතයි. ඇත්ත වශයෙන්ම මෙම අණ කිරීම අල් කුර්ආනයේ ස්ථාන 332ක් තිබේ. මෙයට අමතරව "ප්‍රකාශ කරනු", "පාරායන කරනු", ඔබේ පරමාධිපති උත්කර්ෂයට පමුණුවනු" හෝ "සජදා කරනු" වැනි තවත් අණ කිරීම් කිහිපයක් අල් කුර්ආනයේ සඳහන් වේ. දෙවියන් වහන්සේගෙන් පහළ වූ බව අල් කුර්ආනය පැවසී මේදී මිනිසාගේ කර්තෘත්වයක් නොවීම පැහැදිලි වන අතර මිනිසාට හෝ ජින්නුන්ට එවැන්නක් ප්‍රබන්ධ කළ නොහැකි බවට අල් කුර්ආනය තරයේ අභියෝග කරයි.

*"මෙවැනි කුර්ආනයක් නිපදවන්නට මනුෂ්‍යයෝද ජින්නුද රැස්වුවද මෙවැන්නක් නිපදවන්නට ඔවුන්ට නොහැකිය. ඔවුන්ගෙන් ඇතැමුන් ඇතැමකුට උදව් කළහුදැ යි කියනු."*17-88, තවද 10-38 සහ 11-13 වැකි බලන්න.

අල් කුර්ආනය දෙවියන් වහන්සේගෙන් පහළ වූ බවද, මිනිසා විසින් නිර්මාණය නොකළ බවද තිරසාරව ප්‍රකාශ කිරීම

පමණක් නොව, එය දේව වාක්‍ය නොවන බව සැක කරන ජනයාට, එම චෝදන සියල්ල විසාධනය කරන ක්‍රමයද කුර්ආනයම පෙන්වා දෙයි.

*"අප අපගේ වහලා (මුහම්මද්) වෙත පහළ කළ දැය (අල් කුර්ආනය) ගැන ඔබ සැක කිරීමෙහි ඔබ සත්‍යවාදී නම්, අල්ලාහු හැර ඔබගේ පිළිසරණවන්නවුන් කැඳවා එවැනි සූරාවක් ගෙන එනු.' යයි කියනු."*

*"ඔබ එය නොකළේ නම්, කිසි කලෙක නොකරන්නේමයි. විශ්වාස නොකරන වුන්ට සම්පාදිත වන නරක ගින්නක දර මිනිසුන් හා ගල් වේද, එබඳු ගින්නකින් ආරක්ෂා වනු."* අල් කුර්ආන් 2-23 සහ 24

අල් කුර්ආනයේ කර්තෘවරයා මුහම්මද් (සල්) තුමානෝ යයි එල්ල කරන ඊනියා චෝදනාවට එරෙහිව ප්‍රතිචාර දක්වමින් මේ ආකාරයෙන් පිළිතුරු දෙන ලෙස අල් කුර්ආනය නබිවරයාට අණ කරයි.

"(නබි තුමනි) 'මගේ සිය කැමැත්තෙන් කිසිවක් වෙනස් කරන්නට මට නොහැක යයි' කියනු. වහී මාර්ගයෙන් මට ප්‍රකාශ කරන ලද්ද මිස, මම අනුගමනය නොකරමි. මම මගේ පරමාධිපතිට අකීකරු වී නම්. මහත් වූ දිනයේ වේදනාවට ඇත්තෙන්ම බිය වෙමි.' යයි කියනු."

"අල්ලාහ් අභිමත කළේ නම් මම එය ඔබට සමුදිරණය නොකරන්නෙමි. නැතහොත් ඔහු ඔබට එය ගැන දැනුම්ද දෙන්නේය. එයට පෙර ඔබ අතර මම දිගු වයසක් රැඳී සිටියෙමි.

ඔබ නුවණ නැත්තන්ද?" යනුවෙන් අල් කුර්ආන 10-15 සහ 16 වැකි ප්‍රශ්න කරයි.

මුහම්මද් (සල්) තුමාට එරෙහිව දොස් පවරන්නන් සමඟම වසර හතලිහක් ජීවත් වී සිටි බවද, එම කාලය තුළ අධ්‍යාපනය හෝ කවිත්ව හැකියා කිසිවක් එතුමා පෙන්නුම් නොකළ බවද පෙන්වා දී, ඒ ගැන කල්පනා කරන ලෙස අල් කුර්ආනය උපදෙස් දෙයි. ඇත්ත වශයෙන්ම එතුමා නුගත් කෙනෙකි. මවිතයට පත්කරමින් අසමසම ඉතාමත් ශ්‍රේෂ්ඨ සම්පන්න වදන් සහිත අල් කුර්ආනය එතුමා හිටිහැටියේ පාරායනය කිරීම ගැන ඔවුන්ට කුමක් කිව හැකිද? ඇත්තෙන්ම, මුහම්මද් (සල්) තුමා අමතා අල් කුර්ආනය මෙසේ පවසයි.

*"මෙයට පෙර ඔබ කිසිම පුස්තකයක් නොහැදෑරුවේය. තවද ඔබ ඔබගේ දකුණු අතින් එය නො ලීවේය. එසේ වී නම් විශ්වාස නොකරන අය අනුමාන කරන්නෝමය."* අල් කුර්ආන් 29-48.

නබි (සල්) තුමා කිසිදු අධ්‍යාපනයක් නොලැබූ කෙනෙක් බවට අල් කුර්ආන 7-158 වාක්‍යයෙන් මෙසේ තහවුරු කරයි. *"එහෙයින් අල්ලාහු ගැනද. ඔහුගේ වචනය ගැනද විශ්වාස කරන උම්මී (නුගත්) නබි වූ රසූල්වරයා ගැන විශ්වාස කර ඔබ යහමඟ වනු පිණිස ඔහු අනුගමනය කරවු.'* යැයි කියනු."

ඉහත සඳහන් අල් කුර්ආනයේ වැකි වලට අමතරව අල් කුර්ආනයේ කර්තෘ තමා නොවන බව නොයෙක් අවස්ථාවන්හී ප්‍රකාශ කර ඇත.

ශුද්ධ වූ කුර්ආනයේ කර්තෘ තමා නොවන බව මුහම්මද් (සල්) වරයා පැවසූ නමුත් බටහිර විද්වතුන් බොහෝ දෙනෙක් සැබැවින්ම එතුමා අල් කුර්ආනයේ කර්තෘ බව විශ්වාස කරති.

'හිදායා නම් ඉස්ලාමීය නීති පිළබඳ ව්‍යාක්‍යානය' යන කෘතිය ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ චාර්ල්ස් හැමිල්ටන්, එය හඳුන්වා දීමේදී මෙසේ ලියයි.

"ප්‍රතිපත්ති සහ උපදෙස් අඩංගු මෙම අපූර්ව මිශ්‍රණයේ සැබෑ කර්තෘවරයා කවරෙක්ද? යනු සදාකල් අවිනිශ්චිත කරුණකි. ආරම්භක අවදියේ දී පවා මුහම්මද් සහ එතුමාගේ ව්‍යාජ දහම් ප්‍රචාරය පිළිබඳව එතුමාගේ සතුරන් අතරද විශාල මත භේද පැවතුනි. මෙම ස්විශේෂ පුද්ගලයා එම ග්‍රන්ථය රචනා කිරීමට බොහෝ අයගේ සහාය ලබා ගත් බව කිව හැකිවාක් මෙන් එහි ප්‍රධාන තර්තෘ ඔහු බවට කිසිඳු තර්කයක් ද නැත."

මුහම්මද් (සල්) තුමාණෝ ව්‍යාජ නබිවරයෙකු බව චෝදනා එල්ල කරන හැමිල්ටන් එම ක්‍රියාවේ අරමුණ කුමක් දැයි සාධක කිසිවක් ඉදිරිපත් නොකරයි. අල් කුර්ආනය ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ රිචඩ් බෙල් නැමැති බටහිර විද්වතාද කුර්ආනයේ කර්තෘවරයා මුහම්මද් (සල්) තුමා බව දෝදනා නගයි.

"වීබර් සහ ඉස්ලාමය" යන කෘතියේ කර්තෘ වන බ්‍රයන් ටර්නර් නම් බටහිර විද්වතෙක්, මුහම්මද් (සල්) තුමා අවස්ථා වාදියෙක් සේද, එතුමාගේ අනුගාමිකයින් යුද්ධයෙන් ලබා ගත හැකි ආර්ථික වාසිය සඳහා පමණක් ක්‍රියා කරන්නන් ලෙසටද චෝදනා කරයි. ධර්මිෂ්ඨ පැවැත්මෙන් හා සදාචාර හැසිරීම

තුළින් දේශපාලන කීර්තිය සහ ධනය අත්පත් කළ නොහැකි බව මුහම්මද් (සල්) තුමා වටහා ගත් බවද, ඒ හේතුවෙන් තම ඉලක්කය කරා යෑමට එතුමා රණවිරුවන් යොදා ගත් බවද වීබර් සිය මතය දක්විය.

වැඩි වැඩියෙන් රණවිරුවන් සේවයෙහි යෙදවීමේ අවශ්‍යතා මුහම්මද් (සල්) තුමා මනාව අවබෝධ කර ගත් පවසන විබර්, මෙම රණවිරුවන් නව දහම පැතිර වීමේ උපායක් වූ බවද සඳහන් කරයි. ඔහු ඉදිරිපත් කළ තර්කය තවත් කරුණු රාශිකායක් තිබේ. රහසිගත දහම් ප්‍රචාරය තුළින් මක්කාවේ බලය ස්ථාපනය කළ නොහැකි වූ විට රණවිරුවන්ට ආයාචනා කිරීමට මුහම්මද් (සල්) තුමාට සිදු වූ බවද එතුමාගේ ඒක දේව වාද සංකල්පය රණවිරු කුලයට ගැලපෙන අයුරින් හැඩ ගස්වා ගත් බවද වීබර් පවසයි. එනම් රණවිරුවන් නබි (සල්) තුමාට දක්වන භක්තිය මත නොව දේපළ අත්පත් කර ගන්නට ඔවුන් තුළ තිබූ තණ්හාව මත ක්‍රියා කළ බවද ඔහු පවසයි. මේ අනුව ඉස්ලාමීය ඉතිහාසයේ සිදු වූ යුද්ධ, ආගමික ශ්‍රද්ධාවේ ඇල්මකින් නොව විශාල දේපළ හිමි කර ගැනීමේ අරමුණින් සිදු කළ එකක් සේ බ්‍රයන් ටර්නර් නිගමනය කරයි.

“මිනාරතයේ ඇරයුම” නම් කෘතියේ කෙනත් ක්‍රැග් නම් තවත් විද්වතෙක් අල් කුර්ආන් වැකි පාරායනයෙන් ආරම්භ වූ එකක් විය හැකි වුවද පිළිම වන්දනය නම් මිත්‍යාශීලි පාප ක්‍රියාවෙන් තම ජනයා රැක ගන්නා අදහසින් එම වාක්‍යය දෙවියන් වෙතින් පහළ වූ බව මුහම්මද් (සල්) වරයා පැවසූ එකක් සේ තර්ක කරයි. තමා වටා තිබෙන ලෝකය පිළිබඳව මුහම්මද් (සල්)

තුමා විමර්ශන ශිලීව යෙදුනු නිරීක්ෂණයෙන් පසුව නිකුත් කළ ප්‍රකාශනය අල් කුර්ආනය බව ඔහුගේ මතය වේ.

ආතර් ජේ. ආබරි නම් තවත් යුරෝපානු විද්වතෙක්ද “කුර්ආනයේ විග්‍රහය” යන කෘතියෙහි මෙලෙස අදහස් දක්වයි.

“මිනිසා නිවට කමට පමුණුවන පිළිම වන්දනයෙන් සිය රට වැසියන් මුදවා ගැනීමට තිබුණු අවංක ආශාව මත මුහම්මද් (සල්) වරයා ක්‍රියා කළ බවට සාක්ෂීන් පෙන්නුම් කරයි. එතුමාගේ සිත සම්පූර්ණයෙන් ආක්‍රමණය කළ ඒක දේවවාදය නම් උතුම් සත්‍යය ශබ්ද නගා ප්‍රකාශ කරන්නට එතුමා පොලඹවනු ලැබුවේය. ඉලක්කය ජය ගැනීමට එතුමා පරිච්ඡේද ඉදිරිපත් කරන උපක්‍රමයක් යොදා ගත්තේය. මේ අයුරින් තමාට දේව නියෝගය ලැබෙන බවද තමා නබි වරයෙකු බවද එතුමා විශ්වාස කළහ. මෙහිදී එවකට පැවැති අවස්ථාවන්ද අනුක්‍රමයෙන් ලබා ගත් ජයද එතුමාගේ මෙම විශ්වාසයට අනුකූල විය.”

“අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණයෙන් තම මව්බිම මුදවා ගන්නට මුහම්මද් (සල්) වරයා තුළ තිබුණු බලවත් ආශාව හේතු කොට ගෙන තම ජනයා සමගි කිරීමේ අරමුණින් එතුමා නබිත්වය තොරා ගත් බව මුලොකොසි නම් තවත් යුරෝපානු විද්වතෙක් පවසයි.

නව කතෝලික විශ්ව කෝෂයද අරාබි ජාතීන් එක්සත් කිරීමේ අරමුණින් මුහම්මද් (සල්) වරයා නබිත්වයේ ඇරයුම උපයෝගී කළ බව මෙසේ පවසයි. “අවුරුදු හතලිහක් පමණ

වියෙහි ඒක දේව විශ්වාසය යටතේ අරාබි ජාතීන් සමගි කරන අරමුණින් මුහම්මද් (සල්) වරයා නබිත්වයේ ඇරයුම ලැබූහ."

එහි සාරාංශය නම්. දෙවියන් වහන්සේගෙන් පහළ වූ බව මුහම්මද් (සල්) වරයා පැවසීම වනාහි, ආර්ථික වාසිය, බලය කෙරෙහි තන්හාව, සමාජයේ සදාචාර ගුණ වර්ධනය, අරාබිවරුන්ගේ දේශපාලන නිදහස වැනි හේතුන් බලපා ඇති බව පෙන්නුම් කිරීමට ඒ තර්ක වලින් උත්හාස දරයි. එම තර්ක සියල්ලම යුක්ති සහගත බව පිළිගැනීමට නොයෙකුත් පටහැනි කරුණු පැන නගී. මේවා එකිනෙක ගැන සොයා බැලීම වැදගත් හෙයින් පෞද්ගලික වාසියේ චෝදනා ගැන පළමුව සලකා බලමු.

## ලෞකික සම්පත් එතුමාගේ අරමුණද?

ඉතාමත් පහසු මාර්ගය කවුරුත් ප්‍රිය කරන බව ඇතැම් අයගේ තර්කයවේ. ඒ අනුව කුර්ආනය අල්ලාහ් ගෙන් පහළ වූ බව මුහම්මද් (සල්) තුමාණෝ පැවසුවේ විශාල ලාභයක අපේක්ෂාවෙන් බව ඇතැමුන් කියති. යථාර්ථයේ සාක්ෂිය හා එම අදහස කිසිසේත් සැසෙඳෙන්නේ නැත. නබිත්වය ලබන්නට පෙර මුහම්මද් (සල්) තුමාණන්ගේ ආර්ථික තත්ත්තවය යහපත් එකක් වූ බව කවුරුත් දනිති. විසිපස් වන වියෙහිදී ධනවත් ව්‍යාපාරික කාන්තාවක් වන කදීජා (රලි යල්ලාහු අන්හා) තුමිය සමඟ විවාහ වී අගහිඟකමින් තොරව එතුමා ජීවත් විය. වසර පහළොවකට පසුව නබිවරයෙකු ලෙස එතුමාගේ ජීවිතයේ ආර්ථිකය හා සැප සම්පත් ගැන ඊර්ෂ්‍යා වීමට කිසිදු හේතුවක් නොවීය.

මුහම්මද් (සල්) තුමාණන්ගේ බිරියන් වන ආයිෂා (රලි) තුමිය නිවසේ පිසීමට කිසිඳු ආහාරයක් නොමැති හේතුවෙන් ඇතැම් විට මාසයක් දෙකක් ලිප නොමොළ වූ බව පවසයි. එවැනි දින වල පවුලේ අය රට ඉඳි හා ජලයෙන් කුස පුරවා ගත්හ. ඇතැම් අවස්ථාවන්හී මදීනා වාසීන් සපයන එළු කිරි බීමට ලැබුණි. (මුලාශ්‍ර ඉමාම් නවවි ගේ රියාළුස් සාලිහීන් ග්‍රන්ථය)

“පැරණි මූලාශ්‍රයෙන් ලැබූ තොරතුරු අනුව මුහම්මද් ගේ ජීවිතය” යන කෘතියේ මාර්ටින් ලිංස් නම් විද්වතා මෙසේ ලියයි. “නිබිවරයා සහ එතුමාගේ පවුලේ අය ඉතාමත් සකසුරුවම් සහිතව ජීවත් වූහ. (යුදෙව් වරුන් පාලනය කළ උතුරු අරාබියේ) කෑයිබර් පලාත අත්පත් කර ගන්නට පෙර කුස පිරෙන්න රටඉඳි පවා කෑමට ගෙදර අය දැන නොසිටියහ. දවසින් දවස වැඩිවන පවුලේ සාමාජිකයන් ජීවත් වූ දිළිඳුකමේ සැබෑ ස්වරූපය එයයි. එතුමාගේ බිරියන් ඉතාමත් අත්‍යවශ්‍ය දේ පමණක් එතුමාණන්ගෙන් ඉල්ලා සිටි අතර ඇතැම් විට ඒවා පවා ඉටකර දීමට එතුමාට නොහැකිවුණි.”

මෙම තත්ත්වය තාවකාලික කැපවීමක් නොව එම පවුල ඇලුම් කළ ජීවන රටාව එයවේ. මුහම්මද් (සල්) තුමාණෝ කැමති වුයේ නම් රජ කෙනෙක් ලෙස ජීවත් වීමට හැකි අවස්ථාවක එතුමා ජීවත් වූ තත්ත්වය වුයේ එයයි. ඇත්ත වශයෙන්ම එතුමාගේ බිරියන්ගෙන් ඇතැම්හු මදීනා වාසින් සැප සම්පත්ව සිටියදී තමන් පමණක් එවැනි දිළිඳුකමින් දිගින් දිගට ජීවත් වීම ගැන අසතුට ප්‍රකාශ කරන්නට වූහ. මෙම අසහනය ගැන නබිවරයා කනස්සලට පත්ව සිටින අවස්ථාවෙහි, අල්ලාහ් නොහොත් තාවකාලිව ලොකයේ අලංතකාරය යන දෙකෙන්

එකක් තෝරා ගන්නැයි එතුමාණන්ගේ බිරියන්ට දන්වන ලෙස අණ කර අල් කුර්ආන් වැකි පහළ වුය.

"අහෝ, නබි තුමනි, 'ඔබ මෙලොව ජීවිතයද එහි අලංකාරයද කැමැත්තහු නම් එනු, මම ඔබට පරිභෝගයක් සපයා ඔබ ගෞරවයෙන් මුදවන්නම්.'යි ඔබගේ බිරියන්ට කියනු."

"ඔබ අල්ලාහුද ඔහුගේ රසූල් වරයාද අන්තිම නිවාසයද කැමැත්තහු නම් ඇත්තෙන්ම අල්ලාහ් ඔබගෙන් යහකම් කරන්න වුන්ට මහත් වූ ඵල විපාක පිළියෙල කර තබා ඇත්තේය." අල් කුර්ආන් 33–28 සහ 29 වැකි.

නබි (සල්) තුමාණන්ගේ නිවසේ එතුමාගේ කාමරය ගැන උමර් (රලි) මෙසේ පවසයි. "එතුමාගේ කාමරයේ හම් කැබලි තුනක් සහ මුල්ලක බාර්ලි ස්වල්පයක් තිබෙනු දුටු වෙමි. තවත් අවට බැලූ නමුත් වෙන කිසිවක් නොතිබුණි. මම අඬන්නට පටන් ගත්තෙමි. 'ඔබ අඬන්නේ ඇයි?' දැයි එතුමා මගෙන් ඇසීය. 'නබි (සල්) තුමනි, මම නාඬමින් සිටින්නේ කෙසේද? ඔබ තුමාගේ සිරුර මත පැදුරේ ලකුණු තිබෙන බව මට පෙනෙනවා. එමෙන්ම මෙම කාමරයේ තිබෙන සියලු දේ මට පෙනෙනවා. නබි (සල්) තුමනි, අල්ලාහ් අපට වැඩි වැඩියෙන් ආහාර දෙන ලෙස යාච්ඤා කරනු මැනවි. දේව විශ්වාසයක් නොමැතිව අල්ලාහ්ට නොව තම රජවරුන් වන කෙයිසර් සහ කොස්රොස් වරුන්ට නැමදුම් කරන රෝමානු හා පර්සියානු ජාතීන් ඇළදොළ ගලන උයනේ ජීවත්වන විට අල්ලාහ් විසින් තෝරා පිළිගත් වහලා වන නබිවරයා දරුණු දිළිඳුකමේ ජීවත් වීමට සිදු වී ඇත.' යයි පැවසුවෙමි. කොට්ටය මත ඇල වී මම මේ ආකාරයෙන් කථා කිරීම ඇසූ නබි (සල්) වරයා නැගිට වාඩි

වී 'යා උමර්, මේ කාරණය ගැන ඔබ තවමත් සැක කරන්නේද? මතු ජීවිතයේ සැප පහසුව මේ ලොවේ සැප පහසුවට වඩා බොහෝ උසස්ය. දේව විශ්වාසය නොමැති අය සියලු හොඳ දැයින් මෙලොවේ සතුටු වන විට අපහට ඒවා අනිත් ලොවේ ලැබෙනු ඇත.' යනුවෙන් කීවේය. එවිට මම 'අල්ලාහ්ගේ නබි (සල්) තුමනි, මා වෙනුවෙන් අල්ලාහ්ගෙන් සමාව අයදින්න. සැබැවින්ම මම කර ඇත්තේ වරදකි.' යයි කීවේය." මාර්ටින් ලිංස් ගේ කෘතියෙන් උපුටා ගන්නා ලදී.

අයිෂා (රලි) තුමායගේ නිවසෙහි නබි (සල්) තුමාගේ ඇඳේ ඇතිරිලි ගැන කෙනෙක් එතුමියගෙන් විමසීය. ඉඳිගසේ පොතු පිරුණු හමකි (උරයකි) යයි එතුමිය පිළිතුරු දුන්නාය.

එතුමාගේ බිරියක් වන හෆ්සා (රලි) තුමියට මෙම ප්‍රශ්නය ඉදිරිපත් කළවිට එතුමිය මෙසේ පැවසුවාය. "දෙකට නැමූ හණ රෙදි කෑල්ලකි. එතුමාට පහසු වනු පිණිස වරක් එම හණ රෙද්ද හතරට නමා එතුමාණන්ගේ ඇඳ මත දැමුවෙමි. පසු දින පාන්දර "ඊයේ රාත්‍රි ඇඳට දැම්මේ කුමක්දැ? යි එතුමා විමසීය. "ඒ හණ රෙදි කෑල්ලම වෙනදා මෙන් නොව හතරට නැමුවෙමි." යනුවෙන් පිළිතුරු දුන්නෙමි. එවිට "කලින් කළ ආකාරයටම තියන්න. මගේ තහජ්ජුද් (මධ්‍යම රාත්‍රි) නැමදුමට අමතර සහනයෙන් බාධාවක් සිදුවෙනවා." යනුවෙන් එතුමාණෝ කීය.

මුහම්මද් (සල්) තුමාණන්ගේ දිළිඳුකම. සිය කැමැත්තන් එතුමාණෝ තොරා ගත් එකක් බව මෙහිදී පෙන්වා දිය හැකිය. එතුමාණන්ට ත්‍යාග වශයෙන් යමක් ලැබුණේ නම් ඒවා සියල්ල දුප්පත් ජනතාවට බෙදා දුන් අතර, කිසිවක් තම අවශ්‍යතාවට නොගත්හ. වරක් ෆිදාක් පළාතේ ප්‍රධානියාගෙන්

ඔටුවෝ හතර දෙනෙක් මත පටවා ගත් බඩු පොදි ලැබී ඒවා සියල්ල බෙදා හැරියහ. එතුමා අවසාන හුස්ම හෙළූ මොහොතේ, එතුමා සතුව එක තඹ කාසියක් වුවද නොතිබුණි. එතුමා සතුව දීනාර් හතක් තිබුණද ඒවා තමා ළඟ ඉතිරි වනු ඇතැයි බිය වී සිය මරණයට දින කිහිපයකට පෙර දුගීන්ට එය බෙදා දුන්හ. විශිෂ්ට ලෙස ජය ලබා සිටිය එතුමා මරණාසන්න මොහොත වන විට ණය බර වී සිටයහ. එතුමාගේ පලිහ පවා ණයක් සඳහා මදීනාවේ යුදෙව් ජාතිකයෙකුට උකස් කර තිබුණු බව වාර්ථාවක සඳහන් වෙයි.

නබිත්වය ලැබීමෙන් පසු තම මරණය දක්වා මුහම්මද් (සල්) වරයා ඉතාමත් සකසුරුවම් සහිත ජීවිතයක් ගත කළ බව පවසන වාර්ථා බොහෝමයක් ඇත. එතුමා ලෞකික සම්පත් රැස් කිරීමට අදහස් කළ බවට නගන චෝදනාව ඉතිහාසයේ යථාර්ථය හා කිසිසේත් නොසැසඳේ. නව කතෝලික විශ්ව කෝෂයේ 9 වන වෙළුම පිටු අංක 1001 මෙසේ පවසයි. “මුහම්මද් (සල්) තුමාගේ ආගමික විප්ලවයට තුඩු දුන්නේ ආර්ථික ලාභය බව චෝදනා නගන්නට ඇතැමුන් ඉදිරිපත් වූහ. එහෙත් කවුරුත් දන්නා යථාර්ථය හා එම කථාව කිසිසේත් එකඟ නොවේ.”

# 4. බලය සහ කීර්තිය කෙරෙහි ආශාවද?

බලය සහ කීර්තිය කෙරෙහි ආශාව මත මුහම්මද් (සල්) තුමාණෝ ක්‍රියා කළ බව ඇතැමුන් දක්වන අදහස කිසිදු යථාර්ථයක් නොමැති මුසාවකි. මුහම්මද් (සල්) තුමාණෝ මානව ඉතිහාසයේ ඉතාමත් ජයග්‍රාහී නායකයෙකු යැයි මුළු

ලොවම එක හෙළාම පිළිගෙන හමාරය. එතුමා මෙන් උසස් ගති පැවැතුම් සහිත කෙනෙක් නබිත්වය ගැන කිසිවක් සඳහන් නොකොට, නායක ධුරයට ඉදිරිපත් වූයේ නම්, එතුමාට සම්පූර්ණ බලය අත්පත් කරගත හැක. ඇත්ත වශයෙන්ම ඒ පියවර ඉතාමත් පහසු එකක් වේ. ඒ සමඟම මුහම්මද් (සල්) ඇතුළු කිසිවෙකුට ශුද්ධ වූ කුර්ආනය හා සමාන ග්‍රන්ථයක් නිර්මාණය කළ නොහැකි බව අල් කුර්ආනය තරයේ අභියෝග කරයි. නබි (සල්) තුමා බලය පසුපස ලුහු බඳින කෙනෙකු වූයේ නම් අලංකාරය හා උසස් භාවයෙන් අන් කිසිදු ග්‍රන්ථයකට තරඟ කළ නොහැකි, අල් කුර්ආනයේ කර්තෘවරයා තමා බව ඉදිරිපත් වන්නට තිබුණි.

තවද මුහම්මද් (සල්) තුමාණන්ගේ චරිතය ගැන දන්නා ඕනෑම කෙනෙක් එතුමා බලය හෝ කීර්තය පතන්නෙක් නොවන බව හොඳ හැටි දනී. දර්ශනීය ගොඩනැගිලි, අලංකාරවත් ඇඳුම් පැලඳුම්, වටිනා යාන වාහන, නිතර ප්‍රශංසා කරන අයගේ මිත්‍රකම, බොරු ආටෝප වැනි දේ කීර්තිය පතන්නන් ප්‍රිය කරන වටපිටා වකි. එහෙත් මුහම්මද් (සල්) තුමාණෝ නිහතමානී ගුණයට ආදර්ශයක් වූහ. නබිවරයෙක් වශයෙන් සමාජයේ දරණ උසස් ස්ථාන හෝ රටේ නායකයෙක් වශයෙන් දරණ වගකීම් මධ්‍යයේ තම නිවසේ වැඩ කටයුතු වලට එතුමා සහාය වූහ. තම ඇඳුම් ඉරුණු විට එය මසා ගත්හ. පාවහන් කැඩුනු විට එයද සාදා ගත්හ. නිවසේ ඇති දැඩි කරන එළුවන්ගෙන් කි෴ දෙවීමේහිද එතුමා නිරතවිය. තම සමීපයට පැමිණෙන සියලු අයට සවන් දී ඔවුන් සමඟ කථා කිරීම එතඅමාගේ සිරිතකි. එතුමාගේ නුගුණ කියන්නන්, "ඔහු සැම

හටම සවන් දෙයි.” යනුවෙන් දොස් පැවරූ බව අල් කුර්ආනය සඳහන් කරයි.

එක් කලක මුහම්මද් (සල්) තුමාණන්ට දක්වන ගෞරවය හේතුවෙන් එතුමාව පිළිගනු පිණිස නැගිට සිට ආචාර කිරීම මුස්ලිම් වරුන්ගේ පුරුද්දක්වීම නිසා, එසේ නොකරන ලෙස නබි (සල්) තුමා අණ කළහ. “සමහර අයට නැගිට සිට ගෞරවය දක්වන පර්සියානු ජාතීන් මෙන් ඔබද නොකරනු.” යයි එතුමාණන් අවවාද කළහ. දේශපාලනයෙක් දුටු විට සියලු දෙනාම නැගිට ආචාර කරන ලෙස ජනතාවට බල කිරීම ඉස්ලාමයේ අසම්මත කාවැදුනු පුරුද්දක් යයි මිසර අස්ගර් විශ්ව විද්‍යාලයේ උප කුලපති ෂෙයික් යූසුෆ් කර්දාවි සඳහන් කරයි. ආචාර්ය ජමාල් බදවි ඒ පිළිබඳව තවත් කරුණු ගෙන හැරපායි.

දිනක් නබි (සල්) තුමාණෝ ගමනක් ගිය අවස්ථාවේදී, සහාබාවරු ආහාර පිළියෙල කිරීමේ වැඩ කොටස තමන් අතර බෙදා ගත්හ. තමන් දර එකතු කරන වැඩ භාර ගන්නා බව මුහම්මද් (සල්) තුමාණෝ පැවසුහ. එතුමාගේ වැඩ කොටසද තමන් කරන බව සහාබාවරු පැවසූ විට “මාගේ වැඩ කොටසත් ඉටු කරන බව දනිමි. එහෙත් වරප්‍රසාද ලබන්නට මා අකැමැතිය.” එතුමාණෝ ප්‍රකාශ කළහ.

එතුමාව දැකගන්නට පැමිණි කෙනෙක් එතුමා කෙරෙහි දක්වන ගෞරවය නිසා වෙවුලමින් සිටිනු දුටු නබි (සල්) තුමා ඉතාමත් කාරුණිකව ඔහුගේ පිටට තට්ටු කර, “කලබල නොවන් සහෝදරයා. මම වියළි රොටි ආහාරයට ගත් කාන්තාවකගේ පුතෙකු පමණක් වෙමි.” යයි කීහ.

දිනක් පිරිසක් නබි (සල්) වෙත පැමිණ, "අප අතරෙහි සිටිනා උතුම් කෙනෙකුගේ පුත්‍රයෙක් වූද, අප නාහකයා මෙන්ම අප නායකයාගේ පුත්‍රයාද වන අල්ලාහ්ගේ දූතයාණනි," යනුවෙන් ඇමතූහ. "ජනතාවනී, ඔබ කලින් පැවසූ දෙය හෝ ඉන් කොටසක් හෝ පමණක් පවසනු. ෂෙයිතාන්ට ඔබ නොමඟ යවන්නට ඉඩ නොතබනු. මුහම්මද වන මම අල්ලාහ්ගේ සේවකයෙක් මෙන්ම ඔහුගේ දූතයෙක් වෙමි. අති උතුම්, කීර්තියක් හිමි අල්ලාහ් මට දී තිබෙන තත්ත්වයට වඩා ඉහළ තත්ත්වයට මා පත් කරනවාට මම අකැමැතියි." යනුවෙන් ඔවුන්ට කීහ.

දිනක් ගී ගයමින් සිටි ගැහැනු ළමයින් පිරිසක් පසු කරමින් නබි (සල්) තුමාණන් ගියහ. එතුමා දුටු ළමයෙක්, "අනාගතයේ සිදුවන දේ දන්නා නබිවරයෙක් අප අතර සිටියි." යනුවෙන් කවියක් කීවාය. එසේ නොකියා වෙනත් කුමක් හෝ කවියක් කියන ලෙස ඒ ළමයාට නබි (සල්) පැවසීය.

මුහම්මද් (සල්) තුමාගේ ආදරණීය පුත්‍රයා වන ඉබ්රාහිම් කුඩා වියෙහිම මරණයට පත් වූ විට සූර්ය ග්‍රහණයක් සිදු වූ නිසා, ඉබ්‍රාහීම්ගේ මරණයට අහසද පොළොවද ශෝකවන බවද, එය අල්ලාහ්ගේ ප්‍රාතිහාර්යක් බවද ඇතැම් අය සිතන බව දැන ගත් මුහම්මද් (සල්) තුමණෝ දැඩි කෝපයට පත්ව, "ඉර හා හඳ අල්ලාහ්ගේ සංඥා දෙකකි. කිසිඳු මිනිසෙකුගේ උපත හෝ විපත හේතු කොට ගෙන ඒවාහි ග්‍රහණය සිදුවන්නේ නැත." යයි හඬ නගා ප්‍රකාශ කළහ.

තම බලතල උපරිම තත්ත්වයේ තිබිය දී පවා නබි (සල්) තුමාණන්ගේ නිහතමානී භාවය කෙතරම් විස්මජනක

දැයි දැක ගත හැක. එතුමාගේ අනුගාමිකයෝ එතුමාට අවනත වීමට නිතර සූදානම්ව සිටි නමුත් අවනත වීම තමාට නොව අල්ලාහ්ට සිදු කළ යුතු බව නබි (සල්) තුමාණන් පැවසූහ. අල්ලාහ්ගෙන් පහළ වූ දේව වාක්‍යයන් සහ මිනිසාගේ විචාර බුද්ධියට අදාළ කරුණු අතර තිබෙන වෙනස පැහැදිලි වම පෙන්වා දෙන්නට වූහ. ශුද්ධ වූ කුර්ආනයේ නියෝග නොවන විෂයන්හී සෙසු අයගේ අදහස් විමසා එවාට නිසි අයුරින් ගෞරවය දක්වන්නට වූහ. බද්ර් සටනේදී නබි (සල්) තුමාණන් සිය කැමැත්ත පසකට දමා හබීබ් බින් මුන්දිර් (රලි) ගේ යෝජනාව පිළිගත්හ. උහද් සටනේදී මදීනා නුවර රැඳී සිට සතුරන්ට මුහුණ දෙන්නට මුහම්මද් (සල්) තුමාණෝ කැමති වුවද, නගරයෙන් බැහැරව ගොස් සතුරන්ට මුහුණ දිය යුතු බව බහුතර තරුණ සහාබා වරුන්ගේ අදහස විය. එම අදහසටද නබි (සල්) තුමාණෝ එකඟ වූහ. අගල් යුද්ධයේදී මදීනාව වටා අගලක් කපන ලෙස සල්මාන් අල් ෆාර්සි (රලි) තුමා දුන් අදහසද පිළිගෙන ක්‍රියාවේ යොදවනු ලැබීය. රසූල් (සල්) තුමාණන්ගේ ඒ ක්‍රියාදාමය "ඔවුන්ගේ කරුණු ඔවුන් අතර සාකච්ඡා කරති." යනුවෙන් අල් කුර්ආන් 42-38 වාක්‍යයෙහි පවා තහවුරු කර තිබීමද දැක ගත හැක.

තම සොහොන නැමදුම් කරන ස්ථානයක් බවට පත් කිරීමට එරෙහි ව මුහම්මද් (සල්) තුමාණෝ දැඩි විරෝධය පළ කරන්නට වූහ. 'උත්සව පවත්වන ස්ථානයක් බවට මාගේ සොහොන පත් නොකරනු.' යනුවෙන් තහනම් කරන්නට වූහ. 'මාගේ පරමාධිපතියාණෙනී, මගේ සොහොන වැඳුම් පිදුම්

කරන පිළමයක් ලෙස පත් නොකරනු මැනවි.' යයි අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කිරීම එතුමාගේ සිරිතකි.

සීමාව ඉක්මවා තමා ගැන වර්ණනා නොකරන ලෙස මහම්මද් (සල්) තුමාණෝ තම අනුගාමිකයින්ට තදින්ම අවවාද කළහ. "මරියම්ගේ පුත්‍රයාවන ජේසු තුමාට බැතිමතුන් ගෞරව සම්මාන කරන ආකාරයට මට කිසිවක් නොකරනු. ඒ වෙනුවට 'මම අල්ලාහ්ගේ වහලෙක් හා අල්ලාහ්ගේ දූතයෙක් යනුවෙන් පමණක් කියනු.' යයි එතුමාණෝ කීවේය. මිනිසුන් එකිනෙකාට අධික ලෙස ගෞරව සම්මාන පිරිනැමීම ගැන අල් කුර්ආනය අපට අවවාද කරයි. *"ඔබ තමන්ට විශුද්ධ බව ආරෝපනය නොකරවු."* අල් කුර්ආන් 53-32.

මේ කරුණු වලට අමතරව මුහම්මද් (සල්) තුමාණන් සිය බලය සහ විශිෂ්ට දන්ෂතාවය ලබාගන්නා අරමුණින් කුර්ආනය රචනය කළ බව ඇතැම් අය ඉදිරිපත් කරන තර්කයට එරෙහිවද බොහෝ කරුණු ඇත. සිය අභිලාෂයට වාසිදායක නොවන සියලු වැකි ශුද්ධ වූ කුර්ආනයෙන් ඉවත් කිරීම ස්වභාවික දෙයක් වන නමුත්, එතුමාණෝ එවැනි කිසිවක් නොකළහ. අල් කුර්ආනයේ කතුවරයා එතුමා වූයේ නම් තමාට බලයක් නැති බවද, ගුප්ත දැයෙම් දැනුමක් නොමැති බවද. එවානි ශක්තියක් ගිබුනේ නම් සියලු දෙයක්ම සපුරාගන්නා බවද කිසිදු හානියක් සිදු නොවීමට වග බලා කන්නා බවද ප්‍රකාහ කරන ලෙස අණ කරන ග්‍රන්ථයක් නබි (සල්) තුමාණෝ රචනා කළේ කුමක් සඳහා දැයි ප්‍රශ්න කළ යුතු කරුණකි. තමා නව දහමක් ගෙන ආවේ නැති බවද, මෙවැනි ග්‍රන්ථයක් තමාට පහළවීමට බලාපොරොත්තුවක් නොවූ බවද, අනිකුත්

මිනිසුන් මෙන් තමා සාමාන්‍ය කෙනෙක් බවද ප්‍රකාශ කරන ලෙස අණ කරන කෘතියේ රචනනය කළේ කුමන හේතුවක් නිසාද?

නව ආගම අත නොහැරියොත් එතුමාට හිංසා කරන බවට, ඝාතන කරන බවට කුරෙයිෂිවරු තර්ජන කළ විට තම මහප්පා අබූ තාලිබ්ට නබි (සල්) තුමාණෝ දුන් පිළිතුරු ඉතාමත් වැදගත්ය. "මහප්පේ, අල්ලාහ්ගේ නාමයෙන් දිවුරා කියමි. මගේ මේ වැඩ කටයුතු අතහැරීමට, මගේ දකුණු අතේ සූර්යයාද වමතේ චන්ද්‍රයාද තැබුවත් මම මෙය අත නොහරිමි. අල්ලාහ් මට ජය දෙන තුරු හෝ මෙම ක්‍රියාවෙන් මරණයට පත්වන තුරු මම ඉදිරියට ගෙන යන්නෙමි."

*"(ප්‍රතික්ෂේප කරන අයට) පවසනු, අල්ලාහුගේ නිදහන් මා අත තිබෙන්නේ යයි මම නොකියමි. ගුප්ත දැය මම නොදන්නෙමි. මා මලාඉකා (සුර දූතයෙක්) යැයි ඔබට නොකියන්නෙමි. මා වෙත වහී මාර්ගයෙන් ලැබූ දැය හැර වෙන කිසිවක් මම අනුගමනය නොකරමි."* අල් කුර්ආන් 6-50.

*"පවසනු. මම ඔබ වැනි මිනිහෙක් පමණක් වෙමි."* අල් කුර්ආන් 18-110

*"(නබි තුමාණනි) ඔබට පුස්තකය පහළ කරනු ලබන්නේ යයි ඔබ අපේක්ෂා නොකළේය. එහෙත් (එය) ඔබේ හිමිගේ දයාලුභාව යෙන්ය"* අල් කුර්ආන් 28-86.

*"පවසනු. මම රසූල්වරුන්ගෙන් අමුත්තෙක් නොවෙමි. (මෙලොවෙහි) මා ගැන හෝ ඔබ ගැන හෝ කුමක් කරනු ලැබේ දැයි මම නොදනිමි."* අල් කුර්ආන් 46-9

බලය අත්පත් කරන්නට තිබෙන අභිලාෂය නිසා මුහම්මද් (සල්) තුමාණෝ එකම සිහියෙන් ශුද්ධ වූ කුර්ආනය රචනය කළේ නම් ඉහත සඳහන් වැකි එහි ඇතුළත් වූයේ කෙසේදැයි හේතු පෙන්වීම මහත් දුෂ්කර ක්‍රියාවකි.

දෙවනුව, ප්‍රථම වරට අල් කුර්ආන් වැකි කිහිපියක් පහළ වූ මොහොතෙහි එතුමාණෝ දැක් වූ ප්‍රතිචාරය බලය කෙරෙහි අභිලාෂයක් රහසිගතව හෝ තිබුණු බවක් නොපෙන්වයි. හිරා ගල් ලෙන හි සිටින විට, අල් කුර්ආනය පහළ වූ විගස, සිය බිරිය වෙතට ළඟිලහියේ පමිණි එතුමාණන්ගේ සිත් තුළ තිබුණේ මහත් වූ භීතියකි. බයට පත් වී උණ වෙලඳුනා මෙන් වෙවුලමින් පැමිණි එතුමාණෝ, රෙදි කැබැල්ලකින් සිරුර පොරවන ලෙස බිරියට කීහ. බිය තුරන් වූ පසු සියලු විස්තර බිරියට පවසා, “කදීජා, මට සිදුවුණේ කුමක්දැ? යි සිත් කනස්සලෙන් යුතුව විමසන්නට විය.

ශුද්ධ වූ කුර්ආනය හෙළිදරව් වූ බව පැවසීමත් බලය අත්පත් කර ගැනීමට මුහම්මද් (සල්) තුමාණෝ යොදා ගත් රහස් උපක්‍රමයේ එක් පියවරක් නම්, එතුමා බියට පත්විමට කිසිදු හේතුවක් නැත. දේව වාක්‍ය පිළිබඳව කිසිදු බලාපොරොත්තුවක් නොමැති නමුත්, නබිත්වය ගැන අභිලාෂයක් රහසිගතව හෝ එතුමාණන්ගේ සිතෙහි තිබුණේ නම්, දේව වාක්‍ය පහළ වීම එතුමාණන්ට මහත් සතුටට හේතුවක් විය යුතුයි. මන්ද, එතුමා නිතර ආශා කළ දෙයක් ඉෂ්ට වන සලකුණ එය වීමයි. එහෙත් එතුමා මේවා කිසිවක් සකස් නොකළ බවටද දේව වාක්‍ය අපේක්ෂා නොකළ බවටද ඒ සියලු සාක්ෂිවලින් පෙන්නුම් කරයි. දේව වාක්‍ය පහළ

වීමෙන් එතුමාණෝ මවිකයට පත් වූහ. මේ ගැන ශුද්ධ වූ කුර්ආනය පවසන්නේ මෙසේය. *“ඔබට ග්‍රන්ථයක් පහළ කරනු ලබන්නේ යයි ඔබ අපේක්ෂා නොකළේය. එහෙත් (එය සිදුවුණේ) ඔබගේ පමාධිපතිගේ දයාලු භාවයෙන්ය.“* අල් කුර්ආන් 28-86.

තෙවනුව, තම සහාබාවරුන් ඉදිරියේදී මුහම්මද් (සල්) තුමාණන්ට වහි පහළ වූ අතර එම අවස්ථායන්හී එතුමාණන්ගේ මුහුණෙහි අමුතුම වෙනසක් සිදුවීම කවුරුත් දුටුහ. තද ශීතල දිනයන්හී පවා එතුමාණන් ගේ මුහුණේ ඩහදිය පෙනුනු අතර. එතුමාගේ අත්පා පවා වලංගු නැති තත්ත්වය පෙන් විය. ඉවසීම නැති ස්වාභාවය ප්‍රසිද්ධ ස්ථානයක ප්‍රදර්ශනය කිරීමෙන් කෙනෙකුගේ දුබලතාව පෙන්නුම් කෙරෙන බව සාමාන්‍යයන් සැලකෙන නිසා, මුහම්මද් (සල්) තුමාණෝ ශුද්ධ වූ කුර්ආනයේ ආධාරයෙන් බලය අත්පත් කරන්නට වෑයම් කරන කෙනෙක් වූයේ නම්, සෑම අවස්ථාවකම අන් අය ඉදිරියේ සිය හැඟීම් පාලනය කරගන්නට වග බලා ගැනීමට තිබුණි. ඉතාමත් අර්බුදකාරී අවස්ථාවන් හිදී පවා මහජනයා ඉදිරියේ සන්නුන්ව පෙනී සිටන්නට සියලු දේශ පාලන නායකයෝ උත්සාහ කරන බව කවුරුත් දන්නා කරුණකි.

සිව්වනුව. මුහම්මද් (සල්) තුමාණෝ නබිත්වය ලැබීමෙන් පසු සතුරන් ගෙන් පීඩාවට හා හිංසාවට මුහුණු දුන් ඉතාමත් අසීරු තත්ත්වයේදී මක්කාවේ නායකයෝ එතුමාණන්ට විහාල වාසි ගෙන දෙන යෝජනාවක් ඉදිරිපත් කළහ. ඒ වෙනුවට එතුමාගේ ඒක දේවවාද ප්‍රතිපත්තිය දේශනා කිරීමද, එමගින් ජනතාව භේද කරන ක්‍රියාවද අත හැරිය යුතු යයි ඔවුහු

ඉල්ලීමක් කළහ. එම යෝජනාව නබි (සල්) තුමාණන්ට ඉදිරිපත් කළේ උත්බා ඉබ්න් රබියයා නම් කාෆිර් නායකයෙකි.

"පුතේ, උසස් පවුලක උපත ලැබූ ඔබ වංශවත් කෙනෙකි. අප සමාජයේ ඔබට තිබෙන ගෞරවය ගැන ඔබ දනී. එහෙත් ඔබ දැන් ගෙනැවිත් තිබෙන කරුණු නිසා ඔබේ ජනතාව කැලඹීමට පත් ව ඇත. අප සමාජයේ සමගිය ඔබ බිඳ දමා ඇති අතර, ඔවුන්ගේ සම්ප්‍රදායන් සියල්ල විහිළුවට භාජනය කර ඇත. ඔවුන්ගේ දෙවිවරුන් සහ ආගම, විවේචනයට ලක් කර, ඔවුන්ගේ මුතුන් මිත්තෝ දේව විශ්වාස නොමැති (කාෆිර්) අය බව ඔබ ප්‍රකාශ කරන්නෙහිය. ඔබ සලකා බලනු පිණිස යෝජනා කිහිපයක් මම ඉදිරිපත් කරන්නට කැමැත්තෙමි. සමහර විට ඔබ ඒවා පිළිගැනීමට ඉඩ ඇත." යයි උත්බා කීවේය.

"කථා කරන්න අබුල් වලීද්" (උත්බාගේ කුන්යා නාමය) මම සවන් දෙන්නෙමි." යයි රසූල් (සල්) තුමාණෝ පැවසීය.

"පුතේ, ඔබේ මේ ක්‍රියා මාර්ගයෙන් ඔබ මුදල් උපයන්නට බලාපොරොත්තු වන්නේ නම් අපේ සියලු දේපළ එකතු කර ඔබව අපි අතර ධනවත් කෙනෙක් කරන්නෙමු. ඔබ ගෞරවය පතන්නේ නම් ඔබව අපේ නායකයා ලෙස පත් කර සියලු තීරණ ගැනීම ඔබට භාර කරන්නෙමු. ඔබට අවශ්‍ය වන්නේ රජකම නම් ඔබව අපේ රජු බවට පත් කර ගන්නෙමු. ඔබට යක්ෂ හෝ ජින්වරුන්ගෙන් උවදුරක් සිදු වී සුව කර ගත නොහැකිව තිබේ නම් දක්ෂ මන්ත්‍ර කාරයෝ ගෙන්වා ඔබව සුව කරන්නෙමු. ඔබට සුවය ලැබෙන තුරු අපේ සියලු ධනය වියදම් කරන්නෙමු." යනුවෙන් උත්බා තව දුරටත් පැවසීය.

මෙහිදී ගම්‍ය වන වැදගත් කරුණක් නම් නවීන යුරෝපානු විද්වතුන් මෙන්ම පැරණි කුරෙයිෂිවරුන්ද මුහම්මදු (සල්) තුමාණෝ කිසියම් බලා බොරොත්තුවකින් කටයුතු කළ බව අනුමාන කිරීමේ ක්‍රියාවයි.

උත්බාගේ කථාව අවසන් කළායින් පසු රසූල් (සල්) තුමාණෝ "ඔබේ කථාව අවසානද අබුල් වලීද්?" යනුවෙන් විමසුවේය.

"ඔව්" යයි පිළිතුරු ලැබුණි. "එසේ නම් මට දැන් සවන් දෙන්න." ලෙස රසූල් (සල්) පැවසු විට, උත්බා ද එකඟ විය.

අල් කුර්ආනයේ ෆුස්සිලාත් 41 වන සූරාවෙන් 1 සිට 38 දක්වා වැකි රසූල් (සල්) තුමාණෝ පාරායන කළ විට උත්බා දැත් පිටු පස දමා ඉතා ඕනෑ කමින් ඒවාට සවන් දුනී. එහි පළමු වැකි හතර සහ අවසාන නැකි දෙක පහත දැක්වේ.

"හාමීම්. දයාලු, පරම දයාලුගෙන් පහළ වීමකි. එහි වැකි විස්තර කරන ලද ග්‍රන්ථයකි. වටහා ගන්නා ජනතාවට අරාබි බසින් කුර්ආනයකි. ශුභාරංචියක්ද, අවවාදයද ඔවුන්ගෙන් වැඩි දෙනෙක් වැළකෙති. එසේ හෙයින් ඔවුහු නො අසන්නෝය."

"රැයද. දවාලද, හිරුද, සඳුද ඔහුගේ දෘෂටාන්තයන් ගෙන්ය. හිරුටද, සඳටද සුජූද් නොකරනු. ඔබ ඔහුට නමදින්නෙහි නම්, ඒවා නිර්මාණය කළ අල්ලාහ්ට සුජූද් කරනු.

ඔවුන් උද්ධතයහු නම්. ඔබ හිමි සන්නිධාන යෙහි රෑ දවල් ඔහු සුවිශුද්ධ කරන්නෝය. ඔවුහු ආයාස නොවන්නෝය."

රසූල් (සල්) තුමාණෝ කුර්ආන් වැකි පාරායන කර සජදා කිරීම ගැන සඳහන් වාක්‍ය කිය වූ විට සජදා කර, "අබුල් වලීද්, ඔබ සවන් දුන්නා. දැන් (ඉතිරිය) ඔබට භාරයි." යනුවෙන් පැවසීය.

මුහම්මාද් (සල්) තුමාණන්ගේ බලාපොරොත්තිව කුමක් දැයි මුස්ලිම් නොවන ජනතාව පමණක් නොව මුස්ලිම් ජනතාවද මෙම සිද්ධියෙන් වටහා ගත යුතුයි.

මුහම්මද් (සල්) තුමාණෝ අල්ලාහ්ගේ නබිවරයෙකු බව මෙම වාක්‍ය යන්ට සවන් දුන් උත්බා අවබෝධ කර ගත්තේය. ඔහුගේ අධම මිතුරන්, මුහම්මද් (සල්) තුමාණන් පාරායනය කර පෙන් වූ වැකි වලින් වශී කර ගත් බව ඔහුට විරිළු කළෝය. මුහම්මද් (සල්) තුමාණෝ ධනය හෝ බලය ලබන අපේක්ෂාවෙන් අල් කුර්ආනය රචනා කළේ නම්, ඒවා ලබා ගන්නට මෙයට බඩා කදිම අවස්ථාවක් ලැබෙන්නේ නැත. මෙහි ප්‍රශ්නය නම්, එතුමා මෙම කදිම අවස්ථාව ප්‍රතික්ෂේප කළේ ඇයි? එයට පිළිතුරු සපයන්නට කිසිවෙක් ඉදිරිපත් නොවීමයි.

## 5. අරාබි ජාතීන්ගේ සමගිය හා විමුක්තිය සඳහාද?

අරාබි ජනතාව එක්සත් කර ඔවුන්ට විමුක්තිය ලබා දීමේ අරමුණින් ශුද්ධ වූ කුර්ආනය රචනය කළ බව ඇතැම් අය අදහස් ඉදිරිපත් කරති. ඒවා පහත සඳහන් හේතුන් මත බිඳ වැටේ.

පළමුව, ඔවුන් ඉදිරිපත් කරන තර්කය පිළිගැනීමට නම්, ශුද්ධ වූ කුර්ආනයේ ප්‍රධාන තේමාව අරාබිවරුන්ගේ සමගිය හා විමුක්තිය විය යුතුයි. ඇත්තෙන්ම අරාබි ජාතින්ගේ සමගිය හෝ විමුක්තිය පිළිබඳව පවසන වාක්‍ය කිසිවක් ශුද්ධ වූ කුර්ආනයේ දකින්නට නැත. ශුද්ධ වූ කුර්ආනයේ කතුවරයා මුහම්මද් (සල්) තුමාණෝ යනුවෙන් මොහෙතකට හෝ සිතුවේ නම් එතුමාගේ අරමුණ අරාබි ජාතින්ගේ සමගිය නොවූ අතර අවම වශයෙන් එය පිළිබඳව ශුද්ධ වූ කුර්ආනයේ කොතැනකවත් සඳහන් වී නැති බව පෙන්වා දිය හැකිය.

දෙවනුව, ශුද්ධ වූ කුර්ආනය ඉදිරිපත් කරන ඉස්ලාමීය උම්මා හෙවත් ජාත්‍යන්ර ප්‍රජාව එක්තරා ගෝත්‍රයකට හෝ රටකට සීමා වූ පටු ජාති වාදයට වඩා හාත්පසින්ම වෙනස් සමාජයකි. සත්‍ය (හක්) හා අසත්‍ය (බාතිල්) අතර වෙන් කර පෙන්වන සංකල්පය ඉස්ලාම් වේ. කෙනෙක් කුමන රටකට, ජාතියකට. කුලයකට, භාෂාවකට, වර්ණයකට, ලේ නෑ කමට අයත් වුවත්, මෙම සංකල්පය පිළිගත් විගස මෙම ජාත්‍යන්තර ප්‍රජාවට අයත් සාමාජිකයෙකු බවට ඔහු පත් වෙයි. ඇත්තෙන්ම පියාගෙන් දරුවන් වෙන් වන අවස්ථා පවා මේ නිසා සිදුවුනි. මෙම සංකල්පය නිසා පවුල් හා සමාජය තුළ භේද බින්න වීමටද සිදුවුණි. නබි (සල්) තුමාණන්ගේ බාප්පා වන හම්සා (රලි) මුස්ලිම් බවට පත්වීමෙන් කුරෙයිෂි වරුන්ගේ අසහනය තවත් උග්‍ර වූ අතර උත්බා සඳහන් කළේ මෙම අසාමාන්‍ය තත්ත්වය ගැනයි. ඉස්ලාමය ජය ගත් පසු, අරාබි දේශයේ පැවතුණේ සංකල්පවාදී සමගියක් වූ අතර ශුද්ධ වූ කුර්ආනය ප්‍රබල ලෙස රුකුල් දුන්නේද එවැනි සමගියකටයි

තෙවනුව, මුහම්මද් (සල්) තුමාණන්ගේ අරමුණ අරාබි ජාතිය එක්සත් කිරීම වූයේ නම්, එතුමා රජෙකු කරන බවට උත්බා පොරොන්දුවක් දුන් විට, එතුමාට එය බොහෝ සතුටින් පිළිගන්නට තිබුණි. රජවරයෙකු වශයෙන් ලැබෙන බලය හා තනතුර උපයෝගී කොටගෙන එක්සත් අරාබි රාජ්‍යයක් ගොඩ නගන්නට කදිම අවස්ථාවක් උදාවනු ඇත. එහෙත් නබි (සල්) තුමාණෝ එය ප්‍රත්ක්ෂේප කළ විට එවැනි චෝදනාද ඒ සමඟම බිඳ වැටුණි.

සිව්වෙනුව, මුහම්මද් (සල්) තුමාණන්ගේ චේතනාව අරාබි ජාතික අභිමානය ගොඩ නැගීමක් සේ සිතන අය, ශුද්ධ වූ කුර්ආන් වැකි එයට පටහැනි වීම දැක කැලඹීමකට පත්වෙති. එයින් වාක්‍යයක් නිදසුනක් වශයෙන් බලමු. *"අහෝ මරියම් සැබැවින්ම අල්ලාහ් ඔබ තොරා ගත්තේය. ඔබ පරිශුද්ධ කළේය. ලොව ස්ත්‍රීන්ට ඉහළින් ඔබ තෝරා ගත්තේය." යි මලාඉකාවරු පැවසුවෝය.* "3-42.

ඉහත සඳහන් වාක්‍ය උසස් කොට පවසන්නේ ජේසු තුමාණන්ගේ මෑනියන් වන මරියම් තුමිය ගැනයි. එවැනි උතුම් ගෞරවයක් බයිබලයේ පවා කිසිදු ස්ථානයක මරියම් තුමියට පිරිනමා නැත. මුහම්මද් (සල්) තුමාණෝ අරාබි ජාතියෙකු වන අතර එතුමා අරාම්භක අවිදියේ ඇමතු වේ අරාබි ජානතාවටයි. ඔවුන් අකැමැති වුවත්, ජේසු තුමාණන්ගේ මව යුදෙව් කාන්තාවක් වන මරියම් තුමිය ලොවේ ස්ත්‍රීන්ට ඉහළින් තෝරා ගත් බව ශුද්ධ වූ අල් කුර්ආනයේ ඉතා අලංකාර භාෂා ශෛලියෙන් එතුමිය වර්ණනා කරනු ලබයි. නබි (සල්) තුමාණන්ගේ මව ගැන හෝ වෙනත් අරාබි කාන්තාවක් ගැන

හෝ කිසිවක් ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වී නැත. අරාබි වරුන්ගේ ජාතික අභිමානය වර්ධනය කිරීමෙහි යෙදෙන බවට චෝදනා එල්ල වූ මුහම්මද් (සල්) තුමාණෝ එම කටයුත්ත ඉටු නොකර එතුමාට එරෙහිව කුමන්ත්‍රණ කළ යුදෙව් ජාතීන්ගේ කාන්තාවක් ගැන මෙතරම් ශ්‍රේෂ්ඨ වචන යොදා පාරායන කරයි ද? අරාබිවරුන්ට ද්‍රෝහිකම් කර, ඔවුන්ට පහත් ලෙස සැලතූ යුදෙව් ජාතීන්ට අයත් කාන්තාවක් ශුද්ධ වූ කුර්ආනයේ උසස්තම ගෞරවයට ලක් වූයේ කෙසේද? අරාබිවරුන් එක්සත් කිරීමේ අදහස බිඳ හෙළීමට පහත සඳහන් තවත් වාක්‍යයක් බලවත් පහරක් එල්ල කරන්නේ මෙසේය.

*"ඉස්රායිල් දරුවනි, මා ඔබහට ප්‍රදානය කළ විශේෂ පරප්‍රසාද සහ මා ඔබ ලෝක වාසීන් කෙරෙහි උත්කෘෂට කළ හැටිද සිහි කරනු මැනවි."* අල් කුර්ආන් 2-47.

කළු ජාතීන්ට දැඩි අභිමානය දක්වන කෙනෙක් ඔවුන්ගේ ජාතික ආඩම්බරය අවුස්සනු පිණිස සුදු ජාතීන් ගැන ප්‍රශස්ති ගී ගායනා කරයි ද යන්න සිතිය හැකිද?

පටු ජාතිවාදය මත සමාජයක් ගොඩ නගන්නට ක්‍රියා කරන අයට අල් කුර්ආනය පැහැදිලි පිළිතුරක් සපයන්නේ මේ ආකාරයටයි. *"අහෝ මිනිසුනි, සැබැවින්ම පිරිමියෙකුගෙන් සහ ස්ත්‍රියකුගෙන් ඔබ නිර්මාණය කෙළෙමු. ඔබ එකිනෙකා දැන ගනු පිණිස ජාතීන් හා ගෝත්‍රයන් කෙළෙමු. (පිළිකුල් කරනු පිණිස නොවේ) සැබැවින්ම අල්ලාහ් ගේ සන්නිධානයෙහි ඔබෙන් ඉතා ගෞරව ඇති තැනැත්තා, ඔබෙන් බිය බැති මතාය. අල්ලාහ් සර්වඥයා, සර්ව ඥානය."* 49-13

## 6. සදාචාර ගුණ වර්ධනය කිරීම අරමුණක්ද?

මතු දැක් වූ ප්‍රශ්න වලට පිළිතුරු දීමට නොහැකි වීමේ හේතුවෙන් සදාචාර ගුණ වර්ධනය කිරීමේ අරමුණින් මුහම්මද් (සල්) තුමාණෝ ශුද්ධ වූ කුර්ආනය රචනය කළ බව ඇතැම් විද්වතුන්ගේ අදහස් වී ඇත. මෙම සංකල්පයෙන්ද තවත් ප්‍රශ්න කිහිපයක් පැන නගී.

සදාචාර ගුණ වර්ධනය ඉතාමත් උතුම් අරමුණකි. වංචාව හෝ බොරු වැනි දුසිරිත් මාර්ගයෙන් ඉවත් වී එය සාක්ෂාත් කර ගත යුතුයි. වැරදි ක්‍රියා මාර්ගයක් යොදමින් සදාචාර සම්පන්න සමාජයක් ගොඩ නඟන්නට නබි (සල්) තුමාණන්ට තිබෙන අවශ්‍යතාව ගැන පැහැදිලි කරුණු නොමැති අතර මෙම චෝදනාව එල්ල කරන පිරිසද එයට පිළිතුරක් සැපයිමට අපොහොසත් වේ.

දෙවනුව අල්ලාහ්ට විරුද්ධව බොරු කීම පිළිකුල් සහගත පාපයක් බවට ශුද්ධ වූ කුර්ආනය ප්‍රකාශ කරන්නේ මෙසේය.

*“තවද, අල්ලාහු කෙරෙහි බොරු ගෙතූ අයට හෝ ඔහුට කිසිවක් වහී මාර්ගයෙන් පහළ වනු නොලැබෙද්දී, ‘මට වහී පහළ වුයේය‘ යි කී අයටද ‘අල්ලාහු පහළ කළ දැය වැනි දැය මමද පහළ කරන්නෙමි‘යි කී අයටද වඩා අපරාධකරුවන් කවරේද?“* අල් කුර්ආන් 6 - 93.

*“ඔහු අප ගැන බොරුවක් ගෙතුවේ නම් ඔහු දකුණතින් අල්ලා ගන්නෙමු“* අල් කුර්ආන් 69-44 සහ 45. මේ පිළිබඳව ශුද්ධ වූ කුර්ආන් වාක්‍ය 42 – 44 සහ 16 – 105 බලන්න.

ඉහත සඳහන් වැකි සියල්ලම එවැනි බොරු ගොතන අයට ඉතාමත් නින්දිත දඬුවම් ලැබෙන බව අවවාද කරයි. අල් කුර්ආනයේ තර්කය තමා බව දැන ගෙන වංචනික ලෙස එය දෙවියන් වහන්සේගේ වදන් බව දැනුවත්ව බොරු පවසා, මුහම්මද් (සල්) තුමාණෝ අපරාධකරු වෙක් බවට තමාව පත් කර ගනී යයි කිව හැකිද? එතුමාණෝ පවසන බොරු කවදා හෝ ජනතාව සොයා ගනී යන බිය නිසා ඉහත සඳහන් වාක්‍ය මේ ආකාරයට පවසන්නට තිබුණි. *"දෙවියන් වහන්සේ වෙනුවෙන් අවශ්‍ය නම් බොරුවක් වුවද පවසන්නන් කෙරෙහි කිසිදු වරදක් නැත."* එහෙත් එවැනි එක වාක්‍යයක් වුවද ශුද්ධ වූ කුර්ආයේ දක්නට නැත.

ඇත්ත වශයෙන්ම සාන්ත පාවුලු (St.Paul) තුමා බයිබල් අලුත් ගිවිසුමේ රෝම 3 – 7 මෙවැනි වාක්‍යයක් යෙදුවේය. 'නමුත් මාගේ බොරුව කරන කොට ගෙන දෙවියන් වහන්සේගේ මහිමය පිණිස උන් වහන්සේ ගේ සැබෑකම වැඩි වූයේ නම්, මමත් පව්කාරයෙකු මෙන් තවත් විනිශ්චය කරනු ලබම්ද?'

තෙවනුව. මුහම්මද් (සල්) තුමාණෝ සම්පූර්ණ ශුද්ධ වූ කුර්ආනය එක අවස්ථාවක ගෙන ආවේ නැත. වසර විසි තුනක කාලයක් මුළුල්ලේ, කොටස් වශයෙන් එය හෙළිදරව් කරනු ලැබූ අතර, එම කාලය තුළ ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු සපයන බවට ශුද්ධ වූ කුර්ආනය ස්ථිර පොරොන්දුවක් විවෘතව ඉදිරිපත් කරයි. "මේ අල් කුර්ආනය පහළ කරනු ලැබූ සමයෙහි එවැනි කරුණු ගැන ඔබ ඇසුවා නම් එය ඔබට පැහැදිලි කරනු ලැබෙයි." අල් කුර්ආන් 5 -101.

මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් ජනතාව නොයෙක් කරුණු ගැන ප්‍රශ්න ඇසූහ. මත්පැන්, සූදුව, කාන්තාවන්ට ඔසප් සිදුවීම, යුද්ධයෙන් ජය ලැබූ වස්තු ගැන පමණක් නොව දූල් කර්නයින් වැනි ඓතිහාසික නායකයින් ගැනද ප්‍රශ්න ඇසූහ. මෙම ප්‍රශ්නයන්ට ප්‍රතිචාර දක්වමින්, අවම වශයෙන් 15 වතාවක් පමණ, “ඔවුන් ඔබෙන් මේ විෂය ගැන ප්‍රශ්න කරති. ඔවුන්ට මේ අයුරින් පවසනු.“ යයි ශුද්ධ වූ කුර්ආනය මුහම්මද් (සල්) තුමාණන්ට පවසයි. මෙහිදී ප්‍රශ්නයක් පැන නගින බව පෙන්වා දිය යුතුයි. මුහම්මද් (සල්) තුමාණෝ සමාජයේ ප්‍රතිසංස්කරණ කිරීමේ අරමුණින් අල් කුර්ආනය රචනය කළේ නම්, එම ජනතාව ඉදිරිපත් කරන ප්‍රශ්න එම අරමුණට ගැලපෙන අයුරින් තිබේ දැයි කලින් දැන ගන්නට අවස්ථාවක් නොතිබුණි. රටේ ආහාර ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්නට පැමිණෙන ජනාධිපති වරයෙක් ඕනෑම ප්‍රශ්නයක් ඉදිරිපත් කරන ලෙස මාධ්‍ය වේදීන්ට ආරාධනා කිරීම නුවණට හුරු ක්‍රියාවක් නොවේ. මන්ද, දේශපාලන සිරකරුවන් ගැන සමහර මාධ්‍යවේදීන් ප්‍රශ්න කරන්නටද අවස්ථාවක් ඇති හෙයිනි.

සදාචාර ගුණ වර්ධන පිළිබඳ සංකල්පයට එරෙහිව පැන නගින තවත් ප්‍රශ්නයක් නම් මුහම්මද් (සල්) තුමාණන්ගේ ප්‍රකාශයන් පවා කිහිප තැන්හී අල්ලාහ් ශුද්ධ වූ කුර්ආනය තුළ නිවැරදි කර තිබීමයි. මෙයට එක නිදසුනක් බලමු. නබි (සල්) තුමාණන්ගේ බාප්පා හම්සා (රලි) තුමා මරණටය පත්විය. එතුමාගේ මළ සිරුර අබූ සුෆියාන්ගේ බිරිය වන හින්ද් නැමැත්තිය ඉතාමත් කුරිරු ලෙස කපා විකෘති කළාය. එතුමාගේ මළ සිරුර දුටු නබි (සල්) තුමාණෝ ‘මෙතරම් කෝපයට මෙයට පෙර මම පත් නොවූයෙමි. කුරෙෂි වරුන්ට විරුද්ධව අල්ලාහ් මට ජය දුනහොත්. ඔවුන්ගේ තිස් දෙනෙකුගේ මළ සිරුරු මේ ආකාරයට විකෘති කරන්නෙමි.‘ යයි ප්‍රකාශ කළේය. ඒ අවස්ථාවේදී එතුමාට අල්ලාහ්ගේ වදන මෙසේ පහළ වුණි.

*“ඔබ දඬුවම් කරන්නෙ හි නම්, එයින් ඔබ පෙළනු ලැබූ දැයට සමාන දැයින් දඬුවම් කරවු. ඔබ ඉවසුනු නම් ඇත්තෙන්ම එය (ඉවසීම) ඉවසනවුන්ට ඉතා හොඳය.“* අල් කුර්ආන 16 -126.

ඉන් අනතුරුව රසූල් (සල්) තුමාණෝ තම ප්‍රකාශය ඉටු නොකළා පමණක් නොව, යුද්ධයක මළ සිරුරු විකෘති කිරීම මුස්ලිම්වරුන්ට සම්පූර්ණයෙන්ම තහනම් ද කළහ.

උහුද් නටනේදී නබි (සල්) තුමාණන්ගේ මුවට වැදුණු පහරින් එතුමාණන් ගේ දතක් කැඩුණි. “ඔවුන්ගේ නබිවරයාගේ මුහුණේ ලේ සිලියැමට ක්‍රියා කරන ජනතාවක් දියුණු වන්නේ කෙසේදැ?“ යි එතමාණෝ කීහ. එයට පිළිතුරු වශයෙන් *“ඔවුන් කෙරෙහි සමාව දීම හෝ ඔවුන්ට දඬුවම් දීම හෝ කිසිත් ඔබට නැත. සැබැවින්ම ඔවුහු අපරාධකරුවෝය. අහස් හී දැයද පොළොවෙහි දැයද අල්ලාහුටය. ඔහු සිතු කෙනෙකු කමා කරන්නේය. ඔහු සිතු කෙනෙකුට දඬුවම් දෙන්නේය. අල්ලාහ් සමාව දෙන්නේය. දයාළුය.“* යන 3 – 128, 129 වැකි පහළවුණි.

ඇත්ත වශයෙන්ම අල් කුර්ආනයේ ප්‍රධාන අවශ්‍යතාව සමාජයේ සදාචාර ගුණවර්ධනය බව සිතීම පවා වැරදි මතයකි. සදාචාරය පිළිබඳ උපදෙස් අල් කුර්ආනයේ නිවේදන වලින් කොටසක් පමණි. විශ්වය පිළිබඳව අධ්‍යයනය හා පරීක්ෂණ කරන ලෙස උපදෙස් දෙන වැකි විශාල ප්‍රමාණයක් අල් කුර්ආනයේ සඳහන් වී ඇත.

*“අල්ලාහ් නිර්මාණය කෙසේ ප්‍රථමයෙන් උත්පාදනය කළේද, පසුව පුනරුත්පාදනය කරන්නේ දැයි භූමියෙහි ගමන් කර බලනු යි කියනු.“* අල් කුර්ආන් 29-20. මෙම විෂය පිළිබඳව 12-105, 2-29, 38-27එ 7-185 වැනි වැකිද කියවා බලන්න.

දේව විශ්වාසය සහ ඉස්ලාමීය ශික්ෂා පද පිළිබඳ වාක්‍යයන් 150ක් පහළ වූ අතර, ස්වාභාවික සිද්ධීන් පිළිබඳ වාක්‍යයන් 756ක්

පහළ වුණි. විශ්වය ගැන අධ්‍යයනය කිරිම පිළිබඳව අල් කුර්ආන් දැක් වූ සැලකිල්ල කෙතරම් දැයි මෙයින් අවබෝධ කර ගත හැක.

අවසාන වශයෙන් මුහම්මද් (සල්) තුමාණෝ දැනුවත්වම ශුද්ධ වූ කුර්ආනය ප්‍රබන්ධ කළ බවට නගන චෝදනාව එතුමාණන්ගේ චරිතය හා ඓතිහාසික සාක්ෂීන් සමඟ කිසිසේත් ම සැසඳෙන්නේද නැත. නබිත්වය ගැන කථා කරන්නට බොහෝ කලකට පෙර සිටම, සත්‍ය වන්තයා, විශ්වාස වන්තයා වැනි ගෞරව නාම එතුමාණන්ට සමාජයේ හිමිවී තිබුණි. එතුමා එක් වතාවක් වුවද බොරුවත් පැවසූ බවට කිසි විටක සඳහන් වි නොමැති අතර එතුමාගේ සතුරන් පවා ඒ බව පිළිගනිති. එතුමාගේ ධර්ම ප්‍රචාරය ආරම්භයේදී සෆා කන්ද මත නැඟ කුරෙයිෂි ජනතාවට අඬ ගැසූහ. එතුමා වටා ඔවුන් රොක් වූ විට. “ඔබට පහර දීමට සූදානම්ව අශ්වාරෝහක සේනාවක් කන්ද පිටු පස පැමිණ සිටිනා බව මම පැවසුවහොත් ඔබ මාගේ වචන විශ්වාස කරන්නේද?“ යි ප්‍රශ්න කළහ. “ඔව්. ඔබ කිසිදු කැළැල්ලක් නොමැති කෙනෙකි. ඔබ කිසි විටක බොරුවක් පවසනු අපි නොදනිමු.“ යනුවෙන් ඔවුන් පිළිතුරු දුන්හ.

එක් කලෙක එතුමාගේ බලවත් සතුරෙක් වූ අබූ සුෆියාන්, නබි (සල්) තුමාණෝ බොරුකාරයෙක් යයි චෝදනා නගන්නට පවා පසුබට විය. මිහම්මද් (සල්) තුමාණෝ දේශනා කරන්නේ කුමක් දැයි රෝමානු අධිපති හෙරාක්ලියස් රජු නැඟු ප්‍රශ්නයට “අල්ලාහ්ට පමණක් නමදින ලෙසත්, ඔහුට කිසිවෙක් ආදේශ නොකරන ලෙසත්, අපේ මුතුන්මිත්තෝ පැවසූ සියලුදේ ඉවත දමන ලෙසත් ඔහු පවසයි. අල්ලාහ්ට නැමදුම් කර, ඔහුගෙන් පමණක් යාච්ඤා කරන ලෙසත් සත්‍ය පවසන ලෙසත් පිරිසිදුව ජීවත්වන ලෙසත් ඥාතීන් සමඟ සුහදව ජීවත් වන ලෙසත් ඔහු අපට අණ කරයි.“ යනුවෙන් කාෆිර් වරුන්ගේ පිලට අයත් අබූ සුෆියාන් පිළිතුරු දුන්නේය. මූලාශ්‍රිත සහීහ් බුහාරි.

එතුමාගේ අවංක භාවය සනාථ කරන තවත් වැදගත් සිද්ධියක් දෙස බලමු. සතුරන් එතුමා ඝාතනය කරන්නට සූදානම් වී එතුමාගේ නිවස වට කළ අවස්ථාවේදී ජීවිතාරක්ෂාව සඳහා මදිනාවට පිටත් වීමට පෙර, සුරක්ෂිතව තබා ගන්නා ලෙස භාර කළ කුරෙයිෂි සතුරන්ගේ වටිනා වස්තු සියල්ල ඔවුන්ට ආපසු භාර දෙන ලෙස අලි (රලි) තුමාට භාර කළේය. එතුමාට ප්‍රසිද්ධියේ චෝදනා නැඟූ කුරෙයිෂිවරු පවා තම වටිනා ආභරණාදිය සුරක්ෂිතව තබා ගන්නා ලෙස දෙන තරමට ඔවුන් එතුමා විශ්වාස කළ බව ඉන් පෙන්වයි.

ඉහත සඳහන් කරුණු මත මුහම්මද් (සල්) තුමාණන්ගේ අවංකභාවය සහ උදාර ගුණය ගැන එතුමා හා ගනු දෙනු කළ සතුරන් පවා සහතික කරන බව ඉතිහාසඥයෝ වාර්තා කරති.

මේ පිළිබඳව කිසිදු තර්කයක් නොමැති හෙයින්, ඇතැම් විද්වතුන් මුහම්මද් (සල්) තුමාණෝ දැනුවත්වම කුර්ආනය පිළිබඳව බොරුවක් කළ බවට නැඟූ චෝදනාව ඉවත දමා, එතුමා චේතනාවකින් තොරව බොරු ගොතා ශුද්ධ වූ කුර්ආනය අල්ලාහ්ගෙන් බව ඉදිරිපත් කළා යැයි පවසති. දැඩි විවේචන හා චෝදනා නගා පරාජයට පත් මෙම විද්වතුන්, නව උපක්‍රමයක් යොදා ගත්හ. ඒ වනාහි මුහම්මද් (සල්) තුවාණන් ගැන සානුකම්පිත සංකල්පයක් ඉදිරිපත් කිරීමයි. එතුමා අපස්මාර රෝගියෙක්, ආත්ම මුළාවට ලක් වූ කෙනෙක් යනුවෙන් අනුකම්පා දක්වමින්, එම රෝග තත්ත්වය මත අල් කුර්ආනය නොදැනුවත්ව එතුමාගේ මුවින් පිට වූ බව කරුණු පෙන්වන්නට යෙදුනෝය. ශුද්ධ වූ කුර්ආනය දේව නියෝගයක් නොවන බව පෙන්වීම ඔවුන්ගේ එකම අරමුණ විය.

මෙහි ඓතිහාසික පසුවිම දෙස බලමු. දහනව වන ශත වර්ෂයේ මැද භාගයේ පෙරදිග රටවල් පිළිබඳ විශේෂඥයින් වන ඕරියන්ටලිස්ට් ලෙස හැඳින්වන බටහිර ලේඛකයින්, නබි (සල්) තුමාණෝ පිළිබඳව අදහස් දැක්වීමෙහිලා වෙනසක් කළහ. 1840

වසර මාර්තු 8 වන සිකුරාදා තෝමස් කාලයිල් නම් විද්වතෙක් (Heroes & Hero worship) වීරයින් සහ වීරයින් පිදීම යන මාතෘකාව යටතේ ඔහුගේ දෙවන දේශනාව ආරම්භ කළේය. ඊට පෙර මුහම්මද් (සල්) තුමාණන්ගේ ගුණය සහ විශේෂයෙන් එතුමාණන්ගේ අවංක භාවය ගැන සලකා බලන ලෙස කාලයිල් තම දේශනාවෙන් ඇරයුම් කළේය.

කාලයික්ගේ දේශනයෙන් පසු, ඔහුගේ සමකාලීන විද්වතුන් සිය ක්‍රියා මාර්ගයට නව මුහුණුවරක් දෙන්නට වූහ. මුහම්මද් (සල්) තුමාණන්ගේ නබිත්වය පිළි නොගත් ඔවුන්, එතුමාගේ අවංකභාවය ගැන විශේෂයෙන් සඳහන් කළ නමුත් එතමාණෝ නබි වරයෙකු යයි සහ අල්ලාහ්ගෙන් නිවේදන පහළ වන බව අවංකව විශ්වාස කළ කෙනෙක් වූවද, සැබැවින්ම එවැනි කිසිවක් පහළ නොවූ අතර, මානසික රෝගී තත්ත්වයෙන් එතුමාණෝ සිටි බව ඔවුන් නොයෙක් උපක්‍රම වලින් පෙන්නුම් කරන්නට වූහ. මේ ආකාරයෙන් මුහම්මද් (සල්) තුමාණෝ බොරුකාරයෙක් යන මතයෙන් ඉවත්කර, මුළාවට පත් අවංක කෙනෙක් යන මතයක් සේ මෙම යුරෝපානු ඕරියන්ටලිස්ට් වරු වෙනස් කරන්නට වූහ.

දෙවනුව, මෙම යුගයේ යුරෝපානු අධිරාජ වාදීන් අත්පත් කර ගත් ආසියානු හා අප්‍රිකානු ප්‍රදේශ වල ක්‍රිස්තියානි ආගම පතුරුවන මිෂනරි ව්‍යාපායරය ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මෙම රට වැසියන් පාලනය කිරීමේදී මුස්ලිම් ජනතාව සමඟ සමීපව ආශ්‍රය කරන්නට අධිරාජ වාදීන්ට සිදුවුණි. මුස්ලිම් ජනතාවගේ ආගම වෙනස් කරන්නට නම්, නබි (සල්) තුමාණෝ හෙළා දැකීම අත හැරිය යුතු වබද, ඒ වෙනුවට සානුකම්පිතව හා තර්කානුකූලව දේශනා කළ යුතු බවද මිෂනරිවරු තේරුම් ගත්හ. ඒ සඳහා කාලයිල්ගේ ක්‍රමය වාසිදායක බවද ඔවුන් හඳුනා ගත්හ.

ඉංග්‍රීසි නැගැනහිර ඉන්දියා සමාගමේ උසස් නිලධාරියෙකු වන ශ්‍රීමත් විලියම් මුයිර් නම් පුද්ගලයා යුරෝපානු අධිරාජ්‍යයේ පාලනයට සහ මිෂනරි වරුන්ගේ ව්‍යාපාරයට විශාල වශයෙන් සහය විය. උතුරු ඉන්දියාවේ, ඉන්දියානු ජනතාව අතර මිෂනරි ව්‍යාපාරයේ යෙදී සිටී කාල් ගොටාලෙබ් ෆ්ලැන්ඩර් නම් පාදිලි වරයෙක් සමඟ ඔහු සම්බන්ධ වි සිටියේය. ඇත්ත වශයෙන්ම 1854 වසර ෆ්ලැන්ඩර් සහ රහ්මතුල්ලාහි කෙරනාවි නම් ඉන්දියානු මුස්ලිම් වරයෙකු අතර සිදු වූ ප්‍රසිද්ධ ආග්රා සංවාදයේ විලියම් මුයිර් විනිශ්වය කරුවෙකු වශයෙන් සිටියේය. විවාදයේ අන්ත පරාජයට පත් වූ ෆලැන්ඩර්, පාකිස්ථානයේ පෙශාවර් නගරයටද පසුව කොන්ස්ටන්ටිනොපල් නුවරටද (තුර්කි රටේ) ස්ථාන මාරුවක් ලැබීය. (මුහම්මද් මෝහර් අලි නම් විද්වතෙක් රචනා කළ 'නබි තුමාණන්ගේ ජීවිත කථාව සහ ඕරියන්ටලිස්ට්වරු' යන ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලදී) ඕරියන්ටලිස්ට් වරුන්ගේ නව උපක්‍රමය ගැන දැන් විමසා බලමු.

## 7. චේතනාවෙන් තොරව බොරු ගෙතීම

මුහම්මද් (සල්) තුමාණන්ට ප්‍රථම වරට දේව වාක්‍ය හෙළිදරව් වූ ආකාරය සහ පසුව වරින් වර නිවේදන හෙළිදරව් වන විට එතුමා පසු වූ තත්ත්වය පිළිබඳ හදිස් දෙකක් තිබේ. එම හදිස් වදන් පදනම් කර ගෙන බටහිර විද්වතුන් මෙම සංකල්පය ඉදිරිපත් කළහ. එම හදීස් වදන් දෙකම ආයිෂා (රලි) තුමිය විසින් දන්වන ලද බව සහීහ් අල් බුහාරි ග්‍රන්ථයේ වාර්ථා වී ඇත.

විශ්වාසවන්තයින්ගේ මාතාව වන අයිෂා (රලි) තුමිය මෙසේ දන්වයි.

1. අල් හාරිත් බින් හිෂාම් (රලි) වරක් “නබි (සල්) තුමාණනි, ඔබ තුමාට දේව හෙළිදරව්ව පහළ වන්නේ කෙසේදැ?‘ යි විමසීය. එවිට එතුමාණෝ ඇතැම් අවස්ථාවන්හී එය සීනුවක නාදයක් මෙනි. එම පහළ වීම මහත් අසිරුවට පත් කරයි. පහළ වූ කරුණු මම අවබෝධ කර ගත් පසු, ඒ තත්ත්වය ඉවත් වී යයි. ඇතැම් අවස්ථාවන්හී මිනිස් වෙසින් මලාඉකාවරයෙක් මා වෙතට පැමිණ කථා කරන විට ඔහු පවසන කරුණු මම වටහා ගනිමි.“ යයි පිළිතුරු දුන්හ. ඇත්ත වශයෙන්ම දැඩි ශීතල දිනයක දේව නියෝග එතුමාට පහළ වීම දුටුවෙමි. එතුමාණන්ගේ නළලෙහි ඩහදිය බින්දු ගැලීම මම දුටුවෙමි.

2. විශ්වාසවන්තයින්ගේ මාතාව වන අයිෂා (රලි) තුමිය මෙසේ දන්වයි. “දේව නිවේදන අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන්ට හෙළිදරව් වූයේ යහපත් සිහිනයක් මෙනි. ඒවා ආලෝකමත් දහවල් කාලය මෙන් සැබෑවක් බවට පත්වුණි. ඒ සමගම හුදකලාව කෙරෙහි සිත් තුළ ආශාව අධික විය. හිරා ගල් ලෙනේ දින කිහිපයක් හුදකලාවේ අල්ලාහ්ට නැමදුම් කරමින් සිට, සිය පවුලේ අය දැක ගන්නට හෙතෙම නිවෙසට පැමිණෙයි. තම ගමන සඳහා ආහාර රැගෙන ගොස්, සිය බිරිය වන කදීජා (රලි) වෙතට යළි ආහාර ගෙන යනු පිණිස පැමිණෙයි. හීරා ගල් ලෙනේ සිටි අවස්ථාවක හෙළිදරව්ව එතුමාට පහළ විය. මලාඉකාවරයෙක් එතුමා වෙතට සම්ප්‍රාප්ත වී ‘කියවනු‘ යයි නියෝග කළේය. ‘කියවීමට මම නොදනිමි.‘ යයි නබි (සල්) තුමාණෝ පිළතුරු දුන්හ.

“ඉස්ලාමය සහ බටහිර“ නම් කෘතියෙහි ‘සංස්කෘතිය පිළබඳ ඓතිහාසික සමාලෝචනය‘ යන මාතෘකාව යටතේ ෆිලිප් හිට්ටි නම් විද්වතා මෙසේ ලියයි. “දේව හෙළිදරව්ව පහළ වන විට නබි (සල්) තුමාණෝ ප්‍රීතියෙන් කුල් මත්වී හදිසි අසනීප තත්ත්වයට පත් වීම නිසා, එතුමාට අපස්මාර රෝග වැලුඳුණු බවට සමහරු චෝදනා එල්ල කරන්නට පටන් ගත්හ.“

“ඉස්ලාමය හා බටහිර - ප්‍රතිරූපයක නිර්මාණයක්“ යන කෘතියෙහි නෝර්මන් ඩැනියෙල් නම් තවත් විද්වතෙක් එම අදහස් වල සාරාංශය මෙසේ ලියයි. “මුහම්මද් ඇස්බැන්දුම් ක්‍රියා මගින් තම දේව ගතිය ගැන කදිජා තුමියට ඒත්තු ගන්වා අවසාන බව ඇතැම් අනුවාද පවසයි. දෙවියන් වහන්සේ ගෙන් ලැබූ තින්දුවෙන් ප්‍රථම වරට හටගත් අපස්මාර රෝගය පහදා දිමේ අරමුණින් තමාට දේව හෙළිදරව්ව පහළ වන බව පැවසුවේ යයි තවත් සමහර අනුවාද දන්වයි. කෙටියෙන් පවසන්නේ නම්. කදීජා (රලි) තුමියගේ කොටස ඔවුන් ඉවත් කර අවසානයි. සිදු වුයේ ඔහුගේ අපස්මාර ගැස්ම පමණක් වූ අතර, මලාඉකා වරයෙක් දුටු බව පහදා දෙන ලදී.“

මාක් නම් විද්වතෙකුගේ ස්ථාවරය ගැන නොර්මන් ඩැනියෙල් මෙසේ ලියයි. අපස්මාර රෝගයෙන් පෙළෙන කෙනෙකු සේ මුහම්මද (සල්) තුමාගේ හැසිරිම තිබුණු බව ටොලෙඩෝ නුවරෙන් මාක් තීක්ෂණ ලෙස විමසීය. එමෙන්ම. අපස්මාර ගැස්ම අවසන් වී නබිතුමා නැගිට දැස් විවෘත කිරීම ගැනද සඳහන් කළ මාක්, එය අපස්මාර රෝගයට හෝ යක්ශ

ආවේශයට අදාළ බව සඳහන් කරන්නට කිසිසේත් එකඟ වී නැත.

අපස්මාර රෝග සංකල්පනයට අමතරව ආගමික විත්‍යාව නමින් තවත් චෝදනාවක්ද මෙම විද්වතුන් විසින් එල්ල කරනු ලබයි. එනම් ආගමට අධිකව බැඳීමක් ඇති කර ගත් කෙනෙක් සිහින දැකිය හැකි අතර, ඒවා දෙවියන්ගෙන් ලැබෙන බවට වරදවා සිතන්නට ඉඩ තිබෙන බව රොඩ්වල් නම් පාදිරි වරයෙක් පවසා ඇත්තේ මෙසේය. 'ඔහු (මුහම්මද් සල් තුමාණෝ) මෙම ව්‍යාපාර කාලය තුළ එක්තරා ආත්ම වංචනයකට (මුලාවට) ලක්ව සිටියේය. ඉක්මනින් කලබලයට පත් වන බව වාර්ථා වූ මවකට උපන් ඔහු තරුණ වියේ හදිසියෙන් සිහි නැති වන ආබාධයෙන් පෙළී, අධෛර්‍යයට සහ මනඃකල්පිත මායාවට භාජනය වෙයි. අද්වේගයට සහ දොම්නසට ක්ෂණිකව පත් වන ඔහුට ඔහුගේ නුගත් රටවැසියන් ප්‍රබෝධ ලැබූ කෙනෙක් ලෙස ගෞරව කළහ.'

ආගමික මිත්‍ය සංකල්පයේ චෝදනාව ඉදිරිපත් කළ නිකල්සන් නම් විද්වතෙක් ද මෙසේ පවසයි. "ඔහුගේ තත්ත්වය රෝගයක් හෝ අභිරහස් ප්‍රබෝධයක් හෝ ලෙස සැලකුවත්, අවසාන දිනය අත ළඟයි යන ස්ථිර විශ්වාසය මත ගොඩනැගූ ඔහුගේ ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණ වූයේ තම රට වැසියන්ට එම අනතුර ගැන කෙසේ හෝ අවවාද කිරීමයි. යනුවෙන් හඳුනා ගත හැක."

ශුද්ධ වූ කුර්ආනය අල්ලාහ්ගෙන් හෙළිදරව් වූ බව පිළි නොගන්නා නිකල්සන් තමා බොරු ගොතා පාරායනය කරන බවට මුහම්මද් (සල්) තුමාණෝ අවබෝධ කර නොගත් බව

තව දුරටත් තර්ක කරයි. "කුර්ආනය අල්ලාහ්ගෙන් හෙළිදරව් වූ බව පැවසීමෙන්, අල් කුර්ආනයේ නාමයෙන් එහි කතුවරයා නිකුත් කළ නීති රීති හා උපදෙස් පිළිබඳ ප්‍රෝඩාව ගැන ඔහු දැනුවත්ව ක්‍රියා කළ බව නම් එයින් අදහස් නොකෙරේ."

මුහම්මද් (සල්) තුමාණෝ හුදකලාවේ කාලය ගෙවීමට දැක්වූ කැමැත්තෙන් මේ ගැන පහදා ගත හැකි බව නිකල්සන් අදහස් දක්වයි. "ඔහු හුදකලාවේ නැමදුමේ, විශේෂයෙන් රාත්‍රියන්හී යෙදීමෙන් අස්වාභාවික තත්ත්වයට පත් වන ක්‍රමයක් පුහුණු වූ අතර, ඔහු ජින් ආවේශයට ලක් වූ බව ඔහුගේ සතුරන් පවා පවසන්නට එය හේතු වී ඇත."

බ්‍රයන් ටර්නර් නම් තවත් විද්වතෙක් මෙසේ පවසයි. "නබි (සල්) තුමාණන්ගේ ජීවිත කථා ලියූ යුරෝපයේ සම්ප්‍රදායික කතුවරුන්, එතුමා මානසිකව සාමාන්‍ය කෙනෙකි. එහෙත් අල්ලාහ් ගෙන් පහළ වන හෙළිදරව් පිළිබඳව අවංක නොවූ කෙනෙක්, නොහොත් සිය නබිත්වයේ ව්‍යාපාරය ගැන ස්ථිර විශ්වාසයක් තැබූ මානසික රෝගියෙක් යන ස්ථාවර දෙකක සිටිති."

කෙසේ වෙතත් රොඩ්සන් නම් ප්‍රකට අදේව වාදියෙක් (atheist) අන්තවාදී චෝදනා දෙකෙන්ම නබි (සල්) තුමාණන් බේරා ගනු පිණිස, නව සංකල්පයක් ඉදිරිපත් කළේය. එනම් ශුද්ධ වූ කුර්ආනය මුහම්මද් (සල්) තුමාණන්ගෙන් චේතනාවකින් තොරව සිදු වූ නිර්මාණයක් බව ඔහු පවසිය. එය දිව්‍යමය පහළ වීමක් නොව, මුහම්මද් (සල්) තුමාණන්ගේ පැරණි ජීවිතයෙන් ලබා ගත් දැනුම සහ අත්දැකීම් පදනම් කර ගත් නිපැයුමක් බව ඔහු නිගමනය කරයි.

ඒවායේ සාරාංශය නම් එහිලා සංකල්ප තුනක් තිබෙන අතර, මුහම්මද් (සල්) තුමාණෝ චේතනාවකින් තොරව ශුද්ධ වූ කුර්ආනය නිර්මාණය කළ බව ඔවුන් සියලු දෙනාගේ පොදු මතය වේ. ඒවා නම් අපස්මාර සංකල්පය, ආගමික මිත්‍යා සංකල්පය සහ සිතෙහි අප්‍රකටව පවත්නා සිතුවිලි සමුද්‍රය යනුවේ.

## 8. අපස්මාර රෝග සිද්ධාන්තය

ඒවා අතර අපස්මාර රෝග සිද්ධාන්තය මහත් ප්‍රශ්න වලින් පිරුණු එකකි. අමෙරිකා එක්සත් ජනපදයේ, චිකාගෝ විශ්ව වද්‍යාලය නිකුත් කළ නව බ්‍රිටානිකා විශ්ව කෝෂයේ අපස්මාර රෝගය පිළිබඳව මෙලෙස සඳහන් වී ඇත. “මොළයෙහි ස්නායු සෛලය ක්‍රියාවිරහිත වීමෙන් ක්ෂණික හා පුනරාවර්තනය වූ, මානසික කාර්ය, සංවේදිතා තත්ත්වය, ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය හෝ සිරුරෙහි චලනය වැනි කොටසට සිදුවන බාධාවක් වේ.“ හදිසි ආබාධ යටතේ වර්ග හතරක් සඳහන් කෙරේ. ඒවා නම්, මහා අපස්මාරය, සුළු අපස්මාරය, සයිකෝ මෝටර් සහ ළදරු ගැස්ම යනාදී වශයෙනි.

මහා අපස්මාර රෝගයේ ලක්ෂණ නම්, හදිසියෙන් සිහිසන්ව බිමට ඇද වැටීම සමඟ අත් පාවල ගැස්ම සහිත වලිප්පුව (ගැස්ම) යනුවෙන් එම විශ්ව කෝෂය පවසයි. බිමට ඇද වැටීම සමඟ බෙරිහන් දෙන අවස්ථාවන්ද ඇත. බිමට ඇද වැටීමෙන් පසු, සිරුර තද වී අත් හා පා ගැස්මද, සමහර අවස්ථාවන්හී ශ්වසනය නැවතීමද සිදු වේ. මෙවැනි අවස්තාවේ

හක්කේ මස්පිඬු හැකිලීම නිසා, දිව සපා ගන්නටද ඉඩ ඇත. මෙම රෝගයට ලක් වූ කෙනෙක් තමාට කුමක් සිදුවුණා දැයි කිසිවක් නොදනී. මේ විස්තර අනුව මුහම්මද් (සල්) තුමාණන්නට මෙවැනි සලකුණු කිසිවක් අදාල නොවන බව පැහැදිලිව පෙන්නුම් කරයි.

සුළු අපස්මාර රෝගයට ලක්වූ කෙනෙකුට සිහි කල්පනාව ක්ෂණිකව නැති වී යන අතර මෙම රෝගීන් ගෙන් 70% වයස අවුරුදු 20ට පෙර මෙම පීඩාවට ප්‍රථම වරට ලක්වෙති. මෙම රෝගය නිසා ගැස්මක් සිදු නොවන නමුත් සිහියට බාධාවක් සිදු නොවී දවසක් තුළ කිහිප වරක්ම මෙම චලනය සිදු විය හැක. මේ විස්තර අනුව මුහම්මද් (සල්) තුමාණන්ට හෙළිදරව් පහළවීම මා සුළු අපස්මාර රෝගය සමාන කිරීම දුෂ්කරයි. සුළු අපස්මාරය ක්ෂණික කාලයට අදාළවන නමුත් දේව හෙළිදරව් පහළ වීමට විනාඩි කිහිපයක් ගත වූ අතර දේව නිවේදනය පටන් ගත්තේ එතුමාගේ 40 වන වයසේදීය. තවද දේව හෙළිදරව්ව පහළ වූයේ සෙනඟ බලා සිටින අවස්ථාවන්හීදී බව සළකිය යුතුයි.

සයිකෝමෝටර් සහ හදිසි ආබාධය නිසා පොදුවේ වලිප්පුව හට ගනී. සුරුරේ යම් පාර්ශවයක් තත්පරයකින් කොටසක සිට තත්පර කිහිපයක් සෙලවීමට හෝ එක්තරා වේදනයට ලක් වීමයි. මෙම අවස්ථාවේදී පරිසරය ගැන අවබෝධයද, ශ්‍රවන සහ දෘෂටි මුලාවක්ද කන් දෙකේ සීනුවක ශබ්දයක් ඇසීමද සමඟ අප්‍රසන්න ගඳ හෝ රස දැනෙනු ඇත. මෙවැනි අයහපත් තත්ත්වයක් මුහම්මද් (සල්) තුමාණන්ට දේව හෙළිදරව්ව පහළ වූ කිසිදු අවස්ථාවන්හී සිදු නොවිය. එදා එතුමා පාරායණ කළ

ශුද්ධ වූ කුර්ආනය ඒ ආකාරයෙන්ම අදත් පවතිනු දැක ගත හැක. ශුද්ධ වූ කුර්ආනය අපස්මාර රෝගියෙකුගේ අවලක්ෂණ බෙරිහන් දීමක් ලෙස හෝ කට තුළ කොඳුරන මන්ත්‍රයක් ලෙස හෝ නොවන බව එය පරීක්ෂා කරන ඕනෑම කෙනෙකුට පෙනී යයි.

මේවාට අමතරව වෛද්‍ය විද්‍යාව තවම සොයා නොගත් අපස්මාර රෝග වර්ග කිහිපයක් තිබිය හැක. එහෙත් ඒවාද ආබාධයක් වන හෙයින් කෙනෙකුගේ මානසික ඉන්ද්‍රියන්ට බාධාවක් සිදුවන අතර එවැනි අවස්ථාවෙහි කල්පනා ශක්තිය පාලනය කර ගත නොහැකි වේ. මුහම්මද් (සල්) තුමාණන් වෙතට දේව හෙළිදරව්ව පහළ වූ සෑම අවස්ථාවකම එතුමාණෝ සම්පූර්ණ සංවරයෙන් ක්‍රියා කර ඇති අතර තමා පැවසූ සියලු වැකි යළි පවසන්නටද ඒවා ලේඛන ගත කරවා ගන්නටද මතක තබා ගත්හ. ඒ බව ශුද්ධ වූ කුර්ආනයේ 75-16 සිට 19 දක්වා වාක්‍යයන්හී අල්ලාහ්ගේ සඳහනද දැක ගත හැක.

“අල් කුර්ආනය හදාරන්නට ඉක්මන් වී ඔබ දිව නො සලවනු. එය එක්රැස් කිරීමත්, එය සමුදිරණය කරවීමත් අපි කෙරෙහිය. අපි එය සමුදිරණය කළ කල්හී, *ඔබ ඒ සමුදිරණය අනුගමනය කරනු මැනවි. පසුව එහි විවරණය අප කෙරෙහිය.*“

ඇත්ත වශයෙන්ම ශුද්ධ වූ කුර්ආනය මතක තබා ගැනීම ඉතා පහසු කාර්යයක් වන අතර එය අධ්‍යනය කළ මුස්ලිම්වරු පිරිසක් රැස් කර ගතහොත් ඔවුන්ගේ මතකයෙන් සමුපූර්ණ කුර්ආනය ආරම්භයේ සිට අවසාන දක්වා පාරායන කළ හැක. පාරායන කරන ජනතාව අරාබි බස නොදැන සිටියත් මෙය ලොවේ සෑම රටකම සිදුවෙමින් පවතී. මෙම පිරිස හාෆිස් අල්

කුර්ආන් යන ගෞරව නාමයද හිමි කරනු ලබති. කුඩා දරුවන්ගෙන් සිට මහලු වයස දක්වාම සාමාන්‍ය ජනතාව ලොවේ සෑම රටකම හාෆිස්වරු සිටීම කුර්ආනයේ තවත් හාස්කමකි. මේ පිරිසට අමතරව මුස්ලිම්වරු දෛනික නැමදුම සඳහා පරිච්ඡේද රාශියක් කට පාඩම් කර ගනිති. අන් කිසිදු දේව ග්‍රන්ථයකට මෙවැනි කීර්තියක් හිමි වී නැත. අල් කුර්ආනයේ 54-17 වාක්‍යද ඒගැන පවසන්නේ මෙලෙසයි. *"අපි අල් කුර්ආනය සිහිවටන් කිරීමට ලෙහෙසි කෙළෙමු. එයින් අවවාද ලබන්නෙක් සිටීද?"*

## 9. ආගමික මිත්‍යා වේ සිද්ධාන්තය

ආගමික මිත්‍යාව සහ සිතෙහි අපූකටව පවත්නා සිතුවිලි යන සිද්ධාන්ත දෙකම එකම වර්ගයට අයත් චෝදනා වන හෙයින් ඒවා ගැන මෙහිදී සාකච්ඡා කරමු.

අල් කුර්ආනය මුහම්මද් (සල්) තුමාණන්ගේ දැනුම, මනඃකල්පිතය, අත් දැකීම් සහ පරිසරය තුළින් එතුමාණන්ගෙන් නිකුත් වූ කෘතියක් වන නමුත් ඒ බව එතුමා නොදන්නා බව මෙම සිද්ධාන්ත දෙකම පවසයි. මෙම නිගමනයට විරුද්ධව කරුණු දක්වන බොහෝ වැකි ශුද්ධ වූ කුර්ආනයේ තිබීමේ හේතුවෙන් නබි (සල්) තුමාණන්ගෙන් දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ නිකුත් වූ බව පවසන තර්කය පිළිගැනීම අසීරුය. මෙයට අදාළවන ඓතිහාසික, අනාගත සිදුවීම් සහ මනෝමය කරුණු සමහරක් ගැන සලකා බලමු.

උදාහරණයක් වශයෙන් මක්කාවේ පිළිම වන්දනිකයන්, ආගමික ග්‍රන්ථ ලද ජනතාව (යුදෙව් සහ ක්‍රිස්තියානුවන්) හමු වී ඔවුන් සමඟ සාකච්ඡා කර නබි (සල්) තුමාණන්ව පරීක්ෂා කරනු පිණිස එතුමාණන්ට ඉදිරිපත් කළ ප්‍රශ්න තුනක් සහ ඒවාට පිළිතුරු වශයෙන් අල් කුර්ආනයේ හෙළිදරව් වූ වැකි ගැන සලකා බලමු.

1. ගල් ලෙනේ දීර්ඝ නින්දට පත් වූ පිරිස කවුද?

2. කිඃද්ර් ගේ සැබෑ කථාව කුමක්ද?

3. දුල් කර්නෙයින් ගැන ඔබ කුමක් දන්නේද?

මෙම ප්‍රශ්න සියල්ල යුදෙව් සහ ක්‍රිස්තියානි ඉතිහාසය හා සම්බන්ධ කරුණු වන අතර හිජාස් පළාතේ වාසය කරන අරාබි ජනතාව මේවා ගැන කිසිවක් නොදනිති. මේ හේතුවෙන් නබි (සල්) තුමාණෝ ඇසට නොපෙනෙන හා ගුප්ත දේ පිළිබඳ දැනුමක් ඇති කෙනෙක්දැයි පරීක්ෂා කරනු පිණිස මෙම ප්‍රශ්න මාලාව තෝරා ගනු ලැබීය. මෙම ප්‍රශ්න තුන ඉදිරිපත් කළ විට "හෙට මම පිළිතුරු දෙන්නෙමි." යනුවෙන් නබි (සල්) තුමාණෝ පැවසූ නමුත් ඉන්ෂා අල්ලාහ් (අල්ලාහ්ගේ කැමැත්තෙන්) යනු එතුමාණෝ පැවසුවේ නැත. පසු දින එතුමාණන්ගේ විරුද්ධ පාර්ශවය පැමිණි විට පිළිතුරු නොදී කල් දමන්නට සිදු විය. එලෙස කිහිප වතාවක් සිදු වුණි. රාත්‍රි 15ක් ගෙවී ගිය නමුත් කිසිඳු දේව හෙළිරව්වක් පහළ වූයෙ නැත. මක්කාවාසීන් එතුමාට කියන ඇනුම් පද වලට සවන් දීමට සිදු වීම ගැනද අහසෙන් හෙළි දරව් පහළ නොවීම ගැනද එතුමාණෝ මහත් කම්පනයට පත්ව සිටියහ. අනතුරුව

මිනිසුන්ගේ කථාව නිසා සිත් වේදනාවට පත් වීම ගැන එතුමාට අවවාද කරමින් ප්‍රශ්නවලට පිළිතුරු රැගෙන ජිබ්රීල් (අලෙයි) තුමා පැමිණියේය. එතුමාණන්ට දරා ගන්නට සිදු වූ දීර්ඝ ප්‍රමාදයට හේතුව අල් කුර්ආනයේ මෙසේ පහදා දෙන ලදී.

*"මම එය හෙට කරන්නෙමි යයි කිසි දැයක් ගැන කිසි කලකත් නොකියනු. අල්ලාහ් සිතුවොත් මිස, ඔබට මතක නැතිවුවහොත් ඔබේ හිමි සිහි කරනු. තවද මාගේ හිමි මෙයට වඩා ළංවන මාර්ගයකට මඟ පෙන්වන්න පුළුවන්යයි කියනු."* අල් තුර්ආන්18 වාක්‍ය 23 හා 24.

අල් තුර්ආනයේ මෙම අණ කිරීම පහළ වීමෙන් පසු, සියලු මුස්ලිම්වරු අනාගතයේ යමක් ගැන පවසන විට "ඉන්ෂා අල්ලාහ්" යන පද එකතු කරන්නට පුරුදු වූහ.

මෙම දීර්ඝ ප්‍රමාදයේ වැදගත්කම පිළිබඳව මාටින් ලිංස් මෙසේ පවසයි. "දේව වාක්‍ය පහළ වීමේ පුමාදය නබි (සල්) තුමාණන්ට සහ සහාබා වරුන්ට මහත් කම්පනයට හේතු වූ මෙන්ම ඇත්තෙන්ම එය අමතර ශක්තියක් ගෙන දුන්නේය. එතුමාගේ පරම සතුරන් එම සිද්ධියෙන් කිසිදු නිගමනයකට එළඹෙන්නට ප්‍රතික්ෂේප කළ නමුත්, අල්ලාහ් ගෙන් හෙළිදරව් පහළ වන බවද නබි (සල්) තුමාණන්ට එගැන කිසිඳු පාලනයක් නොමුති බවද පවසන කථාව සනාථ කරන අවස්ථාවක් බව කුරෙයිෂිවරු අතරින් සිටිනා අපක්ෂපාත ජනතාවට පැහැදිලිව පෙනී ගියේය. මෙයට පෙර පාරායන කල දේව වාක්‍යයන් මුහම්මද් (සල්) තුමාණන් විසින් රචනා කර තිබුණේ නම් එතුමාගේ බලා පොරොත්තු සියල්ල පරාජයට පත් විය හැකි

මෙවැනි අවදානම් සහිත අවස්ථා වක මෙතරම් දීර්ඝ ප්‍රමාදයට එතුමා දැනුවත්ව ඉඩ දෙන්නේ දැයි ප්‍රශ්නයකි.“

මෙහිදී සැලකිය යුතු තවත් වැදගත් කරුණක් නම් මුහම්මද් (සල්) තුමාණන් ගෙන් සමහර සිදුවීම් ගැන ප්‍රශ්න කරන ලදී. ඒවාට නිවැරදි පිළිතුරු සපයා විවේචකයින් නිහඬ කිරීමට ආගම්ව මුළාව එතුමාට සහාය වූනේ කෙසෙදැයි කිසිසේත්ම වටහා ගත නොහැක. ගල් ලෙනේ දිර්ඝ නින්දට පත් වූ පිරිස ගැන කුර්ආන් ඉතාමත් කදිම ලෙස පිළිතුරු දුන් ආකාරය දෙස බලන්න. “ඔවුහු අවුරුදු තුන් සීයයක් ඔවුනේගේ ගුහාවෙහි නතර වී සිටියෝය. තවත් (අවුරුදු) නවයක් එකතුව. 18-25.

මෙහිදී වදන යෝදා තිබෙන ආකාරය ඉතා වැදගත්ය. වසර තුන් සීය නවයක් ලෙස අල් කුර්ආනය නොපවසයි. එය වෙනුවට වසර තුන් සීයයක්, තව නවයක් එකතු කරනු යනුවෙන් පවසයි. නවයක් එකතු කරන්නට හේතුව කුමක්කද?

සූර්ය වර්ෂය අනුව එම පිරිස සිටියේ වර්ෂ තුන් සීයයකි. චන්ද්‍ර වර්ෂය 309ක් වේ. චන්ද්‍ර වර්ෂයට දින 11ක් අඩුයි. දින 11 වසර 300න් ගුණ කර 365න් බැදුවහොත් ලැබෙන පිළිතුරු වසර 9යි. මෙවැනි මවිතයට පමුණු වන නිවැරදි ගණනය කිරීම කෙනෙකුගේ ආගමික මිත්‍යාවෙන් හෝ අප්‍රකට සිතුවිලි තුළින් හෝ මුලාවෙන් හෝ බිහිවුණු බව කිසිවෙකුට තර්ක කළ හැකිද? කවරෙක් හෝ එසේ තර්ක කරන්නේ නම් එය පිළිගන්නේ කෙසේද?

පැරණි ශිෂ්ටාචාරයක් පිළිබඳව පවසන තවත් වාක්‍යයන් ශුද්ධ වූ කුර්ආයේ තිබේ. *“ඔබේ හිමි ආද් (ජනයාට) කළ හැටි*

*ඔබ නොදුටුවේද? උස් ටැඹන් (මෙන් උස සිරුරු සහිත ඔවුන්) ඉරම් නගර වැසියෝය. මෙවැන්නන් අන් කිසිදු භූමියේ මවනු නොලැබුණි.* "89- වාක්‍ය 6 සිට 9 දක්වා.

අල් කුර්ආනයේ සඳහන් වී තිබීමට අමතරව ඒ පිළිබඳ තොරතුරු අන් කිසිවෙක් නොදනිති. මෙම නගරය පිළිබඳව ඉතිහාස සටහනක් පවා නොතිබුණි. නබි (සල්) තුමාණන්ගේ කාලයේදී එම නගරයේ නම පවා අප්‍රකට එකකි. මේ හේතුවෙන් එම නගරය පිහිටි ස්ථානය ගැන නොයෙක් අනුමාන ගත කල්පනාවට මඟ විවෘත වුණි. ආද් ජනතාවගේ නායකයෙකුගේ නම ඉරම් විය හැකි බව පවා ශුද්ධ වූ කුර්ආනයේ ඇතැම් පැරණි විග්‍රකයින් අදහස් දැක් වූහ.

ඇමරිකන් නැෂනල් ජියෝග්‍රපික් සොසයිටි නම් පර්යේෂන ආයතනයේ මාසික සඟරාවෙහි 1978 දෙසැම්බර් මස කලාපයේ ඉරම් යනු නගරයක නමක් බවට ස්ථිරව සඳහන් කර ඇත. රෝම් විශ්ව විද්‍යාලයේ ආචාර්ය පාවුලෝ මැතියේ නම් විද්‍යාඥයෙක් 1975 වසර ඉතාලිය පුරාවිද්‍යා පර්යේෂණ කණ්ඩායමේ අධ්‍යක්ෂක වශයෙන් සිරියාවට ගියේය. එහිදී ඔහුට පුරාවිද්‍යාත්මික ලොතැරැයි දිනීම වැනි වාසනාවක් හිමිවුණි. ක්‍රිස්තුට පෙර 23 වන ශත වර්ෂයේදී පමණ විනාශ වූ නටබුන් මාලිගාවක තුන්වන සහශ්‍ර වර්ෂයට අයත් අගනා ලේඛන මිටයක් ප්‍රථම වරට ඔහු සොයා ගත්තේය. එනම් උල් හැඩ අකුරු (cuneiform) යොදා ලියන ලද කුඩා පළක (tablets) 15,000 කට අධික ප්‍රමාණයක් සොයා ගත්තේය. එහි සඳහන් ව තිබුණු වටිනා තොරතුරු අතර ඉරම් සමඟ එබ්ලා නම් රාජ්‍ය වාණිජ සම්බන්ධකම් පැවැත් වූ බව අනාවරණය

වුණි. සූරා 89 යෙහි අල් කුර්ආනය පැවසූ ඉරම් නම් අපැහැදිලි නගරයක් පිළිබඳව එහි (ලේඛන මිටියෙහි) සඳහන් වී තිබුණි.

මහමුමද් (සල්) තුමාණන්ගේ උපතට වසර 3,000ට පෙර පැවති පැරණි නගරයක ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව නිවැරදි තොරතුරු ශුද්ධ වූ කුර්ආනය විස්තර කරයි. මුහම්මද් (සල්) තුමාණන්ගේ ආගමික මිත්‍යාව හෝ අප්‍රකට සිතුවිලි තුළින් මෙය සිදු වූ බව සිතීම පවා අපහසුයි.

තවද දේව හෙළිදරව් පහළ වන්නට පෙර මුහම්මද් (සල්) තුමාණන් හෝ එතුමාණන්ගේ ජනයා හෝ පැරණි කථා ගැන කිසිවක් දැන සිටියේ නැති බව ශුද්ධ වූ කුර්ආනය නොයෙක් තැන් හී සඳහන් කරයි. "මේවා අදෘෂට තොරතුරු වැකිනි. අපි ඔබට එය වහී වාක්‍යයෙන් ප්‍රකාශ කළෙමු. මෙයට පෙර ඔබ හෝ ඔබේ ජනතාව හෝ එය නොදන්නෝය. එහෙයින් ඉවසනු, සැබැවින්ම, (ලක්ෂණ) අවසානය භය භක්තිකයෙත් යුත් අයටය." 11 – 49.

මෙහිදී තවත් වැදගත් කරුණක් මතක් කළ යුතුයි. මෙවැනි වාක්‍ය පහළ වන අවස්ථාවන්හී, සවන් දෙමින් සිටි කිසිවෙක් නැගිට "මුහම්මද් (සල්) තුමනි, ඔබ පවසන දේ සම්පූර්ණයෙන්ම වැරදියි. මමද ඔබ මෙන් අරාබි ජාතිකයෙකි. ඔබට පෙර මේ කථා මම දැන සිටියෙමි." යනුවෙන් කිසි විටක අභියෝග කළේ නැත. තවද මෙවැනි වාක්‍යයක් පාරායන කිරීමෙන් මුහම්මද් (සල්) තුමාණෝ අනවශ්‍ය ගැටලු වලට ආරාධනා කරන බවක් පෙන්නුම් කරයි. මෙම කථා පිළිබඳව එතුමා දැනගෙන, ඒවා ගැන නොදන්නාසේ පෙනී සිටියේ නම් එවකට ජීවත් වූ සෙසු අයද මේවා ගැන කිසිවක් නොදැන සිටින

බව ස්ථිර නිගමනයට එළඹෙන්නේ කෙසේද? නබි(සල්) තුමාණෝ ඒවා ගැන දැන සිටියේ නම්, ඒවා ගැන දැනුමක් ඇති තවත් කිහිප දෙනෙක් එම සමාජය තුළ සිටීම ස්වාභාවයකි. එතුමා කුරෙයිෂි වරුන්ගේ දැනුම ගැන පැවසුවේ සැබැවක් වූවත් පළමුවෙන් පිළිතුරු සපයා ඉන් අනතුරුව අභියෝගය නිකුත් කළ හෙයින් එම අවස්ථාව තමන්ට වාසියට හරවා, එතුමාව නින්දාවට පත් කරන්නට එතුමාගේ සතුරන්ට ඉඩ තිබුණි. එහෙත් එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නට කිසිවෙක් ඉදිරි පත් නොවුවා පමණක් නොව එම විස්තර අසා ඔවුන් මවිතයටද පත්ව සිටියහ.

ලෝංමන් ශබ්ද කෝෂයේ, සිතෙහි අප්‍රකටව පවත්නා සිතුවිලි ගැන සඳහන් කරන්නේ මෙසේය. "කෙනෙකුගේ අවබෝධමත් දැනුමෙන් තොරව. සිතෙහි සැඟවී තිබෙන තරම සහ එහි නැගෙන සිතුවිලි." එහෙත් ඉහත සඳහන් කුර්ආන් වාක්‍ය දැනුවත්ව, එඩිතරව, ස්ථිරව නිකුත් කළ එකකි. මෙවැනි එඩිතර ප්‍රකාශයක් නිකුත් කරන්නට පෙර, සතුරන් එතුමාට විරුද්ධව එය උපයෝගි නොකරන බවට මුහම්මද් (සල්) තුමාණෝ ස්ථිර වශයෙන් දැන සිටියේ කෙසේද? ඒ බව එතුමාට පොරොන්දුවක් තිබුණෝද?

දෙවනුව, අනාගත සිදුවීම් ගැන අල් කුර්ආනය නිශ්චිත ප්‍රකාශ නිකුත් කිරීමද, ඒවා ඒ ආකාරයෙන් සිදුවීමද මුහම්මද් (සල්) තුමාගේ අත්දැකීම මත අල් කුර්ආනය රචනා කළා යැයි නඟන තර්කයට කොහෙත්ම අනුකූලතාවක් නොදක්වයි. මේ පිළිබඳව නිදසුන් දෙකක් බලමු. ක්‍රි.ව. 615 හෙළිදරව් කරනු ලැබූ 30 වන සූරා රූම් හී වාක්‍ය 2 සිට 7 දක්වා රෝමානු

අධිරාජ්‍ය දැනට පර්සියානු අධිරාජ්‍ය විසින් පරාජයට පත් වූ නමුත් වසර කිහිපයක් තුළ යළි ජය ගන්නා බව පවසයි. මෙහිදී 4 වන වාක්‍යයහි වසර කිහිපයක් ගැන සඳහන් කරන 'බිද්ඉ' යන වචන පදය යොදා ගෙන ඇති අතර එහි අර්ථය වසර 3 සිට 9 දක්වා වූ කාලයයි. ඇත්ත වශයෙන් සිදුවූයේ එයයි. ශුද්ධ වූ කුර්ආයේ අනාවැකිය නිකුත් වී වසර 7ක කාලයකින් රෝමානුවරු යළි පර්සියාව පරදවා ජය ලැබවෝය. මෙහදී ඉතා වැදගත් කරුණ වන්නේ, "එදා දින විශ්වාස කරන්නෝ ජය ලැබ ප්‍රීති වන්නෝය." යන අනාවැකියද අල් කුර්ආනයේ නිකුත් වීමයි. ඇත්ත වශයෙන්ම එම අවදියේ මුස්ලිම්වරුන්ගේ කුඩා සේනාව බද්ර් රණබිමේ මක්කා කාෆිර් වරුන්ගේ විශාල සේනාව පරදවා විශිෂ්ට ජය ලැබුවෝය. මේ ගැන හින්ගොරා නම් විද්වතෙක් මෙසේ පවසයි.

"622 වසරේ හේරාක්ලියස් මහරජ පර්සියානු සේනාව ජරාජයට පත් කර එම රටට 624 වසරේ ඇතුළු වීමෙන් ශුද්ධ වූ කුර්ආනයේ අනාවැකිය නිසි ලෙස ඉෂ්ට වුණි. එ පමණක් නොව, එම වසරේ මුස්ලිම්වරු බද්ර් රණ බිමේ මක්කා කාෆිර් වරුන් පරාජයට පත් කර අල් කුර්ආන් පැවසූ පරිදි "විශ්වාසවන්තයෝ ප්‍රීති වූහ."

බද්ර් සටනේ ප්‍රතිඵලය ගැන, නබි (සල්) තුමාණෝ මක්කාවේ සිටියදී පහළ කළ අනාවැකිය දෙස බලමු. "නැතහොත් අපි ජයග්‍රහක සමූහයක් වශයෙන් එක් වී ජය ලබමු යි ඔවුහු (කුරෙයිෂිවරු) කියන්නෝද? ඉක්මනට ඔවුන්ගේ සමූහය සී සී කඩ කරනු ලැබ, පිටු පා පලා යන්නෝය. 54-44 සහ 45. නබි (සල්) තුමාණෝ කාෆිර් වරුන්ගේ හිංසාවට

ලක්වෙමින් මක්කාවේ ජීවත් වූ අවස්ථාවේදී, වසර කිහිපයට පසුව සිදු විය හැකි සටනේ ප්‍රතිඵල ගැන අල් කුර්ආනයේ පවසා තිබුණු අනාවැකිය මෙය වේ.

තවත් නිදසුනක් වශයෙන් 111 පරිච්ඡේදයේ 1 සිට 4 දක්වා වාක්‍ය දෙස බලමු.

නබි (සල්) තුමණ්ගේ ලොකු පියා (මහප්පා) වන අබූ ලහබ් කාෆිර්වරයෙකු (ප්‍රතික්ෂේප කරන්නෙකු) වශයෙන් මරණයට පත් වන බව අල් කුර්ආනයේ ප්‍රකාශයයි. ඒ ගැන තොමස් පැට්‍රික් හියුස් මෙසේ ලියයි. "නබි (සල්) තුමාණන් ගේ ඉතා දරුණුම සතුරෙකු වූ ඔහු ඉස්ලාමය ස්ථාපනය වීමට එරෙහිව දැඩි ලෙස වෛර දැරූ කෙනෙකි. සිය පවුලේ සාමාජිකයින්ට අවවාද කරන ලෙස අල්ලාහ්ගේ නියෝගය පහළ වීම හේතු කොට ගෙන මුහම්මද් (සල්) තුමාණෝ සිය ඥාතීන් රැස්කරවා තමා අවවාද කරන්නෙක් බවද, ප්‍රතික්ෂේප කරන්නන්ට බරපතළ දඬුවමක් ලැබිය හැකි බවද පැවසූහ. එවිට අබූ ලහබ් "නුඹ විනාශයට පත්වේවා, අපට මෙතැන රැස් කළේ මෙයටද" යනුවෙන් කෑ ගසා, එතුමාට පහර දීමට ගලක් අතට ගත් විට ඔහුගේ ඉරණම ගැන පවසන සූරා ලහබ් පහළ විය.

ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් එම හෙළිදරව්වෙන් වසර 11කට පසු අබූ ලහබ් කාෆිර්වරයෙකු ලෙසම මරණයට පත්විය. ඔහු මුහම්මද් (සල්) තුමාණන්ගේ දරුණුම සතුරෙක් වූ අතර, ඔහුට එරෙහිව එවැනි ප්‍රකාශයක් නිකුත් කිරීම යුක්ති සහගත ක්‍රියාවක් නොවන බව තර්කානුකූල විය හැකිය. මන්ද, තමා ඉස්ලාමය පිළි ගත් බවට බොරුවක් පවසමින් අල් කුර්ආනය ව්‍යාජ බව පතුරු වන්නට අබූ ලහබ්ට අවස්ථාවක් තිබීමයි. මෙම

මහඟු අවස්ථාව අබූ ලහබ් පැහැර හැරියේ ඇයි? වසර දහයක් මුළුල්ලේම අබූ ලහබ් මෙවැනි ක්‍රියාවක් නොකරන බව මුහම්මද් (සල්) තුමාණෝ ස්ථිර ලෙසින්ම දැන සිටියේ කෙසේද? අනාගතය පිළිබඳ දැනුම අත් දැකීමේ කොටසක් වන්නේ නැත.

ඒ සමගම, අප්‍රකට සිතුවිලි සිද්ධාන්තය ප්‍රතික්ෂේප කරන මනෝ විද්‍යාත්මක කරුණු කිහිපයක් තිබේ. අභිමත නොවන හෝ දෝෂාරෝපණයට තුඩු දෙන සිතුවිලි සියල්ල තවත් කෙනෙකුට පැවරීමට හෝ සඟවා තැබීමට කෙනෙකුගේ අප්‍රකට සිතුවිලි නැඹුරුවන්නේය. ශුද්ධ වූ කුර්ආනය නබි (සල්) තුමාණන්ගේ අප්‍රකට සිතුවිලි තුළින් සිදු වූ නිර්මාණයක් නම්, එතුමාට දොස් පැවරීමක් හෝ වැරදි පෙන්වා දීමක් හෝ එහි ඇතුලත් නොකිරීමට වග බලා ගන්නට තිබුණි. 80 වන පරිච්ඡේදයේ මුල් වාක්‍ය 10ම ඉබ්න් මක්දූම්ට නබි (සල්) තුමාණෝ සැලකිලි නොදැක්වීම ගැන ශුද්ධ කුර්ආය එතුමාණන්ට අවවාද කරයි. ඒ ගැන සෙය්යද් කුතුබ් මෙසේ පවසයි. “කුරෙයිෂි ජනතාවට අයත් පුබුවරුන් පිරිසකට ඉස්ලාමය පහදා දීමේ කටයුත්තක නබි (සල්) තුමාණෝ යෙදී සිටන විට ඉබ්න් මක්දූම් නම් දුප්පත් අන්ධ මිනිසෙක් එතුමා වෙතට පැමිණියේය. නබි (සල්) තුමාණෝ වැදගත් ක්‍රියාවක යෙදී සිටීම ගැන නොදත් ඉබ්න් මක්දූම් ශුද්ධ වූ කුර්ආන් වැකි සමහරක් උගන්වන ලෙස නබි (සල්) තුමාණන්ගෙන් කිහිප වරක්ම ඉල්ලා සිටියේය. ඔහු ඒ අයරින් මැදිහත්වීම නොරිස්සූ නබි (සල්) තුමා අකැමැත්තෙන් ඔහුගෙන් ඉවත හැරුණේය.

නබි (සල්) තුමාණන්ගේ හැසිරීම ගැන ඒ අවස්ථාවේදීම අල් කුර්ආනයේ විවේචනන කරනු ලැබීය.

එමෙන්ම, බද්ර් සටනේ සිරභාරයට ගත් 70 දෙනෙකු පිළිබඳව නබි (සල්) තුමාණෝ ගත් තීරණය ගැන එතුමාට අල් කුර්ආනය දොස් පැවරීම තවත් උදාහරණයකි. එවැනි සිද්ධීන් තවත් කිහිපයක්ම ඇති අතර, එවැනි විවේචන කෙනෙකුගේ අප්‍රකට සිතුවිලි නිසා සිදු වූ බව පිළිගැනීම මහත් අසීරුයි.

පැහැදිලි කිරීමට අපහසු තවත් මානුෂික ලක්ෂණයක් වනුයේ නම්, කෝපයට පත් වූ කෙනෙක් සන්සුන් තත්තවයට පත්වීමට සුළු වේලාවක් ගත වන බව කවුරුත් දන්නා දෙය වීමයි. එය කෙසේ වෙතත්, දොස් පැවරීම සහ සමාව දීම එකවරටම සිදුවීම අල් කුර්ආනයේ දැක ගත හැකිය. ඉහත සඳහන් නිදසුනනට අමතරව, මුලින් සමාව දී, ඉන් අනතුරුව දොස් පැවරීම සිදු වීමද ශුද්ධ වූ කුර්ආනයේ දැක ගත හැකිය. “අල්ලාහ් ඔබ කෙරෙහි සමාවේවා. සත්‍ය කීවවුන් ප්‍රතක්ෂව බොරු කීවවුන් ඔබට පැහැදිලි වන්නට පෙර, ඔබ ඔවුන්ට අනුමැතිය දුන්නේ ඇයිද?“ 9-43

නබි (සල්) තුමාණන්ගේ බිරිය අයිෂා (රලි) තුමියගේ අවංක භාවයට හා පිරිසුදු භාවයට එරෙහිව ද්වේශ සහගත බොරු පුවාර පැතිර වූ කුහකයන්ගේ සිද්ධිය දෙස බලමු. මෙම බොරු ප්‍රචාරයේ හේතුවෙන් නබි (සල්) තුමා දොම්නසට පත්ව, කිසිවක් නොපවසා, මාසයක් ඉවසීමෙන් පසු වුහ. අනතුරුව දේව වාක්‍ය පහළ වීමෙන් කුහකයින්ගේ අකුසල් අරමුණ හෙලි කරමින්, අයිෂා (රල්) තුමියගේ නිදොස් භාවය සනාථ කොට ඇත. මුහම්මද් (සල්) තුමාණෝ අල් කුර්ආන් වැකි රචනා

කළේ නම්, එයින් එතුමාගේ මානසික වේදනාව ඉවත් කිරීමට නොහැකිවන අතර, අල් කුර්ආනය එතුමාගේ අප්‍රකට සිතුවිලි මගින් රචනය කරනු ලැබූ එකක් නම්, එතරම් දීර්ඝ කාලයක ප්‍රමාද කිරීමක් සිදු නොවනු ඇත.

තවත් වැදගත් කරුණක් නම්, මක්කාවේ කාෆිර්වරු සමඟ හුදෙයිබියා ගිවිසුම අත්සන් කිරීමට මූලික හේතුව කුමක්දැයි සහාබාවරුන්ට පහදා දෙන්නට නබි (සල්) තුමාණන්ට මඟක් නොතිබුණි. එවැනි ඥානවන්ත ක්‍රියා වෙන් ඉස්ලාමයට කාලයකට පසුව යහපතක් සිදුවන බව ශුද්ධ වූ කුර්ආනය මෙසේ අනාවැකි පවසයි. “විශ්වාස කරන්නවුන් ගැන ඔවුන් ගස යට ඔබට පක්ෂපාත භාවය දිවුරූ කල් හී අල්ලාහු සතුටු විය. ඔවුන්ගේ සිත්හි දැය ඔහු දනී. එහෙයින් ඔහු ශාන්ත භාවය ඔවුන් කෙරෙහි පහළ කෙළේය. තවද ඔහු ඉක්මන් විජයග්‍රහනයක් ඔවුන්ට දුන්නේය.” 48-18. හුදෙයිබියා ගිවිසුමේ ප්‍රතිඵලයක් වශයෙන් මක්කාවේ කාෆිර්වරු මුස්ලිම් වරු සමඟ සමීපව ආශ්‍රය කරන්නටද, එමගින් ඉස්ලාමය ගැන මනා අවබෝධ ලබා ගෙන බොහෝ දෙනෙක් මුස්ලිම් බවට පත්වන්නටද පටන් ගත්හ. එයට අමතරව කෑයිබර් සටනේ මුස්ලිම්වරු ජය ගත්හ. ශුද්ධ වූ කුර්ආනය අනාවැකියක් සේ පැවසූ ජයග්‍රහණ සැබෑ වුණු බව සහාබාවරු සිය දෑසින් දැක ගත්හ.

අප්‍රකට සිතුවිලි සිද්ධාන්තයට එකඟ නොවන තවත් කරුණක් තිබේ. ශුද්ධ වූ කුර්ආනයට අමතරව, මුහම්මද් (සල්) තුමාණෝ බොහෝ කරුණු ගැන කථා කළහ. මේ දෙක අතර සැලකිය යුතු වෙනසක් තෙබෙන බව කවුරුත් දනිති.

සැබැවින්ම ඒවා දෙක කොහෙත්ම සමාන කළ නොහැකිය. ශුද්ධ වූ කුර්ආනයේ ඇති එක වාක්‍යයක් වුවද නිර්මාණය කරන ලෙස ශුද්ධ වූ කුර්ආනය අභියෝග කරන නමුත්, හදීස් වදන් ගැන එසේ නොකරයි. හදීස් වදන් අලංකාරවත් උසස් කථා වන නමුත් එය අනුකරණය කළ නොහැකි බව කිසිවෙක් නොකියයි.

"මුහම්මද්නිස්ම් - ඓතිහාසික සමීක්ෂණයක්" යන කෘතියේ, ගිබ්ස් නම් විද්වතෙක් මෙසේ පවසයි. "එතුමා මක්කාවට ගොස් ඉටු කළ සමුගැනීමේ වන්දනාවේ පැවැත් වූ අවසාන දේශනය අති වැදගත් අවස්ථාවක්සේ සැලකේ. එම වන්දනාව ආගමික නීති රීති සහ චාරිත්‍ර පෙන්වා දුන් වැදගත් අවස්තාවක් වුවද, ඒ ගැන ශුද්ධ වූ කුර්ආනයේ කිසිවක් සඳහන් වී නැත. මෙවැනි වැදගත් දේශනය පවා ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් නොවීමට හේතුව කුමක් වුවත් දේව හෙළිදරව්ව යනු නබි (සල්) තුමාණන් විසින් නොදැනුවත්ව හා පාලන නොකරන ලදුව, පිටත සිට එතුමාණන්ගේ මුවේ දමන ලද වචන මාලාවට පමණක් සීමා වූ එකක්සේ නිගමනයට එළඹීම වැළැක්විය නොහැක."

මේ දක්වා අල් කුර්ආනය දැනුවත්ව හෝ නොදැනුවත්ව රචනය කළ කතුවරයා මුහම්මද් (සල්) තුමාණන් බව පවසන සිද්ධාන්තය යුක්ති සහගත නොවන බව පෙන්වා දෙන ලදී. දෙවනුව මුහම්මද් (සල්) තුමාණෝ ශුද්ධ වූ කුර්ආනයේ සැබෑ කතෘවරයා නොවන නමුත්, වෙනත් කවරුන් ගෙන් හෝ මූලාශ්‍රිත වලින් අදහස් සොරකම් කර ගත් බව නගන් චෝදනා පිළිබඳව ද සොයා බලමු.

## 10. යුදෙව් සහ ක්‍රිස්තියානි මූලාශ්‍රිතයන්?

"ඉස්ලාමය සහ බටහිර" යන කෘතියේ යුරෝපයේ ෆිලිප් හිට්ටි මෙසේ පවසයි. "තුර්ආනයේ මූලාශ්‍රය ගැන කිසිදු සැකයක් නැත. ඒවා ක්‍රිස්තියානි, යුදෙව්වන් සහ අරාබි ම්ලේච්ඡ යන් ගෙනි."

ජේසු හා මරියම් තුමියගේ චිත්‍රයක් කඅබාව තුළ බිත්තියේ තිබුණු බව ඔහු ගේ මතයට පක්ෂව සාක්ෂි මවා පෙන්වන්නට හිට්ටි උත්සාහ කරයි. තොට්ල්ලේ සිටි ජේසු බිලිඳා ජනතාව අමතා කථා කිරීම, මැටියෙන් කුරුල්ලෙක් සාදා එයට ප්‍රාණය දීම වැනි තොරතුරු ශුද්ධ වූ අල් කුර්ආනය අන් අයගෙන් ලබා ගත් බවද නූතන බයිබලයට, පසු කාලයේ එකතු කළ ළදරු විය පොතෙහි ඒවා හා සමාන වැකි දක්නට තිබෙන බවද ඔහු පවසයි. "දේව මෑණියය වන මර්යම් හා ආරන්ගේ සොයුරිය වන මරියම් අතර අවුලක් සිදු වී තිබේ. අබූ සුරස්ගේ හිතවත් හාමාන්, ෆිර්අවුන්ගේ ඇමති බව (සූරා 40 – 38) සඳහන් වන අතර, අල් කුර්ආනය සඳහන් කරන අන් තවු සහිත දූල් ක්නයින්, සිරියාවේ ක්‍රිස්තියානි ජනතා අතර ප්‍රසිද්ධ වූ ඇලක්සැන්ඩර්ගේ ප්‍රබන්ධ කථාවෙන් උපුටා ගත් එකක් විය හැකි." යයි ඔහු තව දුරටත් සඳහන් කරයි.

එහෙත්, "ක්‍රිස්තියානි පරිසරයේ ඉස්ලාමයේ මූලාරම්භය" යන මාතෘකාව යටතේ 1925 වසරේ එඩින්බරෝ විශ්ව විද්‍යාලයේ කළ දේශනයේ රචඩ් බෙල් නම් විද්වතෙක් පැවසුවේ මෙලෙසිනි.

“ජේසු තුමාගේ චිත්‍රයක් කඅබා කුලුනක එල්ලා තිහුණු බවට කට කථා තිබුණද, හිජාස් පළාතෙහි හෝ මක්කා සහ මදීනා අවට පරිසරයේ පවා ක්‍රිස්තු බැතිමතුන් ජීවත් වූ බව හෝ ක්‍රිස්තු දේවස්ථානයක් තිබුණු බවට හෝ පිළි ගත හැකි සාක්ෂි කිසිවක් නැත.”

“බයිබල් වාක්‍ය හා සමානකම් පෙන්වන වාක්‍ය ශුද්ධ වූ කුර්ආයේ දැක ගත හැකි වූ වද ඒවා බය්බලයෙන් උපුටා ගත් බව නිගමනය කළ නොහැක.” යනු හිට්ටිගේ තර්කය වේ. එවැනි සමාන අර්ථ සහිත වැකි සූරා 21-104 හා එසායා සමඟද, සූරා 53 – 39 සිට 42 දක්වා වැකි එසෙකියල් 18 -20 සමඟද, සූරා 53 – 45 වැකිය සමුවේල් 2 – 6 සමගද සසඳමින් ඔහු පෙන්වයි. සූරා ෆාතිහා වෙහි “අපට ඍජු මාර්ගය පෙන්වා දෙනු මැනව.“ යනුවෙන් සඳහන් පස් වන වාක්‍ය ගීතාවලිය 27-1 සඳහන් “ස්වාමිනි මා විනිශ්චය කරනු මැනවි.“ යන වාක්‍ය හා සමානකම් දක්වන නමුත්, එය ඍජුව උපුටා ගැනීමක් නොව ඒ හා අදාළ හේතු සාධක පෙන්විය හැකියැ“ යි ඔහු පවසයි. ෆිලිප් හිට්ටිගේ අවසාන නිගමනය වුයේ, “බයිබලයේ වචන ගිරවෙක් මෙන් අනුකරණය නොකළ මුහම්මද් (සල්) තුමා එම තොරතුරු ඉස්ලාමීය මෙන්ම අරාබි බසින් දිව්‍යමය ජාත්‍යාලය බවට පත් කර ඇත.“ බවයි.

“ඉස්ලාමය ගැන හැඳින් වීමක්” නම් කෘතියේ ශුද්ධ වූ කුර්ආනයේ මූලාශ්‍රය යන මාතෘකාව යටතේ, ක්‍රිස්ට් විල්සන් මෙසේ දන්වයි. “ශුද්ධ වූ කුර්ආනයේ පවසන කථා බයිබලයේ පැරණි හෝ අලුත් ගිවිසුමට නොව බයිබලයට පෙර වූ යුදෙව්වරුන්ගේ තල්මූද් සහ පසු කලක බයිබලයට එකතු

කරන ලද පොත් වලින් උපුටා ගෙන තිබෙන බව පඬිවරු අදහස් දක්වති.“ හාමාන් සහ මර්යම් තුමිය පිළිබඳව ද අවුලක් තිබෙන බවට විල්සන් ද සඳහන් කරයි.

“ක්‍රිස්තියානි පරිසරයේ ඉස්ලාමයේ මූලාරම්භය“ නම් කෘතියේ “ශුද්ධ වූ කුර්ආනයේ බොහෝ කොටස් බයිබලය හා සම්බන්ධ කථාවන් සමඟ සෘජුව රැඳී පවතින බවට රිචඩ් බෙල් තර්ක කරයි. එපමණක් නොව බයිබලය පිළිබඳව නබි (සල්) තුමාගේ දැනුම ටිකින් ටික වැඩි වී, බයිබලයේ තිබෙන කරුණු ගැනද යුදෙව්වන් සහ ක්‍රිස්තු බැතිමතුන්ගේ විශ්වාසය පිළිබඳවද ක්‍රමානු කූලව අධ්‍යයනය කිරිමේ ක්‍රියාව කුර්ආනයට සහ මුහම්මද් (සල්) තුමාගේ ව්‍යාපාරයට තුඩු දුන් කරුණක් වී ඇත. දැනුවත්වම බයිබලයෙන් කරුණු උපුටා ගෙන තිබීම අපි දකින්නෙමු. ඒ ගැන ඔහු අවංක විය.” යනුවෙන් බෙල් ඔහුගේ අදහස් ඉදිරිපත් කරයි.

මෙහිලා හාස්‍ය ජනක කරුණක් නම්, ගල් ලෙනේ පිරිස, මෝසස් සහ අල් කිද්ර්ගේ සිද්ධිය සහ දුල් කර්නෙයින් වැනි තොරතුරු කිසිවක් බයිබලයේ කොහෙත්ම සඳහන් වී නොතිබීමයි. එහෙත්, මුහම්මද් (සල්) තුමාණෝ බයිබලය පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිව කට කථා පදනම් කර ගෙන අල් කුර්ආය රචනය කළ බව බෙල් තර්ක කරයි. ජේසුස් වහන්සේගේ මව මරියම් හා මෝසස් තුමාගේ සොහොරය වන මරියම් අතර නබි (සල්) තුමා අවුල් කර ගත් බව බෙල් තව දුරටත් පවසයි.

“මිනරතයේ ඇරයුම” නම් කෘතියේ කෙනත් ක්‍රේග් නම් විද්වතාණන් “බයිබලයේ කථා අල් කුර්ආනයේ යළි සටහන් වී

ඇත්තේ බෙහෙවින්ම වෙනස් වූ ස්වරූපයෙන් වන අතර, ඒවා සෘජුව ලබා ගත් දැනුමක් නොව, කට කථාවෙන් ලබා ගත් දැනුමකි.'' යයි තර්ක කරයි. බයිබලයේ නව හා පැරණි ගිවිසුම් දෙකෙන් සෘජුවම උපුටා ගත් බවට පෙන්විය හැකි කිසිඳු වාක්‍යයක් ශුද්ධ වූ කුර්ආනයේ දක්නට නැති බව ඔහු අවසනයේ පිළගනී.

ත්‍රිත්වය සහ ජේසුස් තුමා පිළිබඳව ශුද්ධ වූ කුර්ආනයේ තිබෙන වැරදි අදහස් දෙස බැලිමේදී ඒවා මුහම්මද් (සල්) තුමාණන්ට වාචිකව ඉගැන් වූ පිරිසගේ පදවිය සහ තරාතිරම පෙන්නුම් කරන අතර, ඔවුන්ගෙන් පුළුල් හා වැදගත් විස්තර දැන ගන්නට නොහැකි වූයෙන් ක්‍රිස්තියානි ආගම ගැන නිවැරදි අවබෝධයක් ලබා ගන්නට එතුමාට නොහැකි වූ බව කෙනෙත් ක්‍රේග් තරයේ විශ්වාස කරයි.

ශුද්ධ වූ කුර්ආනයේ මූලාශ්‍රය පිළිබඳව ''මුහම්මදනිස්ම් පිළිබඳ ඓතිහාසික සමීක්ෂණයක්'' නම් කෘතියේ, ගිබ්ස් තවත් අදහසක් ඉදිරිපත් කරයි. ''මක්කාව හා යෙමන් අතර පැවති වාණිජ සම්බන්ධකම ගැන සලකා බලන විට, කුළු බඩු සහ වියන ලද භාණ්ඩ ප්‍රවාහනය කළ තවලම සමඟ, ඇතැම් ආගමික අදහස් ද ගෙන ඒමක් සිදු වී ඇති බව සිතා ගත හැකිය. මෙම මතයට තුඩු දෙන වචන මාලාවක් ශුද්ධ වූ කුර්ආනයෙ තිබේ.'' යනු ඔහු පවසයි.

ලින්ඩන් හැරිස් නම් තවත් විද්වතෙක්, ''පෙරදිග අප්‍රිකාවේ ඉස්ලාමය'' නම් කෘතියේ, ''මුහම්මද් (සල්) තුමාණෝ බයිබලයෙන් කරුණු උපුටා ගෙන ඇති අතර අද මුස්ලිම්වරු දැනුවත්ව හෝ නොදැනුවත්ව අල් කුර්ආනයේ පිහිටක්

නොලැබෙන විෂයයන්හී ක්‍රිස්තියානි දහමෙන් බොහෝ දේ උපුටා ගනිති.'' යනුවෙන් පවසයි.

හනීෆ්වරුන් නම් සන්‍යාසිවරුන්, යුදෙව් සහ ක්‍රිස්තියානි යන පිරිසගෙන් ශුද්ධ වූ කුර්ආනයේ මූලාශ්‍රය සොයා ගත හැකි බව නිකල්සන් නැමැත්තා ප්‍රකාශ කරයි. ''ක්‍රිස්තියානි තාපසකයන්, පිළිම වන්දනාව ප්‍රතික්ෂේප කළ සන්‍යාසිවරුන් සහ ඒක දේව වන්දනිකයන් වන හනීෆ්වරුන් ලෙස හැඳින් වන සුළු පිරිසක් ගැන අපි අසා ඇත්තෙමු. නබිත්වයේ ඇරයුමට පෙර මුහම්මද් (සල්) තුමා එවැනි සමහරෙකු සමඟ සම්බන්ධකම් පැවැත් විය. මක්කාවේ වාණිජ තවලම සමඟ ඔහු ගිය ගමනේදී යුදෙව් සහ ක්‍රිස්තියානි පිරිස සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලැබුණු අතර, ඒවායේ ප්‍රතිඵලය අල් කුර්ආනයේ දක්නට තිබේ.'' යනු ඔහුගේ අදහස වේ.

නිකල්සන් තව දුරටත් මෙසේ පවසයි. ''මෙවැනි කථාවන්ට සවන්දී මනා දැනුමක් ලබා ගත් මුහම්මද් (සල්) තුමා බයිබලයට පසු කාලයේදී එකතු කළ පොත් වල තිබෙන පුරාණ කථා වලින් විස්තර ලබා ගෙන තමන්ගේ බව බොරුවට ඉදිරි පත් කර ඇත.''

යුදෙව් හා ක්‍රිස්තියානි ආභාසය පිළිබඳව නව කතෝලික විශ්ව කෝෂය මෙසේ පවසයි. ''යුදෙව් හා ක්‍රිස්තියානි ආභාසයට මුහම්මද් (සල්) තුමා බොහෝ සේ ලක් වූ බව මුස්ලිම් නොවන විද්වතුන් නිතර පැවසූහ. මෙම ආභාසය මුහම්මද් (සල්) තුමාගේ ස්වභාවය නිසා වෙනත් හැඩයක් ගනු ලැබුණි. ඉස්ලාමයට පෙර වූ අරාබි සමාජයේ මානසික අවශ්‍යතාවයට

ගැලපෙන අයුරින් පිළිතුරු දුන්නේ ඒ ආදාරයට යයි.“ ඔවුන් තව දුරටත් පවසති.

යුදෙව් හා ක්‍රිස්තියානි ග්‍රන්ථ වල අරාබි අනුවාදයයට මුහම්මද් (සල්) තුමාණෝ සවන් දුන් බව සිතා ගත හැකි බව එහි තව දුරටත් සඳහන් වේ.

ශුද්ධ වූ කුර්ආනය දෙවියන් වහන්සේගෙන් හෙළිදරව්වන බව මුහම්මද් (සල්) තුමාණෝ දැන දැනම බොරු ගෙතූ වේයයි චෝදනා නගන අනිකුත් සිද්ධාන්ත මෙන් එම සිද්ධාන්තයද සාවද්‍ය කථාවකි. මෙම සියලු තර්කයන්හී දුබල තාවය ඉහතදී පෙන්වා දෙන ලදී. මුහම්මද් (සල්) තුමාණෝ නූගත් කෙනෙකි යන සත්‍ය පුවත මෙහිලා පැන නගින තවත් ප්‍රශ්නයකි. මුහම්මද් (සල්) තුමාණෝ අකුරු දන්නා කෙනෙක් වූයේ නම්, එතුමාගේ විවේචකයින් බොහෝ දෙනෙක්, ශුද්ධ වූ කුර්ආනය පවසන පරිදි එතුමාගේ කථාවේ සැබෑකම ගැන සැක සතන්නෝය. *“මෙය (අල් කුර්ආය)ට පෙර ඔබ කිසිම පුස්තකයක් නොහැදැරූ වේය. තවද ඔබ, ඔබගේ දකුණතින් එය නොලීවේය. එසේ වී නම්, විශ්වාස නොකරන අය අනුමාන කරන්නෝමය.“* 29 -28. මුහම්මද් (සල්) තුමාණෝ නූගත් කෙනෙක් වූ හෙයින් හනීෆ්වරු, යුදෙව් සහ ක්‍රිස්තු බැතිමතුන් ගෙන් සියලු විස්තර ලබා ගෙන, ඒවා අල් කුර්ආනයේ උසස් අරාබි භාෂාවෙන්, වසර විසි තුනක් මුළුල්ලේම වාචිකව පාරායනය කළේ කෙසේ දැයි සිතීම පවා අපහසුය. තෙවනුව, නබි (සල්) තුමාණෝ හැදී වැඩුණේ පිළිම වන්දනා පැතිරී තිබුණු පරිසරයක වූවද, ශුද්ධ වූ කුර්ආනය ස්ථිරව උගන්වන්නේ ඒක දේව වන්දනා පිළිවෙතයි.

හනීෆ් ලෙස හැඳින්වන, විග්‍රහ මතවාදීන් නොවන සුළු පිරිසක් මක්කාවේ එවකට ජීවත් වූ අතර, මේ අය පිළිම වන්දනා කිසිවකට සහභාගී නොවූහ. එහෙත් ඒ අයට ආගමික ග්‍රන්ථයක් හෝ නැමදුම් ස්ථානයක් හෝ නොතිබුණි. ඔවුන්ගේ විශ්වාසය කුමක් දැයි සටහනක් පවා නොතිබුණි. මේ අයුරින් ක්‍රිස්තු බැතිමතුන් ගෙන් මුහම්මද් (සල්) තුමාණෝ ශුද්ධ වූ කර්ආනය ඉගෙන ගන්නා බවට චෝදනා නගන්නට කිසි විටක නොසිතූ එතුමාගේ සමකාලීන විරුද්ධ වාදීන්, මක්කාවේ අවට ප්‍රදේශයේ ජීවත් වූ රෝමානු යකඩ කම්මල්කරුවෙකු ගෙන් එතුමා ඉගෙන ගන්නා බව චෝදනා කළෝය. මෙම චෝදනාව එක හෙළාම ඉවත දෙමු අල් කුර්ආනය. එම මිනිසා විදේෂ භාෂාවක් කථා කරන අතර, පිවිතුරු අරාබි බසින් අල් කුර්ආනය හෙළිදරව් වන බව පෙන්වයි.

*"ඔහුට උගන්වන්නේ මිනිසෙක්ම යයි ඔවුන් කියති යි අප දනිමු. ඔවුන් අකාරුණිකව අදහස් කරන අයගේ බස පරදේශීය. මේ පිරිසිදු හා පැහැදිලි අරාබි බසය."* අල් කුර්ආන් 16-103.

පැරණි ආගමික ග්‍රන්ථයන්ගෙන් උපුටා ගත් බව චෝදනා නගන විද්වතුන් පහත සඳහන් කුර්ආන් වැකියට සිදුසු පිළිතුරු දීමට නොහැකි වන බව නම් නිසැකයි.

*"සැබැවින්ම අපය සිහිපත් කිරීම (ශුද්ධ වූ කුර්ආනය) පහළ කළෙ. සැබැවින්ම අපමය එය ආරක්ෂා කරන්නෝ." 15-9*

පැරණි ග්‍රන්ථයෙන් අල් කුර්ආනය උපුටා ගත්තේ නම්, මෙම වාක්‍ය අදාල වන්නේ කිනම් පිරිසටද? යුදෙව් හෝ ක්‍රිස්තු

බැතිමතුන් අල් කුර්ආනයට රැකවරණය සපයන බව මෙහි අර්ථය වන්නේද?

දිනක් මක්කාවේ කාෆිර්වරු, එම කම්මල්කරුවාට පහර දී ඔහු ගෙන් ප්‍රශ්න කළ විට “මම එතුමාණන්ට කිසිවක් කියා නොදෙමි. ඇත්ත වශයෙන්ම මට ආගම උගන්වන්නේ එතුමාණන්ය.“ යනුවෙන් ඔහු විලාප දෙමින් පිළිතුරු දුන් බව ඉතිහාසය පවසයි.

යුදෙව් සහ ක්‍රිස්තු බැතිමතුන් සමඟ මුහම්මද් (සල්) තුමාණන් මක්කාවේ පැවත් වූ සම්බන්ධකම් ඉතාමත් සීමිතයි. නබි (සල්) තුමාගේ බිරිය වන කදීජා(රළි) තුමියගේ ඥාතියෙකු වූ වරකා (Waraqa) ඉබ්න් නව්ෆල්, එතුමා දෙවරක් මුණ ගැසී ඇත. අරාබි ජාතියෙකු වන වරකා ක්‍රිස්තු භක්තියෙකු වූ අතර බයිබලයේ අළුත් ගිවිසුම ගැන සුළු වශයෙන් හෝ දැන සිටියේය. කඅබාව වටේ තවාෆ් කරමින් සිටි වරකා, මුහම්මද් (සල්) තුමාණන් ප්‍රථම වරට දුටු විට, එතුමාගේ හිස සෙනෙහසින් සිප ගත්තේය. දෙවන හමුවීම සිදු වූයේ මුහම්මද් (සල්) තුමාණන්ට ප්‍රථම දේව හෙළිදරව්ව පහළ වී, එතුමා මහත් අසහනයට පත්ව සිටි අවස්ථාවේදීය. එම සිද්ධියෙන් පසු වසර තුනකින් වරකා මිය ගිය අතර, දේව නියෝග දිගින් දිගට වසර විසි තුනක් මුළුල්ලේම මක්කා සහ මදීනාවේදී පහළ වී ඇත. යෙමන් රටේ, නජ්රාන් පළාතේ ක්‍රිස්තියානි බැතිමතුන් ජීවත් වූ අතර, උතුරේ යත්රිබ් නුවර (වර්තමාන මදීනාවේ) යුදෙව් ජාතීන් විසූහ. නබිත්වය ලබන්නට පෙර හෝ පසුව මුහම්මද් (සල්) තුමාණෝ නජ්රාන් පළාතට ගමන් කළ බවට කිසිදු සටහනක් නැත. වයස අවුරුදු හයේ, පියාගේ සොහොන සහ ඥාතීන් වන බනු

නජ්ජාර් බැහැ දැකීමට එතුමා සිය මව සමඟ, එහි ගිය අතර ආපසු එන ගමනේ මවද මිය ගියාය. වයස හයේදී පමණ ගිය මේ ගමනේදී, දින දෙකක් හෝ තුනක කෙටි කාලය තුළ, බයිබලයේ පොත් 66 හෝ 75ක් මුහම්මද් (සල්) තුමා මුළු මතින්ම හැදෑරූ බව පැවසීම වනාහි මහත් විහිළුවකි. තවද මක්කාව සහ මදීනාව අතර අත්තේ කිලෝ මීටර් පන් සීයක් පමණ දුරකි. ගුවන් යාන හෝ මෝටර් රථ වාහන කිසිවක් නොමැති එම යුගයේ ඔටුවා පිට පමණක් ගිය හැකි එම ගමනට සති කිහිපයක් පමණ ගත වේ. කිසිවෙකුගේ හෝ ඇසට නොපෙනී එම නගර දෙක අතර මුහම්මද් (සල්) තුමාණෝ ගමන් කළ බව කිසිවෙකුට හෝ කිව නොහැකිය. එබඳු දුරක් ඇති පළාතේ පැරණි ග්‍රන්ථයන්ට අයත් සමාජයක් ජීවත් වූවද, ඔවුන් ගෙන් ශුද්ධ වූ කුර්ආනයට මූලාශ්‍රය විය හැකි කරුණු නොතිබුනු බව පෙන්නුම් කරයි.

මුහම්මද් (සල්) තුමාණෝ යුදෙව් සහ ක්‍රිස්තු බැතිමතුන් සමඟ සාකච්ඡාවේ යෙදුනු බව පවසන සමහර විද්වතුන්, එම සාකච්ඡාවේ ප්‍රතිඵලයක් වශයෙන් අල් කුර්ආනය නිර්මාණය කරනු ලැබූ බව අදහසක් ඉදිරිපත් කරන්නට වෑයම් කරන නමුත්, සාකච්ඡා පැවතුනේ කුමන කාලයේද යනු කිසිවෙක් සඳහන් නොකරති. එවැනි සාකච්ඡා කිහිපයක් පැවැතුනු නමුත්, ඒවා සිදු වූයේ ශුද්ධ වූ කුර්ආනය හෙළිදරව් වන්නට පටන් ගෙන දීර්ඝ කාලයකට පසුවයි. ඇත්ත වශයෙන්ම සියලු සාකච්ඡා මදීනා නුවරේදී සිදු වූ අතර, දේව හෙළිදරව්ව මක්කා වේදී ආරම්භ වී වසර දහ තුනක කාලය තුළ ශුද්ධ වූ කුර්ආනයෙහි 65% පමණ ප්‍රමාණයක් පහළ වූ පසු, එතුමා

මදීනාවට දේශාන්තර කිරීම සිදු වී ඇත. මෙම සාකච්ඡාවේ සැබෑ තතු අල් කුර්ආනය සඳහන් කරයි. එනම්, හිජ්රි 9 වන වසරේ මදීනා වේදී පහළ වූ 3 වන සූරාවේ අංක 33 සිට 63 දක්වා ඇති වැකි යන්හී නජ්රාන් පෙදෙසෙන් මදිනාවට පැමිණි ක්‍රිස්තියානි නියෝජිත පිරිස ගැන සඳහන් කිරීම ඊට නිදසනුකි.දෙවනුව, සාකච්ඡා සිදු වූ බව චෝදනා නගන යුරෝපයේ විදවත්හූ, එහි මාතෘකාව කුමක් දැයි කිසිවක් නොකියති. මුහම්මද් (සල්) තුමාණෝ ක්‍රිස්තියානි නියෝජිත පිරිස හමු වූයේ ශිෂ්‍යයෙකු ලෙසින් නොව, ගුරුවරයෙකු වශයෙනි. ක්‍රිස්තු බැතිමතුන්ට, ත්‍රිත්වය පිළිබඳ පවතින මතය නිවැරදි කර, ජේසුස් තුමාගේ සැබෑ දහම උගන්වන්නට එම අවස්ථාව එතුමා උපයෝගී කර ගත්හ. එවැනි සාකච්ඡාවන් හී ප්‍රතිඵලයක් වශයෙන්, ක්‍රිස්තු බැතිමතුන් බොහෝ දෙනෙක් මුස්ලිම් බවට පත් වූ බවද මෙම විද්වත්හූ සඳහන් නොකරති.

නබිත්වය ලබන්නට පෙර මුහම්මද් (සල්) තුමාණෝ තුන් වරක් මක්කාවෙන් බැහැරව ගිය බව ඉතිහාසගත සටහන්වලින් පෙන්වයි. වයස හයේදී සිය මව සමඟ එතුමා මදීනාවට යෑම පළමුවන අවස්ථාවයි.9 හා 12 වයසේ ගොකු පියාණන් අබූ තාලිබ් සමඟ සිරියාවට වෙළඳාමේ යෑම දෙවන අවස්ථාවයි. අවසාන වශයෙන් වයස 25දී කදීජා (රලි) තුමියගේ වෙළඳ භාණ්ඩ රැගෙන තවලම භාරව සිරියාවට ගියා වූ අවස්ථාවයි.

මෙම විෂය පිළිබඳව ආචාර්ය ජමාල් බදවි මෙසේ පවසයි. "විවේකයක් නොමැතිව වෙළඳාමේ නිරත වී සිටිය අතරතුර, යුදෙව් හා ක්‍රිස්තායානි බැතිමතුන් සමඟ විටින් විට කළ අනුශාසනයෙන්, මුහම්මද් (සල්) තුමාණෝ ආගම් දෙක ගැන

බොහෝ දේ හදාරා, ජීවමාන හා ශක්තිමත් නව ආගමක් ඉදිරිපත් කිරීමට සමත් වූ බව යම් කිසිවෙක් පැවසීම වනාහි මනඃකල්පිත කථාවකි. ශත වර්ෂ ගණනාවක් තිස්සේ විද්වතුන් බොහෝ දෙනෙක් රැස් වී වෑයම් කළ ද, එවැනි දෙයක් ඉටු කිරීමට ඔවුන් අපොහොසත් වූ බව සත්‍ය පුවතකි.“

එවැනි සිද්ධාන්ත මුල් කොට ගෙන ප්‍රශ්න රැසක් මතු කරන බවද ආචාර්ය ජමාල් බදවි වැඩිදුරටත් පවසයි. ඒවා පහත ස දහන්වේ.

1. මුහම්මද් (සල්) තුමාණන්ගේ ජීවිතය පිළිබඳ ඓතිහාසික සටහන් විශාල සංඛ්‍යාවක් තිබේ. ඒවාට අමතරව, එතුමා ගැන උද්යෝගිමත් විවේචකයින් වූ බොහෝ දෙනෙක්, එතුමාගේ ජීවිතය ගැන දීර්ඝ වශයෙන් පරීක්ෂණ පැවැත්වූ නමුත්, නබි (සල්) තුමාණන්ට සියලු දේ ඉගැන් වූ අභිරහස් ගුරු වරයා හෝ ගුරු පිරිස සොයා ගැනීමට කිසිවෙකු හෝ අපොහොසත් වූයේ ඇයි?

2. මුහම්මද් (සල්) තුමාණන්ට, සමකාලීන පිරිසක් විසින් විරෝධතාවයේ හේතුවෙන්, උපහාසයට සහ හිංසාවට ලක් කරන ලද බව කවුරුත් පාහේ දනිති. උග්‍ර ලෙස ලුහු බැඳූ ඒ සතුරන්ට, දේව හෙළිදරව්ව ප්‍රෝඩවක් බව සියලු ජනයාට පෙන්වා දීමට නොහැකි වූයේ ඇයි? එතුමාණන් ඉගෙන් වූයේ මිනිසාගෙන් මූලාශ්‍රයක්සේ ලැබූ ග්‍රන්ථයක් බව චෝදනා කළ ඔවුන්, එම මිනිසුන් කවුරුන්දැයි නම් නොකළේ ඇයි? ආරම්භයේදී මෙවැනි චෝදනා එල්ල කළ ඇතැම් අය එය වෙනස්කොට, එතුමා කරන්නේ මායාවක් හෝ ඉන්ද්‍රජාලයක් යැයි චෝදනා නැගුවේ ඇයි?

3. සිය ජනතා අතරෙන්ම හැදී වැඩුනු මුහම්මද් (සල්) තමාණන්ගේ ජීවිත කථාව කාන්තාරයේ ගෝත්‍රික ජීවිතයට එකඟව, විවෘත වූ එකකි. දේව හෙළිදරව්ව පහළවන බව එතුමා පැවසූ විට මෙතරම් විශාල සංඛ්‍යාත සමකාලීන ජනකායක්, විශේෂයෙන් එතුමාගේ ළඟම ඥාතීන් පවා සහමුලින්ම විශ්වාසය කළේ ඇයි? අන් අයගෙන් උපුටා ගත් මතයක්, තමාගේ බව එතුමා පැවසූ බව මොහොතකට හෝ ඔවුන් සැක කළේ නම් එතුමාගේ අනුගාමිකයින් ඉස්ලාමය තුළ දිගින් දිගට රැඳී සිටීම සහ ඔවුන්ගේ සංඛ්‍යාව දිගින් දිගට වැඩිවීමක් සිදුවිය හැකිද?

4. මානව ඉතිහාසය පවා වෙනස් කළා වූ පැහැදිලි හා අංග සම්පූර්ණ ආගමක් මුහම්මද් (සල්) තුමාණන්ට ඉගැන් වූ ගුරුවරයා කිනම් ආකාරයේ කෙනෙක් විය යුතුද? එවැනි ගුරුවරු සිටියේ නම්, තමන් වෙතින් ඉගෙන ගත් ශිෂ්‍යයා සිය ගුරුවරු ගැන කිසිවක් සඳහන් නොකොට, ඔවුන්ට ගෞරවය පවා නොදක්වා, ඒවා දෙවි කෙනෙකු වෙතින් ලබූ දැනුමක් බව පවසනවිට, ඔහු හෝ ඔවුන් තම ගෝලයාට එරෙහිව හඬ නොනැගූ හේතුව කුමක්ද?

5. තම ආගමික ග්‍රන්ථවලින් නබි (සල්) තුමාණෝ කරුණු උපුටා ගැනීමක හෝ පූජක වරුන්ගෙන් ඉගෙන ගැනීමක යෙදී සිටීම දැන සිටියේ නම්, මුහම්මද් (සල්) තුමාණෝ සමඟ කථාවට පැමිණි යුදෙව් සහ ක්‍රිස්තු බැති මතුන් විශාල සංඛ්‍යාවක් එතුමාගේ අවංකභාවය කෙරෙහි වශ්වාසය තබා, මුස්ලිම් බවට වෙනස් වීමට තීරණය කරයිද?

6. ඇතැම් අවස්ථාවන් හී අල් කුර්ආන් වැකි, එතුමා සෙනඟ අතර සිටියදී පහළ වී ඇත. ශුද්ධ වූ කුර්ආනය වසර විසි තුනක කාලයක් මුළුල්ලේ පහළ වූ අතර එම අවස්ථවන් හී පවා කිසිවෙකුගේ හෝ ඇසට නොපෙනී පැමිණ කුර්ආන් වැකි ඉගෙන් වූ මිනිස් ගුරුවරයා සිටියේ කොහේද? ඔහු එතරම් දීර්ඝ කාලයක් සැඟ වී සිටියේ කෙසේද? සිය අනුගාමිකයින් අතරෙහිම, නිතරම සිටි මුහම්මද් (සල්) තුමාණෝ ඔවුන් ගෙන් කිසිවෙකුට නොපෙනෙනසේ, එක් වතාවක් වූවද හසු නොවී වසර විසි තුනක කාලයක් මෙම අභිරහස් ගුරුවරයා වෙතට නිතර පාහේ යත හැකිද?

## 11. පැරණි කථාවන්හී සමාකමේ ප්‍රශ්න

යුදෙව් හා ක්‍රිස්තියානි ආගම්වල බලපෑම් වලට ශුද්ධ වූ කුර්ආනය ලක් වූ බව පෙන්වන්නට වෑයම් කළ සමහර විද්වත් හූ, බයිබලය සහ කුර්ආනය පවසන කථාන්දර අතරෙහි සමානතාවයන් දක්නට ලැබෙන බව පවසති. මුහම්මද් (සල්) තුමාණෝ, පැරණි ග්‍රන්ථ ඕනෑකමින් ඉගෙන ගෙන සිය අදහසට ගැලපෙන කරුණු සියල්ල තෝරා ගැනීමක් හෝ ණයට උපුටා ගැනීමක් හෝ සිදුකර ඇති බවට ඔවුන් අදහස් දක්වති. එම සංකල්පය පහත දැක්වෙන කරුණුවලට අනුව පිළිගැනීමට නොහැකිවන බව සැලකිය යුතුයි.

1. ආරම්භයේ සිට ශුද්ධ වූ කුර්ආනය අල්ලාහ් වෙතින් හෙළිදරව් වන බව මුහම්මද් (සල්) තුමාණෝ පැහැදිලිව ප්‍රකාශ කළහ. මනඃකල්පිත, ඓතිහාසික සහ තර්කානුකූල

හේතුන් මත මුහම්මද් (සල්) තුමාණෝ ශුද්ධ වූ කුර්ආනය රචනය නොකළ බව ඉහත පෙන්වනු ලැබිණි.

2. ඉතාමත් වැදගත් කරුණක් වනුයේ, එතුමා ලියන්නට හෝ කියවන්නට නොදන්නා කෙනෙකු වීමයි. කියවීමේ හෝ ලිවීමේ හැකියාවක් නොමැති කෙනෙකුට පැරණි ග්‍රන්ථ කියවා, ඉන් තමන්ට අවශ්‍ය කොටස් තෝරා ගැනීමට හැකියාවක් තිබිය නොහැක.

3. බයිබලයේ පැරණි ගිවිසුමේ ප්‍රථම අරාබි පරිවර්තනය, මුහම්මද් (සල්) තුමාණන්ගේ අභාවය සිදු වී වසර 200ට පසු සකස් කරනු ලැබූ අතර අළුත් ගිවිසුමේ අරාබි පරිවර්තනය සකස් කරනු ලැබුවේ එතුමාගේ අභාවය සිදුවී වසර 1,000 කට වැඩි කාලයකට පසුවයි.

4. ග්‍රන්ථ දෙකක් අතරෙහි සමරූපතාවයක් තිබීමෙන් පමණක් එකක් අනිත් එකෙන් එනම් පසුව පල වූ පොත පැරණි පොතකින් උපුටා ගත් බවට යෝග්‍ය සාක්ෂියක් වන්නේ නැත. මේ කෘති දෙකටම මූලාශ්‍රයක් වශයෙන් තුන්වන පොදු ස්ථානයක් තිබිය හැකිය. ඇත්ත වශයෙන්ම ශුද්ධ වූ කුර්ආනය ඉදිරි කරන තර්කය මෙයයි. බයිබලයේ සමහර කරුණු අල් කුර්ආනයේ ඒ ආකාරයෙන්ම තිබිය හැකි අතර, දෙකෙහිම මුල් කර්තෘවරයා දෙවියන් වහන්සේ වන නිසා මේ ග්‍රන්ථ දෙකේම සමරූපතාවයක් තිබීමේ හේතුව වටහා ගත හැකිය.

5. කෙසේ වෙතත්, ප්‍රථමයෙන් ග්‍රන්ථ දෙකෙහිම තිබෙන පාඨ ඉතා ප්‍රෙව්සමින් පිරික්සුම් කළේ නම්, ඒවා එකිනෙකකින්

කරුණු උපුටා ගත් බවට නගන චෝදනාවෙහි කිසිදු පදනමක් නොමැති බැව් වටහා ගත හැක. එනිසා මෙම ග්‍රන්ථ අතරෙහි ඇති මූලික වෙනස්කම් ගැන සෙවීම වඩාත් උචිතයි.

බයිබලය වනාහි තනි ග්‍රන්ථයක් නොව, එහි අවම වශයෙන් පොත් 66ක් අඩංගු වන බව ක්‍රිස්තියානු බැතිමතුන් පවසන අතර, කතුවරුන් 40 කෙනෙක් පමණ රචනය කළ පොත් 75ක් ඇතුපත් වෙළුමක් බව රෝමානු කතෝලික ජනතාව පවසති.

දෙවනුව, බයිබලයේ දේව වාක්‍ය සමඟ පසු කාලයේදී මිනිස් වාක්‍යයද මිශ්‍ර වී තිබේ. යෙරෙමියා 8-8, ලූක් 1-1 සිට 4 සහ කොරින්ති 1 පොතේ 7-25 වාක්‍ය මෙයට නිදසුන්ය. අල් කුර්ආනයේ එවැනි අවුලක් නොමැති අතර, මුහම්මද් (සල්) තුමාණෝ කථා කළ වචන කිසිවක් පවා අල් කුර්ආනයේ කොහෙත්ම සඳහන්වී නැත.

තෙවනුව, නව ගිවිසුමේ පොත් තහර, ජේසුස් තුමාගේ ජීවිත කථාව සහ ධර්ම ප්‍රචාරය පිළිබඳව විස්තර කරයි. එහෙත්, අල් කුර්ආනය මුහම්මද් (සල්) තුමාණන්ගේ අනුගාමික පිරිස විසින් ලියන ලද, එතුමාණන්ගේ ජීවිත කථාවක් නොවේ.

සිව්වනුව, බයිබලයේ පොත් කිහිපයක්ම අදාල නබි වරුන්ගේ අභාවයට බොහෝ කලකට පසුව ලියන ලද අතර, එම නබි වරුන්ගේ මව් බසින් ඒවා නොමැතිවීමෙන් සමීක්ෂණයේදී නොයෙකුත් දුෂ්කරතා හටගත්තේය. ශුද්ධ වූ කුර්ආනය මුහම්මද් (සල්) තුමාණන්ගේ ජීවිත කාලය තුළ සම්පූර්ණ වශයෙන් ලියා අවසන් කරනු ලැබූ අතර, එය

හෙළිදරව් වූ භාෂාවෙන්ම දහස් ගණන් අනුගාමිකයන් කට පාඩම් කර ගෙන තිබීමද තහයුරුවේ.

පස්වෙනුව, අද පිළිගත් බයිබලයේ තිබෙන පොත් හතරට අමතරව තවත් පොත් කිහිපයක් එක් කාලයකදී තිබී ැත. ඒවායින් බයිබලයට ඇතුලත් කරන්නේ කුමක්ද? ඉවත දමන්නේ කුමක්ද? යනු තීරණය කරනු ලැබුවේ මිනිසා (රෝම අධිරාජ්‍ය) විසින්ය. එහෙත් හුද්ධ කුර්ආනයේ පරිච්ඡේද පිළිබඳ එවැනි තීරණයක් ගනු පිණිස, කිසිදු ඉස්ලාමිය සම්මන්ත්‍රණයක් කිසිවිටෙක පැවැත් වූයේ නැත.

ශුද්ධ වූ කුර්ආනය බයිබලයේ ඉගෙන්වීම් ණයට ගත් බව නගන චෝදනාවට එරෙහිව මෙම ග්‍රන්ථ දෙකෙහිම තිබෙන මූලික ආගමික ඇදැහිලි ක්‍රමවලින් කරුණු පෙන්වයි. එහිදී සමානකම්, ඉතාමත් සුළු ප්‍රමාණයක් වන අතර, පරස්පර වෙනස්කම් බොහෝමය. ඒවායින් සමහරක් මෙහි පහත සඳහන් කරමු.

දෙවයන් වහන්සේ ගැන ශුද්ධ වූ කුර්ආනය පවසන සංකල්පය, බයිබලයට වඩා හාත්පසින් වෙනස් එකකි. බයිබලයෙන් පෙන්වන දෙවියන් වහන්සේ මිනිසා හා සමානයි. උත්පත්ති 1-26 සහ 9- 6.

*“පවසනු. අල්ලාහු එක්කෙනෙකි. ඔහු ස්වාධීනය. සියල්ල ඔහු කෙරෙහි ආධීනය. ඔහු ජාතක නොකරන්නේය. ඔහුද ජාතක නොකරනු ලබන්නේය. ඔහු හා සමාන කිසිවක් නැත.“* යනුවෙන් ශුද්ධ වූ කුර්ආන් 112 – 1 සිට 4 දක්වා පවසයි.

බයිබලයේ උන්වහන්සේ වෙහෙසට පත්ව, විවේකය සොයයි. උත්පත්ති 2-2 , 2-3 නික්මයාම 20-11. දෙවියන් වහන්සේ උයනේ ඇවිදින බවද, මිනිසා සැඟවී සිටියදී ඔවුන් සොයා ගන්නට දෙවියන් වහන්සේට සිදු වූ බවද බයිබලය පවසයි. උත්පත්ති 3-8 සිට 11 දක්වා බලන්න.

එහෙත් *“අල්ලාහු සර්ව ව්‍යාපකය, සියල්ල දන්නේය.“* යනුවෙන් අල් කුර්ආන් තහවුරු කරයි.

*“ඔහුය අල්ලාහ්. අහස්හීද පොලොවෙහීද ඔහුගේ අභ්‍යන්තර දැයද, බාහිර දැයද ඔහු දන්නේය. එබ සපයා ගත්තා දැයද ඔහු දන්නේය.“* යනු අල් කුර්ආන් ප්‍රකාශ කරයි.

සිය වැරදි තීරණ සමහරක් සඳහා මිනිසා මෙන් දෙවියන් වහන්සේ පසුතැවිලි වූ බව බයිබලයේ සඳහන් වී ඇත. සිය තීරණයේ අයහපත් ප්‍රතිවිපාක ගැන දෙවියන් වහන්සේ නොදන්නා බව හෝ ඔහු අණ ගුණ නැති මනෝභාවය සහිය කෙනෙක් බව මෙයින් පෙන්නුම් කරයි. උත්පත්ති 8 සිට 11 සහ නික්ම යාම 32-14 බලන්න.

එහෙත් අල් කුර්ආනය පවසන්නේ මෙසේය. *“ගුප්ත දැයෙහි යතුරු ඔහුගේ සන්නිධානයෙහිය. ඔහු හැර වෙන කිසිවෙක් එය නොදන්නේය. ගොඩැහිද, සමුද්‍රයෙහිද දැය ඔහු දන්නේය. (ගසකින්) කොළයක්වත්, එය ඔහු දැන මිස නොවැටේ. පොළොව තුළ සහ අඳුරෙහි වූ ඉතා කුඩා බීජයද තෙත් ඇති දැයද, වියලි දැයද පැහැදිලි (සටහන්) පොතෙහි නොලායා නොවේ.“* වාක්‍ය 6-59.

දෙවියන් වහන්සේ ඊර්ෂියා කරන කෙනෙක් වන අතර, ඔහු ඉස්රායීල් වරුන්ගේ දෙවියන් වහන්සේ යයි බයිබලයේ බොහෝ ස්ථානයන්හී සඳහන්වී ඇති නමුත් අල්ලාහ් කුරෙයිෂි වරුන්ගේ දෙවියා හෝ අරාබි වරුන්ගේ දෙයියා හෝ අඩුම වශයෙන් මුස්ලිම් වරුන්ගේ දෙවයන් හෝ යනුවෙන් අල කුර්ආනයේ සඳහන්වී නැත.

*"පැසසුම් සියල්ලම සකල ලෝක සංවර්ධන, සංරක්ෂණ, පරිපෝෂණ, පරිපාලන කරන්නා වූ අල්ලාහුටය."* ශුද්ධ වූ කුර්ආන්. 1 -2

මිනිසා මෙන් දෙවියන් වහන්සේද නාස් පුඩු තිබෙන බවද, මුඛයක් තිබෙන බවද, අන්ධකාරයේ ඔහු වාසය කරන බවද බයිබලය පවසයි. 2 සමුවේල 22-9 සිට 15 දක්වා. 1 රාජවලිය 8-12 සහ අංක 11-25.

"කිසි දැයක් ඔහු බඳු නොවේ. ඔහුය අසන්නේ. දන්නේ." අල් කුර්ආනය 42-11 යන වාක්‍ය ඉස්ලාමයේ ස්ථාවරය පැහැදිලි කරයි.

සමහර අවස්ථාවන්හී යහමඟ සඳහා දෙවියන්ට මිනිසා ගෙන් උපකාර අවශ්‍ය වූ බව නික්මයාම 12-13 වාක්‍ය පවසයි. මිනිසාගේ බලය සහ සමගියට දෙවියා භය වූ බව උත්පත්ති 11-5 සිට 9 දක්වාද, 3-22 සිට 24 දක්වාද සඳහන් කරයි. එහෙත් දෙවියන් වහනසේ ගැන මෙවැනි අවතක්සේරු අදහස් කිසිවක් නොපවසන අල් කුර්ආනය, එවැනි සටහන් අල්ලාහ්ගේ මහිමය කෙලෙසන මහත් පාපයක් වන බව අවවාද කරයි.

නබිත්වය පිළිබඳවද ශුද්ධ වූ කුර්ආනයේ සංකල්පය. බයිබලය දක්වන සංකල්පයට වඩා බොහෝසෙයින් වෙනස් එකකි. නබිවරුන් සියලු දෙනාම බැතිමත්කමින් හා සදාචාර ගුණදහමෙන් උසස් ආදර්ශමත් පුරුෂයන් වන බව ශුද්ධ වූ කුර්ආන්ය පෙන්වා දෙයි. “(රසූල්වරු) ඔවුහු වචනයෙන් (අල්ලාහුට) ඔහුට ඉස්සර නොවෙති. තවද ඔවුහු ඔහුගේ අණ ඉටු කරති.“ 21-27. එහෙත් බයිබලයේ සඳහන් සෑම දිවැසිවරයෙකුම, දේව විශ්වාසයේ හෝ සදාචාරව හැසිරීමෙහිලා මහා පාප ක්‍රියා සිදුකළ බව පෙන්වනු ලබයි. නබිවරුන් සිදු කළ පාප ක්‍රියාවන් බව බයිබලය පෙන්වන සමහර කරුණු දෙස බලමු.

- ආරොන් (හාරූන්) පිළිම වන්දනාවේ යෙදුනේය. නික්මයාම 32- 1 සිට 20.
- සොලොමන් රූප වන්දනාවට සිත යොමු කරයි. රාජවලිය 11-4.
- ජේකබ් (යාකූබ්) තම පියා ඉස්හාක් නබිව මුලා කරන්නට යෙදෙයි. උත්පත්ති 27- 16.
- ඒබ්‍රහාම් (ඉබ්‍රාහිම් නබි) සාරා සමඟ අනියම් විවාහයක් කර ගනී. එසේම එතුමා බොරුකාරයක්වේ. උත්පත්ති 12- 10 සිට 20. 20- 2 සිට 18.
- බීමත් ලූත් නබි සිය දැරියන් සමඟ දූරාචාරයේ යෙදුනු තඅර, තම දැරියන් සමඟ කැමති ආකාරයෙන් හැසිරෙන

ලෙස ගොමරා නගරවාසීන්ට ආරාධනා කළේය. උත්පත්ති 19-30 සිට38 සහ19- 8.

- ඩේවිඩ් නබි (දාවූද් නබි) අන් අය කරන දේ සැඟ වී සිට සිදුරකින් බලා සිටීම පමණක් නොව. යූරියාගේ බිරිය සමඟ දුරාචාර ලෙස හැසිරී ඇගේ සැමියා ඝාතනය කළේය. 2 සැමුවෙල් 11-2 සහ 11-15 සිට 18.

- ජුදාස් සිය පුතාගේ  බිරිය සමඟ දුරාචාරයේ යෙදුනේය. මෙම පාප ක්‍රියාවේ ප්‍රතිඵලයක් වශයෙන් උපත ලැබූ ෆාරේස් සහ සාරා යන දෙදෙනා, ජේසුස් තුමාගේ මුතුන් මිත්තන් ලෙස ගෞරවය දෙනු ලබති. මතෙව් 103 සහ උත්පත්තය 38-16 සිට 18 දක්වා. ජුදාස්ගේ මෙම පාප ක්‍රියා සඳහා දෙවියන් වහන්සේ ඔහුට ආශීර්වාද කළ බව මෙයින් පෙනේ.

  ජේසුස් තුමා පවා සිය මව වන මරියම් තුමියට "ජේසුස් වහන්සේද සිත්‍රිය නුඹෙන් මට කම මොනවද? යනු වෙන් බැන වැදුනේය. ශු.යොහාන් 2-4.

එවැනි පහත් අයුරින් කිසිදු නබිවරයෙකු ගැන ශුද්ධ වූ කුර්ආනයෙ සඳහන් වී නැත.එසේ නම් බයිබලයේ සඳහන් නොවන උසස් අදහස් උපුටා ගෙන ඇති බව නඟන චෝදනාව තර්කානුකූලද.

මරණයෙන් මතු ජීවිතය, ගැලවීම පිළිබඳ සංකල්පය  සහ ජීවිතය කෙරෙහි දක්වන අවධාරණය යන විෂයයන්හී පවා අල් කුර්ආනය දක්වන මතය හාත්පසින් වෙනස්ය.

ආගම හා සම්බන්ධ මතයට අමතරව, ශුද්ධ වූ කුර්ආනව සහ බයිබලය සඳහන් කරන පොදු කථාන්තරයන්හී පවා විශාල වෙනස්කම් ඇති බව සඳහන් කළ යුතුයි. නිදසුනක් වශයෙන් ආදම් සහ ඊවාගේ කථාන්තරය ගැන බලමු. ආදම් සහ ඊවා මිනිස් පරපුරේ ප්‍රථම මැවීම්වේ. ඔවුන් දෙදෙනාම උයනේ ජීවත් වූ අතර, එක් ගසක් හැර අන් සියලු ගස්වලින් පළතුරු කෑමට අනුමැතිය ලබා සිටයහ. සාතාන්ගේ පෙළඹවීමට ලක් වූ දෙදෙනාම තහනම් ගසින් ගෙඩි කෑමෙන් පොළොය මත ජීවත්වීමට එවනු ලැබුහ. ඒ විස්තර ග්‍රන්ථ දෙකෙහිම සඳහන්වේ.

ඒ කරුණු අතරෙහි දැක්වෙන ප්‍රධාන වෙනස්කම් දෙස බලමු.

1. තහනම් කළේ යහපත හා නපුර දැන ගැනීමේ ගස බව බයිබලය පවසයි. (උත්පත්ති 2-16 හා 17) ඒ හේතුවෙන් මුස්ලිම් වරුන්ගෙන් විද්‍යාව පිළිබඳ දැනුම ගන්නේද නොගන්නේද යනුවෙන් ශත වර්ෂ දෙකක්ම යුරෝපය අනවශ්‍ය ලෙස තර්කයේ යෙදුනෝය. හොඳ හා නරක පිළිබඳ දැනුම, මිනිසාට ස්වාභාවිකවම දෙනු ලැබූ අතර සියළු විෂයයන්හී ස්වභාවය ගැන ආදම්ට උගන්වන ලද බව ශුද්ධ වූ කුර්ආන් බවසයි. 2-31 සිට 33 දක්වා.

2. මුල් පාපයේ බර සියලු කාන්තාවන්ට උසුලන්නට සිදුවන අතර, එයට දඬුවම වශයෙන් දරු ප්‍රසූතියේ වේදනාව දෙවියන් වහන්සේ වැඩි කළ බව බයිබලය පවසයි. මුල් පාපයේ ප්‍රධාන වගකීම කාන්තාවන්ට පැවරූ බවට අදහස් දක්වන එක වාක්‍යයක් වුවද ශුද්ධ වූ කුර්ආනය තුළ

නොමැත. තවද ගර්භණී භාවය ඉතාමත් ශ්‍රේෂ්ඨ හා ප්‍රශංසනීය ක්‍රියාවක් වන බව ශුද්ධ වූ කුර්ආනයේ ප්‍රකාශවේ.

3. ඊවා (හව්වා) තුමිය හර්ප වෙස් ගත් සාතාන් විසින් පොළඹවනු ලැබූ බව බයිබලය පවසයි. ආදම් සහ ඊවා දෙදෙනාම සාතාන් විසින් පොළඹවනු ලැබූ බව පවසන අල් කුර්ආනය, සර්පයෙක් ගැන කොහෙත්ම සඳහන් නොකරයි. *"ෂෙයිතාන් ඔවුන් දෙදෙනා එයින් නොමඟට පමුණුවා එවුන් එහි සිටි (සැපවත්) තත්ත්වයෙන් පහ කළේය.*"2- 36.

4. අකීකරු වූ පසු ආදම් සහ ඊවා ළත වූ බව බයිබලය කිසි තැනක සඳහන් නොකරන නමුත්, ඔවුන් දෙදෙනා බොහෝ සේ පසුතැවිලි වූ බවද අනතුරුව අල්ලාහ් ඔවුන්ට සමාව දුන් බවද අල් කුර්ආනය ප්‍රකාශ කරයි. *"ආදම් ඔහුගේ පරමාධිපතිගෙන් වචන ස්වල්පයක් ඉගෙන ගත්තේය. එවිට ඔහු (අල්ලාහ්) ඔහුට සමාව දුන්නේය. ඇත්තෙන්ම ඔහු සමාව දෙන්නේය, දයාළුය.*"2-37. තවද " *අපගේ පරමාධියාණනි. අපි අපටම වරද කර ගතිමු. ඔබ අපට ක්ෂමා කර අපට දයාළු නොවුවහොත්, ඇත්තෙන්ම අපි පාඩු වූවන් ගෙන් වන්නෙමුමයි දෙදෙනා කීවෝය.*"7-23. *(රබ්බනා ළළම්නා අන්ෆුසනා, ව ඉන්ලම් තග්ෆිර්ලනා ව තර්හම්නා ලන කූනන්න මිනල් හාඃසිරීන්.)*

පොළොව මතට එවනු ලැබීම දෙදෙනාට පනවන ලද දඬුවමක්සේ බයිබලය පවසන නමුත්, ඔවුන් දෙදෙනාගේ මැවීම් සිදුවීමටත් පෙර එසේ යැවීමට අල්ලාහ්ගේ

සැලැස්මක් තිබුනු බව අල් කුර්ආනය පෙන්වයි. අල්ලාහ්ගේ දැනුමෙන් තොරව කිසිවක් සිදු නොවේ.

ඉහත සඳහන් කරුණු අනුව ආගමේ මූලික පදනම් කෙරෙහි පවතින වැදගත් වෙනස්කම් කිහිපයක් පෙන්නුම් කරයි දැනුම යන ගසෙන් තහනම් ගෙඩිය කෑමට පෙර මිනිසා අංග සම්පූර්ණ කෙනෙක් වූ නමුත් කෑමෙන් පසුව ඔහුගේ ස්වභාවය වෙනස් වූ බව බයිබලය පවසයි. පසින් නිර්මාණය වී, ආත්මය දෙනු ලැබූ මිනිසා නිතර අසම්පූර්ණ බව අල් කුර්ආනයේ නිගමනයයි.

ගැලවීම් ලබා ස්වර්ගයට පිවිසීමට, මුල් අවදියේ සිටි පරිපූර්ණභාවය නැවත ලබා ගැනීම ක්‍රිස්තු බැතිමතෙකුගේ ප්‍රධාන ප්‍රශ්වයවේ. සුළු අඩුපාඩුකම සිදු වූවද අල්ලාහ් විසින් පනවන ලද නියෝග පිළිපදින්නට මිනිසා අවංකව මහන්සි වන්නේද යක ප්‍රශ්නය ශුද්ධ වූ කුර්ආනය ඉදිරිපත් කරයි. සියලු දරුවෙක්ම උසුලන ජන්ම පාපය වැදගත් බව ග්‍රිස්තු බිතිමතුන් සැලකුවද, ඉපදින සෑම දරුවෙක්ම පිරිසිදු බවද, සෑම කෙනෙක්ම තම තමන්ගේ ක්‍රියාවට වගකිව යුතු බවද අල් කුර්ආනය ප්‍රකාශ කරයි. ජන්ම පාපය සඳහා ලේ සැලීමෙන් මිනිසා සහ දෙවියා අතර සමතයක් සිදුවිය යුතුයයි පවසන මතයට සමාව දිමට දෙවියන් වහන්සේට ලේ වැගිරීම අනවශ්‍ය බව ශුද්ධ වූ කුර්ආනය සහනයක් දෙයි. පිරිමින්ට සුදු වූ විනාශයට කාන්තාවන් වගකිව යුතුයයි පැවසීම, සමාජයේ කාන්තාවන් දරණ වැදගත් ස්ථානය හා තත්ත්වයට කරන නින්දාවක් යයි ඉස්ලාම් පවසයි.

ඒබ්‍රහාම්, ඉස්මායිල්, ඉස්හාක්, ලූත්, මූසා සහ ඊසා (අලෙයි) යන නබි වරුන්ගේ කතාවන්හීද ග්‍රන්ථ දෙක අතර විශාල

වෙනස්කම් තිබේ. මේවා පරීක්ෂා කරන ඕනෑම කෙනෙකුට ශුද්ධ වූ කුර්ආනය වංක ලෙස බයිබලයෙන් උපුටා ගත් බව නගන චොදනාව පදනම් විරහිත බව පැහැදිලිව ම පෙනේ. මෙවැනි ආකල්පය ඉදිරිපත් කරන පිලිප් හිට්ටි වැනි විද්වතුන් පවා "බයිබලයෙන් ණයට ගත් බව හෝ උපුටා ගත් හෝ, ඔහු (නබිවරයා) අන්ධව අනුගමනය නොකරන්නෙක් බව බාහිරව පෙනෙන සමානතාවයන් නිගමනය කළ නොහැක." යනුවෙන් පවසයි. එනම් මුහම්මද් (සල්) තුමාණෝ බයිබලය සම්පූර්ණව අධ්‍යනය කර, එය අධික ලෙස සංස්කරණය කර, සිය වාක්‍ය යොදා මක්කා ජනතාවට යළි පාරායන කළ බව හඟවින්නවට ඔහු වෑයම් කරයි. මුහම්මද් (සල්) තුමාණෝ බයිබලය මත රැඳී සිටිය බව පෙන්වීමට මහත් මහන්සි දැරූ රිචඩ් බෙල්, "එතුමා හා බයිබලය අතර සැබෑ සම්බන්ධතාවයක් නොතිබුණු" බව පිළි ගනී. මුහම්මද් (සල්) තුමාණෝ සහ පැරණි ආගම් දෙකට අයත් ග්‍රන්ථ අතර පෞද්ගලික සම්බන්ධකමක් නොමැති බව අවසානයේ පිළිගනී. කෙනත් ක්‍රේග් පරණි හා අළුත් ගිවිසුමෙන් කෙලෙන්ම උපුටා ගත බව සඳහන් කළ හැකි එක වාක්‍යයක් වුවද ශුද්ධ වූ කුර්ආනයේ  නොමැති බව අවසානයේදී ප්‍රකාශ කරයි.

බයිබලයේ නොමැති අමතර හා නව තොරතුරු අල් කුර්ආනයේ සඳහන් වන හෙයින්, වංක ලෙස බයිබලයෙන් උපුටා ගත් බවට නගන චෝදනාව අසත්‍ය බව තම දුරටත් තහවුරු කෙරේ. ආද් සහ සමූද් ජනතාව වෙතට පැමිණි හූද් සහ සාලිහ් යන නබිවරුන් ගැන ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වන නමුත්, එම නබිවරුන් ගැන කිසිදු විස්තරයක් බයිබලයේ

නොමැත. ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් පහත දැක්වෙන සමහර කරුණු හා සමාන කිසිදු තොරතුරක් බයිබලයේ නොමැත. ඒවා නම්, මහා ජල ගැල්මට පෙර නූහ් නබි සිය පුත්‍රයා සමඟ කළ සාකච්ඡාව, ඉබ්‍රාහිම් නබි සිය පියාණන් සමඟ කළ සාකච්ඡාව සහ එතුමා නම්රූද් නම් දුෂ්ට පාලකයා හා කළ සාකච්ඡාව, ඉබ්‍රාහීම් නබිතුමා විශ්මය ජනක ලෙස ගින්නෙන් ආරක්ෂා සහිතව ඉවත් වීම, මැරුණු කුරුල්ලන් බලි පණ ගන්වා පුනර් ජීවනයක් ලබා දෙන ආකාරය අල්ලාහ් ඔහුට පෙන්වීම, මොසස් නබිතුමා එළදෙනෙක් මරා ඒ මාර්ගයෙන් ඝාතනයට පත් වූ මිනිසෙක් යලි පන ගෙන්වා ඔහු තමා ඝාතනය කළ තැනැත්තා ගැන විස්තර සැපයීම යනාදිය එයින් කිහිපයකි. එ පමණක් නොව තොටිල්ලේ සිටි ළදුරු ජේසු නබිවරයා විශ්මය ජනක ලෙස කථා කළ සිද්ධිය. එතුමා මැටියෙන් කුරුල්ලන් සාදා එය ඉගිලී යෑමට සැලැස්වීම, මරියම් තුමියට අල්ලාහ් ගෙන් ලැබූ ආහාර පානදි ජේසු තුමාණන් හා සම්බන්ධ විස්තර කිසිවක් බයිබලයේ දක්නට නැත.

ශුද්ධ වූ කුර්ආනය රචනය කිරීමට ප්‍රධාන වශයෙන් යුදෙම් හා ක්‍රිස්තියානි පැරණි කථාවන්හී ආධාර පැතුවේ නම්, බයිබලයේ කොහෙත්ම දක්නට නොමැති තොරතුරු රැසක් මුහම්මද් (සල්) තුමාණෝ ලබා ගත්තේ කොහෙන්ද? "නබි (සල්) තුමාණන්ගේ කාලයේදී හිජාස් පළාතෙහි ක්‍රිස්තියානි ඉගැන්වීම් කිසිසේත් ගැවී පවා නැත. එහෙයින් ක්‍රිස්තියානි දේවස්තාන සංවිධානයක් එහි දක්නට නොමැති අතර, එසේ කිබිය හැකියයි බලා පොරොත්තු විය නොහැක." යනුවෙන් නිව් කැතලික් එන්සයික්ලෝපිඩියාව "අරාබියේ ක්‍රිස්තියානි

ආගම" යන මාතෘකාව යටතේ ප්‍රකාශ කරයි. 1වන වෙළුම පිටු අංක 721 හා 722.

ගැමි ජනකථාවන් තුළින් මුහම්මද් (සල්) තුමාණෝ තොරතුරු රැස්කර ගත් බව සමහර විද්වතුන් අදහස් වශයෙන් දක්වති. ඔවුන් නිදසුනක් වශයෙන් සඳහන් කරන්නේ, ආරොන්ගේ සොයුරිය වන මරියම් හා ජේසු තුමාගේ මව වන මරියම් සම්බන්ධයෙන් නබි (සල්) තුමාණෝ අවුල් කර ගත් බවයි. එයට පදනම් වී ඇත්තේ,ජේසු තුමාගේ මව මරියම් තුමියට අල් කුර්ආනය අමතන මෙම වාක්‍ය වේ. "අහෝ හාරූන්ගේ සොහොයුරිය, ඔබේ පියා දුෂට මිනිසෙක් නු වූයේය. තවද ඔබේ මවද ව්‍යාභාචාරිණියක් නු වූවාය." අල් කුර්ආන් 19-28.

අරාබි භාෂාවේ වාක්‍ය සම්ප්‍රදාය සහ පද සංයෝගය පිළිබඳ අවබෝධතා නොමැතිකමින් මෙම තර්කය ඉදිරිපත් වූ බව සැලකේ. අඛූන් සහ උඛ්තුන් යන අරාබි පදවලට අර්ථ දෙකක් තිබේ. ලේ නෑකමින් පැමිණි සොයුරා සහ සොයුරියක් පමණක් නොව, ගෝත්‍රෙය් හෝ ආගමික විශ්වාස මත ගොඩනැගුනු සහෝදරත්වයද මෙහි අඩංගුය. ඉහත සඳහන් වාක්‍ය යෙහි උඛ්තුන් ලෙස සඳහන් කරන්නේ එවැනි සහෝදරත්වය ගැනයි. ශුද්ධ වූ කුර්ආනය මෙවැනි වාක්‍ය සම්ප්‍රදාය වෙනත් කිහිප තැන්හී භාවිතා කරන බව මෙහි පෙන්වා දිය යුතුයි. අල් කුර්ආන් 11-78 වාක්‍ය යෙහි ලූත් නබිවරයා, සිය සමාජයේ සිටින සියලුම තරුණියන්ට 'මගේ දූවරු' ලෙස අමතයි. 7-65, 73 සහ 85 වාක්‍ය යන්හී හූද්, සාලිහ් සහ ෂුඅයිබ් යන නබිවරුන් තම ජනතාවගේ සහෝදරයෝ ලෙස ශුද්ධ වූ කුර්ආනය සඳහන්

කරයි. ලූත් නබිතුමාගේ ජනතාව එතුමාගේ සොයුරන් ලෙස සඳහන් කරයි. 11-78 වාක්‍ය යෙහි සඳහන් 'බනාති' එනම් දූවරු යන වචනය හැර අන් සියුළු තැන් හී 'අහූඃන්' එනම් සොහුරා යන පදය භාවිතා වේ. මේ අනුව 'අහෝ හාරුන්ගේ සොයුරිය' යනුවෙන් ඇමතුවේ, පරපුරෙන් පැවති සහෝදරත්වය විනා දෙමාපියන් තුළින් පැවති සහෝදරත්වය සඳහන් කිරීමට නොවේ. බයිබලයේ ශු.ලූක්1-5 වාක්‍ය සකරිය්යාගේ බිරිඳ වන එලිසබෙත් ගැන 'ආරොන්ගේ දියණිය' ලෙස සඳහන් කරන්නේ මෙම වාක්‍ය සම්ප්‍රදායට අනුකූලවයි.

දෙවනුව,වාක්‍යයෙහි අඩංගු කරුණු. "අහෝ හැරුන්ගේ සොයුරියනි" යන පදය ගැන මතුවන සියලු සැක දුරු කරයි. මරියම් තුමිය, ළදුරු ජේසු තුමාව වඩා ගෙන ජනතාව ඉදිරියට පැමිණිවිට, ඔවුහු මේ ආකාරයට හඬ නැඟවේ, "ඇය, ඔහු වඩාගෙන ඇගේ ජනතාව වෙත ආවාය. අහෝ මරියම්, තී අපූර්ව වූ දැයක් ගෙනායෙහිය යි එවුහු කීවෝය. අහෝ හැරුන්ගේ සොහොයුරිය ඔබගේ පියා දුෂ්ට මිනිහෙක් නුවූයේය. තවද ඔබේ මවද දුරාචාරවත් කාන්තාවක් නුවූවාය. එවිට ඇය, ඔහු (ජේසු) දෙසට සංඥා කළාය. තොටිල්ලලෙහි සිටින බිලින්දකුට අපි කෙසේ කථා කරමු දැ?යි ඔවුහු කීවෝය."19-27 සිට 30 දක්වා.

මෙම වාක්‍ය මාලාව විවරණයක් කරන යූසුෆ් අලි මෙසේ ලියයි. "ජනතා වගේ විශ්මය සීමාව ඉක්මවිය. ඇය (මරියම්) කාලයකින් ඥාතීන් ගෙන් ඉවත ගොස් සිටි හේතුවෙන් ඇය ගැන අයහපත් සිතුවිලි ඔවුන් තුළ හට ගැනුනි. එහෙත් දැන් කිසිදු ලජ්ජාවක් නොමැතිව ඇය ළදරුවෙක් වඩා ගෙන සමාජය

මැදට පැමිණේ. පූජකයින්ගේ මුල්ම ප්‍රභව වන ආරොන්ගේ නිවස පවා ඇය අවමන් කළාය. ඇගේ දෙමාපියන්ගේ උසස් වංශය සහ පිවිතුරු චරිත ගැන සිහි කරනු ලැබුණි. ඇය කෙසේ හෝ පහත් තත්ත්වයට වැටී, සිය මුතුන් මිත්තන්ගේ නාමයට අපකීර්තියක් ගෙන ආවාය.“

ඉහත සඳහන් හේතුන් ගෙන සළකා බලන විට, ‘අහෝ ආරොන්ගේ සොයුරියනි‘ යනුවෙන් ආමතීම, ‘වාචික ජන කථාවෙන් ශුද්ධ වූ කුර්ආනය රචනය කරනු ලැබූ බවට සාක්ෂියක්‘ යන්න නිගමනය කළ නොහැක. හාමාන් පිළිබඳ අවුලටද මෙය පදනවක් නොවන්නේය.

තෙවනුව, සිය සිදහසට ශුද්ධ වූ කුර්ආනයේම සපයා තිබීම බොහෝසෙයින් වැදගත්ය. යුදෙව්, ක්‍රිස්තියානි සහ මිථ්‍යා දෘෂ්ටික පිරිස අල්ලාහ් හැර අන් ස්ථානයකින් ශුද්ධ වූ කුර්ආනයට කරුණු උපුටා ගත් බවට චෝදනා කළෝය. එහෙත් එවුන් සියලු දෙනාට සත්‍ය පිළිතුරක් ලෙස, “එවුහු අල් කුර්ආනය සම්මස්ෂණය නොකරන්නෝද? මෙය අල්ලාහු හැර වෙන කෙනෙකු ගෙන් නම්, එහි නොයෙක් අසමකම් ඔවුහු දකින්නෝය.“ යනුවෙන් 4-82 වාක්‍ය අල් කුර්ආන්හී සපයා තිබේ. ශුද්ධ වූ කුර්ආන්යේ හාස්කම් අතර, එහි කිසිදු අසමාකම් ඇති නොවීම ඉතා වැදගත් එකකි. මෙවැනි ස්ථිර ප්‍රකාශය වලංගු වන තුරු. බටහිර විද්වතුන් නඟන චෝදනා සියල්ල අවලංගු කාසියක් බවට පත්වේ.

ශුද්ධ වූ කුර්ආනයේ මූලාශ්‍රය සාතාන් බව විශ්වාස කළ විද්වතුන් සමහරෙක් සිටිය අතර, ලූතරන් දේවස්ථානයේ ආරම්භක කර්තෘ වන මාටින් ලූතර් එවැනි මතයක් දැරූ

කෙනෙකි. එවැනි පුහු තර්කයේ තිබෙන දුබලතාවය එක වාක්‍යයකින් ශුද්ධ වූ කුර්ආනය පෙන්වා දෙයි. සාතාන් අල්ලාහ්ගේ ශාපය ලැබූ බව පැවසීම පමණක් නොව, අල් කුර්ආනය පාරායනය කරන විට, ඒ සාතාන්ගේ උවදුරෙන් ආරක්ෂාව පතන ලෙසද අණ කරයි.

"ඔබ කුර්ආනය පාරායනය කරන කල්හී, ශාප ලත් ෂයිතාන් ගෙන් අල්ලාහ්ගේ පිහිට සොයවු." අල් කුර්ආනය 16-98. ඇතැම් අයගේ මත පරිදි ශුද්ධ වූ කුර්ආනයේ කර්තෘවරයා සාතාන් නම්, ඔහු පමණක් නොව ඔම මතය දැරූ සියලූ දෙනාම මෙම වාක්‍යයෙන් ශාපයට පත්වූවන්ම විය යුතුයි.

නබි (සල්) තුමාණන්ගේ නාමයට, චරිතයට හෝ අරමුණට එරෙහිව කවරෙක් කුමන චෝදනා නැඟුවද, අවසානයේදී වැදගත් වන්නේ එතුමා ගෙන ආ ග්‍රන්ථයේ සත්‍යතාවයක් නොමැති බව හෝ එම හෙළිදරව් ඉදිරිපත් කළ විෂය අසත්‍ය වූවක් බව හෝ තහවුරු වුනීද යන ප්‍රශ්නයයි. මේ සම්බන්ධයෙන් ශුද්ධ වූ කුර්ආනය ප්‍රකාශ කළ අභියෝගය විවෘතයි. සදාකාලීනයි. එසේ නොකර රසූල් (සල්) තුමාණන්ගේ නාමයට එරෙහිව නඟන සියලූම චෝදනා එම අභායෝගයට මුහුණ නොදී මඟ හැරීමේ වංක ක්‍රියාවක් ලෙස සැලකිය යුතුයි. ශුද්ධ වූ කුර්ආනයට එරෙහිව බරපතල චෝදන නගන්නෙක්, එහි තිබෙන බව පවසන වැරැද්ද පැහැදිලිව තහවුරු කළ යුතුයි. පසුව එයට අදාල හේතු සාධක කරුණු සහ තර්ක ඉදරිපත් කළ යුතුයි. එසේ නොමැතිව වැරදි තිබිය හැකිය යන බලා පොරොත්තුවෙන්, චෝදනා ඉදිරිපත් කිරීම මහත් නින්දිත මඩ ගැසීමක්සේ සැළකේ.

ශුද්ධ වූ කුර්ආනයේ මූලාශ්‍රය පිළිබඳව තර්කානුකූලව ඉදිරිපත් කළ සංකල්ප දෙකක් ගැන පරීක්ෂා කළෙමු. එය දේව හෙළිදරව්වකියි යනුවෙන් ශුද්ධ වූ කුර්ආනය තුළින් ඉදිරිපත් කරන විස්තර ඉවත දැමීමට ඇති අපහසුතා මොනවා දැයි පරීක්ෂා කළෙමු. මෙම අපහසුතා හේතුවෙන්, ශුද්ධ වූ කුර්ආනය දේව වාක්‍යයක් බව නිගමනය පසුවට තබා, ශුද්ධ වූ කුර්ආනය මුහම්මද් (සල්) තුමාණෝ විසින් රචනය නොකළ බවද යුදෙව් හා ක්‍රිස්තායානි ග්‍රන්ථවලින් උපුටා නොගත් බවද සනාථ කළ හැකිවිය. දැන් ශුද්ධ වූ කුර්ආනය දේව වාක්‍යයන් බව අල් කුර්ආනය කරන ප්‍රකාශය ගැන පරික්ෂා කර බලමු.

# 12. දේව නිවේදනයක් වීමේ සිද්ධාන්තය

සෑම මිනිස් වර්ගයාම එකතු වී වෑයම් කළද, ශුද්ධ වූ කුර්ආනයේ එක පරිච්ඡේයක් වූවද රචනය කළ නොහැකිවන බව ශුද්ධ වූ කුර්ආනය කරන අභියෝගය අපි දුටුවෙමු. හුද්ධ කුර්ආනයේ අඩංගු කරුණු පිළබඳව නවින විද්‍යාවේ ආදාරරයෙන් සියුම් ලෙස පරීක්ෂන පවත්වන කෙනෙකුට එහි සතයතාවය දැක ගත හැකි බව, වෛද්‍ය මොරිස් බුකෙයිල් නම් ප්‍රංශ විද්‍යාඥයෙක් පවසයි. උපතින් කතෝලික බැති මතෙක් වූ ඔහු ‘බයිබලය, කුර්ආනය සහ නවින විද්‍යාව‘ නම් කෘතියේ ප්‍රකාශ කර ඇත්තේ මෙසේය.

“ප්‍රථම වරට ශුද්ධ වූ කුර්ආනය කියවන කෙනෙක් මැවීම්, තාරකා ශාස්ත්‍රය, පෘථිවිය සහ එහි සත්ව හා ශාක ලෝකය, මිනිස් අභිජනනය වැනි විෂයන් රාශියක් ගැන සඳහන්වන

විස්තර විශාල ප්‍රමාණයක් දැක ගනියි. බයිබලයේ වැරදි තොරතුරු බොහෝමයක් දුට මම, ශුද්ධ වූ කුර්ආනයේ එක වැරද්දක් වුවද නුදුටුවෙමි. මෙහිදි මා තුළ ප්‍රශ්නයක් පැන නැගුණි. මෙම ග්‍රන්ථයේ කතෘවරයා මිනිසෙක් වූයේ නම්, නවීන විද්‍යාව අද සොයා ගන්නා සත්‍ය තොරතුරු රාශියක්, හත්වන ශත වර්ෂයේ ඔහු රචනය කළේ කෙසේද යනු ඒ ප්‍රශ්නයයි. ඇත්ත වශයෙන්ම අද අප සතුව තිබෙන ශුද්ධ වූ කුර්ආනය, සෑම කාලයටම අදාලවන ග්‍රන්ථයක් බවට කිසිදු සැකයක් නැත. ඩැගෝබර්ට් රජ තුමා ප්‍රංශය පාලනය කළ යුගයේ, අරාබි අර්ධ ද්වීපයේ ජිවත් වූ මිනිසෙක්, ඊට වසර දහසකට පෙර පැවැති විද්‍යාත්මක දැනුම ලබන්නට හැකි වූයේ කෙසේදැයි පහදා දෙන්නට කිසිවෙකුට නොහැකි වනු ඇතැයි මම සිතමි.“

ශුද්ධ වූ කුර්ආනයේ ආශ්චර්යමත් වාකය නිර්මාණය පිළිබඳව මිලර් නම් තවත් විද්වතෙක් මෙසේ ලියයි. “ශුද්ධ වූ කුර්ආනයේ බහුල ලෙස දක්නට ඇති, ගණිතමහ ප්‍රාතිහාර්යය සහ එහි මවිතයට පත්කරවන නිර්මාණ ඉතා වැදගත් මෙන්ම ඒවා අවශ්‍ය දැයක්ද වේ. එනම් ශුද්ධ වූ කුර්ආනයේ වචන සැකසීම ඉතාමත් අවශ්‍යම දෙයක්වේ. එසේ නොමැති කල එය වැරදි එකක් වනු ඇත.“

විද්‍යාවේ නවීන දැනුම පදනම කරගෙන, පෘථිවියේ මැවීම සහ එහි විවිධ අදියර, එය මැවීමේ කාලය, එය මත මිනිසා උපත ලැබූ කාලය, මහා ජල ගැල්ම සහ නික්ම යාම යනාදී මාතෘකා යටතේ මොරිස් බුකෙයිල් ශුද්ධ වූ කුර්ආනය සහ බයිබලය මෙසේ සංසන්දනය කරයි.

1. බයිබලයේ උත්පත්ති කථාවෙහි 1-3 සිට 5 දක්වා වාක්‍යවලින් පළමුවන දින දහවල් හා රාත්‍රිය මවනු ලැබූ බව පවසයි. තාරකා වන්හී සිදුවන සංකීර්ණ ප්‍රතික්‍රියාවන්හී ප්‍රතිඵලයෙන් විශ්වය වටා ගමන් කරන ආලෝකය ලැබෙන නමුත්, තාරකාවන් තහරවන දින මවනු ලැබූ බව බයිබලය පවසයි. ආලෝකයේ හේතුව දින හතරකට පසුව සිදු වුයේ නම්, එහි ප්‍රතිඵලය පළමු දිනයේ සිදු වූ බව සඳහන් කිරීම තර්කයට එකඟ නොවන කරුණකි. එක් දිනයක කොටස් වන උදය හා සවස සිදු වීම ගැන සිතීමට පවා හැකි වන්නේ, පෘතිවියද එහි තාරකාව වන සූර්යයාද නිර්මාණය වී හිර වටා පෘතිවියේ පරිභ්‍රමණය සිදුවන විටයි.“ නිර්මාණයේ මෙවැනි වැරදි පිළිවෙලක් ශුද්ධ වූ කුර්ආනය සඳහන් නොකරයි.

2. උත්පත්ති 109 සිට 13 දක්වා වාක්‍යයන්හි, “ගස් කොලන්, බීජ සපයන ශාක, පලතුරු සපයන පලතුරු ගස් වැනිදේ බයිබලය පවසන ආකාරයට තුන්වන දිනයේදී නිර්මාණය කරන ලදී.“ ඉතාමත් උසස් ලෙස සංවිධානය කරනු ලැබූ අභාජන හිකියාව සහිත බීජ සහිත ශාක ලෝකය, සූර්‍ය්‍යයාගේ පැවැත්මට පෙර සුදුවුයේ යයි පැවසීම, කිසිවෙක් පිළිගන්නේ නැත. එමෙන්ම දිවා සහ රාත්‍රිය ගැන බයිබලය පවසන කරුණුද ඉවත දැමිය යුතුය.“ යි මොරිස් බුකෙයිජ් පවසයි. මෙවැනි වැරදි කිසිවක් අල් කුර්ආනය සඳහන් නොකරයි.

3. සූර්යයා, චන්ද්‍රයා සහ තාරකා හතරවන දින නිර්මාණය කරනු ලැබූ බව උත්පත්ති 1 -14 සිට 19 දක්වා වාක්‍යවල

සඳහන්වේ. මේ පිළිබඳව මොරිස් බුකෙයිල් මෙසේ පවසයි. "ප්‍රථම තාරකා වන සූර්යයාගෙන් පෘථිවිය සහ චන්ද්‍රයා නිකුත් වූ බව අපි දනිමු. පෘථිවියේ නිර්මාණයට පසුව සූර්යයාගේ සහ චන්ද්‍රයාගේ උපත සිදු වූ බව පැවසීම සූර්ය ග්‍රහ මණ්ඩල නිර්මාණය පිළිබඳව පිළිගත් මත සියල්ලටම එරෙහිව කරන ප්‍රකාශයකි." මෙවැනි පිළිවෙලක් නොමැති නිර්මාණ කිහිපයක් පිළිබඳව මොරිස් බුකෙයිල් එම කෘතියෙහි විස්තර කර ඇත. විශ්වය මවා නිමකරන්නට දින හයක් ගතවූ බව බයිබලය පවසයි. "හත්වන දවස සෙනසුරාදා දෙවියන් වහන්සේ විවේක ගත්තේය." යන වාක්‍යයන් එක් දිනක කාලය පැය 24ක් බව පෙනේ.

ශුද්ධ වූ කුර්ආනයද දින හයක් ගැන සඳහන් කරන අතර අරාබි බසින් භාවිතා කරන වචනය යවුම් සහ එහි බහු වචනය අය්යාම් යනු වෙ. මෙම වචනය පැය 24ක් අඩංගු දවනකට හෝ දිර්ඝ යුගයකට අදාල වේ. ශුද්ධ වූ කුර්ආනයේ 32-4 *වාක්‍ය "අහස්ද, පොළොවද. ඒ දෙක අතර දැයද දවස් හයක කාලයකින් අල්ලාහ් නිර්මාණය කළේය."* යනුවෙන් පවසන අතර, *"එක් දවසක් ඔබේ ගණන් ප්‍රමාණයෙන් දහසක් අවුරුදු"* බව 32-5 වන වාක්‍ය යෙන්පවසයි. හත්වන සබාත් දිනය දෙවියන් වහන්සේ විවේක ගත් බව පවසන අදහස ශුද්ධ වූ කුර්ආනය ප්‍රතික්ෂේප කරයි.

*"අල්ලාහ්, ඔහු හැර අන් දෙවියක් නැත. ජීවමානය, සදා කාලීනය, සමික්ෂාකිරී පාලකයාය. මද නින්ද හෝ තද නින්ද හෝ ඔහුට නො අල්වයි."* යනු ශුද්ධ වූ කුර්ආන් පවසන අලංකාරවත් වාක්‍ය බලන්න 2- 255.

අහස මා පොළොව නිර්මාණය ගැන ශුද්ධ වූ කුර්ආනය නොයෙක් ස්ථානයන් හි සඳහන් කරයි. 2-29, 21-104, 23-17, 25-59, 32-4, 50-38, 78-12 සහ 13, 79- 27 සිට 33 දක්වා වාක්‍යවලින් ඒ පිළිබඳව පවසන බව දැක ගත හැක. විශ්වයේ නිර්මාණය ගැන ශුද්ධ වූ කුර්ආනයේ 21-30 වාක්‍ය මෙසේ පයසයි. *"අහස්ද පොළොවද බද්ධව තිබී, ඒ දෙක දෙ බෑ කළෙමු. තවද දිවි ඇති සියලු දැය ජලයෙන් අපි නිර්මාණය කෙළෙමු. යි විශ්වාස නොකරන අය නොදකින්නේද? එහෙයින් ඔවුහු විශ්වාස නොකරන්නේද?"*

*"පසුව ඔහු අහස දෙස බලා, එකල එය දුමක්විය. එයටද පොළොවටද.."* ශුද්ධ වූ කුර්ආන වාක්‍ය 41-11 තවත් වැදගත් විද්‍යාත්මක කරුණක් ගැන පවසයි. මෙවැනි වැකි රාශියක් හය වන ශත වර්ෂයේ නිකුත්වුයේ කෙසේද?

# 13. විද්‍යාත්මක තොරතුරු

ශුද්ධ වූ කුර්ආනයේ තිබෙන දත්ත සමඟ නවීන වාද්‍යාත්මක සොයා ගැනීම සසඳා බලනවිට ඉතා වැදගත් කරුණු රාශියක් දැක ගත හැකි බව මොරිස් බුකෙයිල් පවසයි. ඉන් සමහරක් මෙහි පහත දැක්වේ.

1. සූර්යයා, චන්ද්‍රයා, තාරකා වැනි ආකාශ වස්තූන් සහ පෘථිවියේ නිර්මාණය, අදියර දෙකකට අයත් බව ශුද්ධ වූ කුර්ආන 41-9 සිට 12 දක්වා වැකි පවසන ආකාරය සැලකිය යුතුය. ඉර සහ පෘථිවිය නිදසුනක් ලෙස ගත්විට, මූලික නිහාරිකාව (Primary Nebula) උකුවීමේ සහ පසුව

වෙන්වීමේ ක්‍රියාවලිය අනුව ඒවා නිර්මාණය වූ බව නවීන විද්‍යාව පවසයි. දුමාරයක් ලෙස තිබූ අහසේ විශාල පිපිරීමක් සිදුවී, සියල්ල වෙන් වූ මෙම අදියර දෙක ගැන ශුද්ධ වූ කුර්ආනය ඉතා පැහැදිලිව පෙන්වයි. මේ අනුව ශුද්ධ වූ කුර්ආනය දක්වන විස්තර සහ නවීන විද්‍යාව පවසන (Big Bang Theory) මහා පිපිරීම් වාදය අතර, සම්පූර්ණ එකඟතාවක් දක්නට තිබේ.

2. මෙම අධියර දෙක අතර වැලැක්විය නොහැකි සම්බන්ධකමක් තිබෙන අතර එහි ප්‍රත්ඵලයක් වන තාරකාව(සූර්යයා) සහ එහි උප ග්‍රහය (පෘථිවිය) ගැන නවින විද්‍යාව දැන් සොයා ගෙන ඇත. ඉහත වාක්‍යයහි අල් කුර්ආනය සඳහන් කරන්නේද මෙම අතුරු සැබැඳුම (Inter connection) පිළිබඳවයි.

3. ආරම්භක අවධියේ විශ්වය දුමාරයක් වශයෙන් තිබීම පිළබඳ අල් කුර්ආන් සඳහන් කරයි. එහි ප්‍රමුඛ වශයෙන් වායුමය තත්ත්වයේ ද්‍රව්‍ය අඩංගු වූ බව ශුද්ධ වූ කුර්ආනය පවසන කරුණු, නවීන විද්‍යාව ඉදිරිපත් කරන මූලික නිහාරිකාව (Primary Nebula) සංකල්පය සමඟ එකඟවේ.

4. අහස්තලයන්හී බහුත්වය පෙන්වීමට අහස් හතක් තිබෙන බව අල් කුර්ආන් පවසන අතර, නක්ෂත්‍ර භෞතික (Astrophysics) විද්‍යාඥයන් මන්දාහිනි මණ්ඩල පිළබඳව මැතකදී කළ පරීක්ෂණයෙන්, ඒවා විශාල සංඛ්‍යාවක් තිබෙන බව සොයා ගැනීමෙන් එම සත්‍යතාවය තහවුරු කරයි.

5. අහස් සහ පොළොව අතරෙහි, අතරමැදි නිර්මාණයක් ගැන අල් කුර්ආනය පවසයි. "දෙවියන් වහන්සේ අහස, පොළොව හා ඒ අවට ඇති සියලු දේ මැවූ අතර.." අල් කුර්ආන 25-59. තාරකා මණ්ඩලයට බාහිරව පදාර්ථ පාලම පවතින බව නූතන විද්‍යාව සොයා ගෙන ඇති අතරමැදි නිර්මාණ (Bridges of Material) මේවා බව මොරිස් බුකෙයිල් අදහස් දක්විය.

මෙහිදී අපි සලකා බැලිය යුතු වැදගත් ප්‍රශ්නයක් ඇත. වසර එක් දහස් හාර සීයකට පෙර, අරාබි කාන්තාරයේ වාසය කළ මුහම්මද (සල්) තුමාණෝ බයිබලයේ තිබෙන විද්‍යානුකූල අසත්‍ය තොරතුරු සියල්ල ඉවත දමා, සිය උත්සාහයෙන් වෙනත් තොරතුරු ශුද්ධ වූ කුර්ආනයට එකතු කළ අතර එවායේ සත්‍ය තාවය නවීන විද්‍යාව සොයා ගෙන සනාථ කළේ ඉතාමත් සමීප කාලයේදීය. නබි (සල්) තුමාණෝ මෙය සිදු කළේ කෙසේද?

ප්‍රථම මිනිසා පෘථිවියට පැමිණි කාලය, සංසන්දනය කළ යුතු තවත් වැදගත් කරුණක් ඇත. එනම් බයිබලයේ උත්පත්ති කථාවේ 4, 5, 11, 21 සහ 25 පරිච්ඡේදය සඳහන් කරන ආකාරයට, ආදම්ට (ප්‍රථම මිනිසා) වසර 1948 කට පසුව ඉබ්‍රාහීම් නබි උපත ලැබුවේය. ඉබ්‍රාහීම් නබි සහ ජේසුස් තුමා අතර වසර 1800ක කාලයක පරතරයක් බයිබලය පෙන්වයි. එහෙත් ආදම් සහ ජේසුස් තුමා අතර පරතරය වසර 5,800 ක් වේ. "මෙවැනි ප්‍රකාශ සියල්ල සම්පූර්ණයෙන් වැරදි බවට තර්කයක් නැත. ආදම් සහ ඉබ්රාහීම් අතර කාලය ගණනය කිරීමේදී සිදු වූ වැරැද්ද නිසා මෙම සාවද්‍යතාවය සිදු වී ඇතැයි

මොරිස් බුකෙයිල් පවසයි. විද්‍යාඥයින් කළ කැනීමට අනුව, මානව විද්‍යාව සහ පුරා විද්‍යා ශාස්ත්‍ර උපකාරයෙන්, පැරණි මිනිසා වාසය කළ කාලය දසදහස් වසර ගණනාවක් බව සොයා ගෙන ඇත. නවීන විද්‍යාවෙන් පිළිගත් තොරතුරු අනුව මේ පිළිබඳව බයිබලයේ සඳහන් සියලු දත්ත සාවද්‍ය බවට සනාථවේ. වැරදි දත්ත නොසපයන හේතුවෙන්, සාවද්‍ය තොරතුරු කිසිවක් ශුද්ධ වූ කුර්ආනයේ දක්නට නැත.

බයිබලයේ සඳහන් මහා ජල ගාල්ම (උත්පත්ති 6, 7, 8) පිළිබඳ තොරතුරු වලට අනුව සමස්ත ලෝකයම ජලයෙන් යට වී, සියලු ජීවින් සහමුලින්ම විනාශ වූ බව දැක්වේ. මෙම විස්තරවලින් පෙන්වන පරිදි, ආදම්ගේ උපතට වසර 1656කට පසුව, ඉබ්‍රාහිම් නබිවරයාගේ උපතට වසර 292ට පෙර මෙම ව්‍යසනය සිදුවිය. එම විස්තර සාමානය දැනුම හා පවා කොහෙත්ම සැසඳෙන්නේ නැත. මනුෂ්‍ය වර්ගයා සම්පූර්ණයෙන් නැසී ගියේ නම්, ඉබ්‍රාහීම් නබි එයට ශත වර්ෂ 3ක් තුළ පැමිණ, නුහුගේ පුත්‍රයින් තිදෙනෙක් සහ ඔවුන්ගේ බිරියන් තුළින් බිහිවී නොයෙක් ස්ථානවල, විවිධ සමාජ වශයෙන් ව්‍යාප්ත වී ජීවත් වන ජනතාවක් දැක ගත නොහැක. මන්ද, වසර තුන් සීයක් තුළ එවැනි ජනරැල්ලක් බිහිවීම කොහෙත්ම සිදුනොවීමයි.

තවද, ක්‍රිස්තු පූර්ව වසර 1800 සහ 1850 අතර ඉබ්‍රාහීම් තුමා ජීවත් වූ බවද, එතුමාට වසර 300ට පෙර මහා ජල ගැල්මක් සිදු වූ බවද උත්පත්ති පොතේ සඳහන් වන බැවින්, ක්‍රිස්තු පූර්ව විසි එක්වන හෝ විසිදෙවන ශත වර්ෂයේ. මෙම ව්‍යසනය සිදු වූ බව ගණන් බැලිය හැක. එහෙත්, එම කාලයේ ලොවේ නොයෙක්

පලාත්වල දියුණු වූ ශිස්ටාචාර කිහිපයක් පටන් ගෙන අවසාන බව ඔවුන් හැර දමා ගිය නටබුන් නගරවල් සහ පරිහරණය කළ භාණ්ඩවලින් දැන් සොයා ගෙන ඇත.

නිදසුනක් ලෙස මිසර නගරය ගත්විට, මෙම කාලය (ක්‍රි.පූ.2100 වර්ෂ) මධ්‍ය යුගයේ කාලයේ වූ රාජධානියට පෙර වූ  යුගය වන අතර, එකොලොස් වන රාජ්‍ය වංශයට පෙර වූ කාලය හා සමානවේ. එවකට තුන්වන රාජ පරපුර බැබිලෝනියාවේ ඌර් නම් නුවර පාලනය කළහ. මෙම ශිෂ්ටාචාරය කිසිදු විනාශයකට පත් නොවූහ. බයිබලය පවසන ආකාරයට මුළු මිනිස් වර්ගයාම ජල ගැල්මේ ව්‍යසනයට ලක් නොවූ බවට මේ ජනතාව සාක්ෂි දරන බව බුකෙයිල් පෙන්වා දෙයි.

ජල ගැල්ම සිදු වූ බව පවසන ශුද්ධ වූ කුර්ආනය එයට කාලයක් සඳහන් නොකරයි. එපමණක් නොව නූහු නබි නිර්මාණය කළ නැවේ එතුමාගේ පවුලේ සාමාජිකයන්ට අමතරව තමත් බොහෝ අය සිටි බව ශුද්ධ වූ කුර්ආනය පවසයි. ඇත්ත වශයෙන්ම නූහු නබිගේ පුත්‍රයා නැවට ඇතුළු නොවූ බව ශුද්ධ වූ කුර්ආනය පවසයි. “ඔබගේ පවුලේ අයද විශිවාස කළ අයද එහි උසුලුවයි.“ වාක්‍ය 11-40. “මා පුතුනි, අප සමඟ නගිනු. විශ්වාස නොකරන්නවුන් සමඟ නොවනු. යයි ඇත්ව සිටි තමගේ පුතාට අඬ ගැසුවේය. ජලයෙන් මා අත්මුදන කන්දකට මම යන්නෙමි. යි ඔහුගේ  පුතා කීවේය.“ වාක්‍ය 11-42 සහ 43.

මෙහිදී පෙන්වා දෙන වැදගත් කරුණක් නම්, ජල ගැල්මේ ව්‍යසනය ගැන තොරතුරු සපයන එකම ලේඛනය බයිබලය

පමණි. මුහම්මද් (සල්) තුමාණෝ වංකව බයිබලයෙන් උපුටා ගත්තේ නම්, එහි තිබෙන වැරදි සියල්ල එතුමා අනුකරණය කර ගත යුතුයි. නවීන විද්‍යාව කරුණු සෙවීමට බොහෝ කාලයට පෙර බයිබලයේ තිබෙන වැරදි විස්තර ශුද්ධ වූ කුර්ආනය නිවැරදි කොට අවසාන බව මෙයින් පෙන්නුම් කරයි.

බයිබලය හා සසඳා බලනවිට, තවත් වැදගත් කරුණක් සැලකිල්ලට ලක්වේ. එනම්, ෆේරෝ නම් ෆිර්අවුන්ගේ මරණයට පසුව, ඔහුගේ මෘත දේහය ගැන කිසිවක් බයිබලයේ නික්ම යෑම පොතේ සඳහන් වි නැත. ෆිර්අවුන්ගේ මෘත ශරීරයට කුමක් සිදුවුනි දැයි ශුද්ධ වූ කුර්ආනය පැහැදිලිව ප්‍රකාශ කරන්නේ මෙසේය. “ඔබට පසු අයට ප්‍රතාභාර්යයක් වනු පිනිස මෙදින ඔබේ මළ සිරුර (හුමුදෙන්) ගොඩ දමා ආරක්ෂා කරන්නෙමු. ඇත්තෙන්ම මනුශ්‍යයන් ගෙන් වැඩි දෙනෙක් අපගේ ආයවන් ගැන නොසලකන්නෝමය.“ කුර්ආන් 10-92.

ශුද්ධ වූ කුර්ආනය පහළවන කාලයේ ඉස්රායිල් ජාත්න්ගේ නික්ම යෑමේ සිද්ධිය හා සම්බන්ධ වූ සියලු ෆේරෝවරුන්ගේ මෘත දේහ නයිල් ගඟ ඉවුරේ තිබස්ට අයත් නෙක්රෝපෝලිස් හී ඔවුන්ගේ සොහොන්වල තැන්පත් කොට තිබුණු නමුත් එවායේ විස්තර කිසිවක් මිනිසුන් දැන සිටියේ නැත. ඒ ගැන සොයා ගනු ලැබුවේ දහනව ශත වර්ෂ අවසාන කාලයේදීය. ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් පරිදි නික්ම යෑමට අවසාන වශයෙන් සම්බන්ධවී ජලයේ ගිල්වනු ලැබූ ෆිර්අවුන්ගේ මෘත දේහය ගොඩ ගෙන කෙයිරෝ කෞතුගාරයේ රාජකීය

මම්වරුන්ගේ මැදිරියේ තැන්පත් කර තිබෙන නිසා, එය අද වූ වත් බලා ගත හැකි වේ.

අවසාන වශයෙන් ජේසුස් තුමාගේ වංශාවලිය පිළිබඳව තොරතුරු දෙස බලමු. මතෙව් සහ ලූක් යන අයගේ පොත් හී සඳහන් වංශාවලිය, විදයාත්මක දත්ත හා අනුකූලතාවයක් නොදක්වන හෙයින් එහි සත්‍යතාවය පිළිගැනීමේදි ප්‍රශ්න පැන නගී. පුරුෂ පක්ෂයෙන් පෙන්වන වංශාවලියේ කිසිවක් ජේසුස් තුමාට අදාල නොවන බව පැහැදිලිව මෙහිදී පෙන්වා දිය යුතුයි. මරියම් තුමියකේ කුසේ ජනිත වූ ජෙසුස් තුමා පියෙක් නොමැතිව උපත ලැබූ හේතුවෙන් එතුමාගේ වංශාවලිය මරියම් තුමිය හා සම්බන්ධවිය යුතුයයි කවුරුත් පිළිගනි. ශුද්ධ වූ කුර්ආනය ජෙසු තුමා ගැන සඳහන් කරන්නේ ඒ ආකායටයි. ශුද්ධ වූ කුර්ආන් හී සෑම තැන්හීම එතුමා ගැන සඳහන් කරන්නේ මරියම්ගේ පුත්‍රයා ලෙසයි. ජේසු තුමාගේ වංශාවලිය නූහු. ඉබ්‍රාහීම්, මරියම් තුමියගේ පියා වන ඉම්රාන් යනුවෙන් අල් කුර්ආනය පෙන්වා දෙයි.

“සැබැවින්ම අල්ලාහු ආදම්ද, නූහුද, ඉබ්‍රාහිම්ගේ පෙළ පතද, ඉම්රාන්ගේ පෙළපතද ලෝක වාසීන් අතරින් තෝරා ගත්තේය. සමහරකු ගෙන් සමහරකු පෙළපතක් වශයෙන් තෝරා ගත්තේය. අල්ලාහු සවන් දෙන්නේය. දන්නේය. අල් කුර්ආන් වැකි 3- 33 සහ 34.

ඒ අනුව. නූහුගෙන් ඉබ්‍රාහාම්ගෙන් පැමිණි ඉම්රාන්ගේ දියණිය වන මරියම්ගේ මාර්ගයෙන් ජේසුස් තුමාගේ පැමිණීම සිදුවි ඇත. බයිබලය සඳහන් කරන මුතුන් මිත්තන්ගේ වැරදි තොරතුරු කිසිවක් ශුද්ධ වූ කුර්ආනයේ දක්නට නැත. මුහම්මද්

(සල්) තුමාණෝ බයිබලයෙන් තොරතුරු උපුටා ගත් බවට චෝදනා එල්ල කරන විද්වතුන් සැලකිය යුතු විශේෂ කරුණක් මෙහිදි පෙන්වා දිය යුතුයි. එනම්, ජේසු තුමාගේ මුතුන් මිත්තන් පිළිබඳ වැරදි තොරතුරු සියල්ලම ඉවත් කොට නිවැරදි තොරතුරු ශුද්ධ වූ කුර්ආනයේ ඇතුලත් කිරීමට කවරෙකුගේ හෝ කුමන හේතුවක බල පෑමක් සිදුවුනීද? එලෙස නිවැරදි කිරීමෙන් නූතන අධයාපනය විසින් බයිබලයට නගනු ලබන විවේචනයෙන් වැලකෙන්නට ශුද්ධ වූ කුර්ආනයට හැකිවුයේ කෙසේද?

මෙම ග්‍රන්ථ දෙක සසඳා බැලීමේදී මේවාට අමතරව බයිබලයේ දක්නට නොමැති විද්‍යාත්මක තොරතුරු රාශියක් ශුද්ධ වූ කුර්ආනය සපයන බව දැක ගත හැක. අල් කුර්ආනයේ තිබෙන සිය ගණන් ප්‍රකාශ අසතය දෙයක්සේ පවසන කිසිවෙක්, එක වාක්‍යයක් වුවද අසතයබව පෙන්නුම් කිරිමට අසමත්විම විශමයට පමුණුවන කරුණකි. ඓතිහාසිකව හෝ විද්‍යාත්මිකව නිවැරදි ප්‍රකාශ රාශ්යක් අඩංගු වී ඇති හේතුවෙන් පමණක්ම එම ග්‍රන්ථය දේව වාක්‍යයක් බව අපි තර්ක නොකරන බවද මෙහිදී අවධාරණය කළ යුතුයි. එකිනෙකට සම්බන්ධ කරුණු කිහිපයක්, ඒ සඳහා දරණ වෑයමක්සේ පහත දක්වමු.

1. ශුද්ධ වූ කුර්ආනය යනු, තැන් තැන්වලින් ක්‍රමානුකූලව තොරා ගෙන රැස් කරගත් සත්‍ය තෙරතුරු පමණක් අඩංගු ග්‍රන්ථයක් නොවේ. මේ දක්වා එහි එක් වාක්‍යයක් වූවද අසත්‍ය බව ඔප්පු කිරිමට කිසිවෙකුට හෝ නොහැකිවී ඇත්තේ ් නිසාමයි.

2. ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වාක්‍ය නිවැරදි, අපක්ෂපාත ප්‍රකාශ මෙන්ම, එහි සත්‍යතාවය අවබෝධ කර ගත හැකිවන්නේ, දීර්ග හා අපහසු විද්‍යාත්මක පරික්ෂණ පැවැත්විම තුලින් පමණක්වේ.

3. මුහම්මද් (සල්0 තුමාණෝ ජීවත් වූ යුගයේ එවැනි පර්යේෂණාගාර කිසිවක් නොතිබුනු බව විද්‍යාව පිලිබඳ අධ්‍යාපනනයේ ඉතිහාසය සනාථ කරයි.

4. එම කාල පරිච්ඡේදයේ ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් විෂයන් ගැන විවිධ මිත්‍යා මත රාශියක් ලොවේ පැවතුනු නමුත්, ඒවා සියල්ලන් ගෙන් වැලකී සත්‍යය පමණක් පවසන්නේට මුහම්මද් (සල්) තුමාණන්ට හැකිවිය. එනම්, වැරදි කරුණු කිසිවක් අල් කුර්ආනයේ දක්නට නොමැති අතර, එහි සඳහන් සියලු කරුණු නිවැරදිවිම ශුද්ධ වූ කුර්ආනයේ විශේෂත්වය පෙන්නුම් කරයි.

අවසාන වශයෙන් කිය යුතුව ඇත්තේ, මුහම්මද් (සල්) තුමා ලියන්නට හෝ කියවන්නට නොදන්නා කෙනෙක් බව අපි අමතක නොකළ යුතු කරුණක් බවයි.

ශුද්ධ වූ කුර්ආනයේ වැරදි කිසිවක් නොතිබීම විස්මය ජනක කරුණකි. ශුද්ධ වූ කුර්ආනයේ තිබෙන වාක්‍ය රිශියක් අතරන් වැරදි වාක්‍ය එකක් වුවද දක්නට නැති බව බුකෙයිපි ඔහුගේ “බයිබලය, ශුද්ධ වූ කුර්ආනය හා නවීන විද්‍යාව“ යන කෘතියෙ මෙලෙස පෙන්වා දෙයි.

1. විශ්වය ප්‍රසාරණය වීම යනු නවීන විද්‍යාව සොයා ගත් ඉතා වැදගත් තොරතුරකි. අද එය සැබෑ බව නිගමනයවී ඇති අතර, එය සිදුවන ආකාරය කෙසේද යන සාකච්ඡා පමණක් තවම සිදුවෙමින් පවති. ශුද්ධ වූ කුර්ආනයේ 5-47 වාක්‍යයහි අල්ලාහ් ඒ ගැන පවසන සත්‍ය නවක විද්‍යාව හා සමාන වන්නේ දැයි බලමු. “ අහස, අපි එය බලයෙන් පිහිටෙව්වෙමු. අපිමය අය පුසාරණය කරන්නේ.“

2. අභ්‍යන්තර දහනය (Internal combusion) හේතුවෙන් සූර්‍යයා ආලෝකය සහ උෂ්ණය සපයන බව කවුරුත් දනි. චන්ද්‍රයා සිය හැකියාවෙන් ආලෝකය නොදෙන අතර, සූර්‍යයා ගෙන් ලැනේ ආලෝකය පරාවර්තනය කරයි. ශුද්ධ වූ කුර්ආනය ඒ ගැන පවසන්නේ මෙසේය. “අහස්හි තාරකා රාශි පිහිටුවා, එහි පහනක්ද කැලුම් සඳක්ද තැබූ ඔහු අත් ශ්‍රේෂ්ඨය. 25-61.

3. කක්ෂය වටා ගමන් කරන හිර සහ සඳ ගැන වැදගත් වැකි දෙකක් ශුද්ධ වූ කුර්ආන් සපයයි. “ඔහුය රැයත්, දවාලත්, හිරත්, සඳත් නිර්මාණය කළේ. එකිනෙක කක්ෂයන්හි පාවෙන්නෝය. අල් කුර්ආන් 21 -33.

“ සූර්යයා චන්ද්‍රයා ආක්‍රමණය කරන්නටද, රැය දවාල පසු බාන්නටද සමු නැත. (චන්ද්‍ර, සූර්යයාදිය) එකක් එකක් කක්ෂයෙන්හී පාවෙන්නෝය.” අල් කුර්ආන් 36-40.

අත්‍යාවශ්‍ය කරුණක් මෙහි සඳහන් වී තිබේ. එනම්, සූර්යයාට සහ චන්ද්‍රයාට හිමි කක්ෂයන් තිබිම සහ එහිලා ඒවා ස්වයං චලනයෙන් ගමන් කිරීම ශුද්ධ වූ කුර්ආන් වැකියෙන් පෙන්වා දී තිබීමයි.

ඉහත සඳහන් වැකි එක්තරා මතයක් නිෂ්ප්‍රබ කරන බව දැක ගත හැක. සූර්යයා සිය කක්ෂයේ ගමන් කරන බව මෙහි සඳහන් වන නමුත්, පෘථිවිය හා සම්බන්ධව මෙම කක්ෂය කුමක් දැයි කිසිවක් සඳහන් වී නැත. පෘථිවිය වටා සූර්යයා ගමන් කරන බව පවසන භූකේන්ද්‍ර මතය, ක්‍රිස්තුට පෙර දෙවන ශත වර්ෂයේදී ටොලමි විසින් ඉදිරිපත් කරන ලදී. එම යුගයේ ලොවේ සියලු දෙනාම මෙම මතය පිළිගත් අතර, ශුද්ධ වූ කුර්ආනය පහළවූ කාලයේදි අරාබි දේශයේ පවා එයට වෙනස් මතයක් නොතිබුණි. ලොවේ සියලු ජනයා පිළිගත් මෙම මතය, ශුද්ධ වූ කුර්ආන්හී කොහෙත්ම දක්නට නැති අතර, එයට හාත් පසින් වෙනස් වූ මතයක් ශුද්ධ වූ කුර්ආන් ඉදිරිපත් කරයි. ශුද්ධ වූ කුර්ආනය 7වන ශත වර්ෂයේ පැවසූ සත්‍ය තොරතුරු, 16 ශත වර්ශයේ කොපර්නිකස් නම් විද්වතෙක් ප්‍රකාශ කළායින් පසුව අන්ධකාරයෙන් අවදිවූ යුරෝපය එම මතය පිළිගත්තේය. එහෙත් මෙම අවදි කිරීම සඳහා වතිකානු අධිරාජ්‍යයේ පාප් වහන්සේ කොපර්නිකස්, ගැලිලියො වැනි විද්වතුන්ට දුන් අගනා තිළිණය වූයේ ඔවුන්ට මරණ දඬුවම බව ඉතිහාසය පවසයි.

එදා කොපර්නිකස් සහ ගැලිලියෝට දුන් මරණ දඬුවම සඳහා ශුද්ධ වූවූ  ජෝන් පාප් වහන්සේ 20වන ශත වර්ෂයේ ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා නිවේදයක් නිකුත් කළ බව ඔබ දන්නෙහිද?

4. විශ්වයේ කේන්ද්‍ර ස්ථානය පෘථිවිය බවද, සූර්‍යයා පෘථිවිය වටා ගමන් කරන බවද පිළිගත් පැරණි යුගයේ, පිළිවෙලට සිදුවන දහවල් සහ රාත්‍රිය පිළිබඳව කථා කරන කෙනෙක් සූර්‍යයාගේ චලනය ගැන සඳහන් නොකර සිටිය හැකි ද? ශුද්ධ වූ කුර්ආනය දහවල් සහ රාත්‍රිය ගැන පවසන්නේ මෙසේය.

“ඔහු (අල්ලාහ්) රැය දවාලෙන් ආවරණය කරවන්නේය. එකක් අනික ලුහු බඳින්නේය.” අල් කුර්ආන් 7-54.

“ඔහු දහවල රැයෙහි වෙළන්නේය. රැය දහවලේ වෙළන්නේය. අල් කුර්ආන් 39-5.

මෙහි සඳහන් කව්වාරා යන අරාබි පදය වෙළුම් දැමීම හෝ එතීම යන අර්ථය හඟවයි. මෙම පදයෙහි මුල් අර්ථය ජටාව නොහොත් හිස් වෙළුම හිසේ ඔතන ක්‍රියාව සඳහන් කරයි.

ඇත්ත වශයෙන්ම අජටාකාශයේ සිදුවන්නේන් කුමක්ද? ඇමරිකානු අභ්‍යවකාශගාමීන් තම යානයේ සිට සහ චන්ද්‍රයා තම සිට පෘථවය ඡායාරූප ගත්තෝය. සූර්‍යයග්‍රහණය සිදුවන අවස්ථාව හැර, අන් සෑම මොහොතකම හිර දෙසට ඇති පෘථිවියේ භාගයට සූර්‍යයා ආලෝකය සපයන අයුරු සහ ඉතිරි භාගය සදා අඳුරේ තිබෙන ආකාරය ඔවුන් සැබැවින්ම දැකගත්හ. එනම්,  සිය අක්ෂයේ පැය විසිහතරකට වරක්,

පෘථිවිය භ්‍රමණය කරන අතර, එම කාලය තුළ හිරු එළිය ලැබූ පෘථිවියේ අඩක් එක් වරක් කැරකීමට ලක්වෙයි. දහවල හා රාත්‍රියේ මෙම නිරන්තර භ්‍රමණය ශුද්ධ වූ කුර්ආනයේ ඉතා පැහැදිලි ව සඳහන්වි තිබේ. නවින විද්‍යාව වර්දනයවී ඇති මෙම යුගයේ පෘථිවියේ භ්‍රමණය සහ සූර්යයාගේ නිශ්දලනය ලෙස පෙනෙන සියුම් චලනය ගැන දන්නා නවින මිනිසා මෙය පහසුවෙන් වටහා ගනී. පෘතිවියේ නිරන්තර කැරකීම ගැන ශුද්ධ වූ කුර්ආනය පැවසුවේ පෘථිවියේ ගොaලාකාර හැඩය කවුරුත් පිළිගත් සත්‍යයක් බව ප්‍රකාශ කරමිනි. එහෙත්, ඒ බව මිනිසා දැන සිටියේ නැත.

5. මිනිසාගේ පැවැත්මට ජලය අවශ්‍යවන ආකාරය ගැන ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වැකි පාරායන කරනවිට, කවුරුත්පිළිගත් සතයයක් එහි සඳහන් වන බව පෙනේ. ස්වභාවිකව තිබෙන ජල චක්‍රය පිළිබඳව සුළු වශයෙන් හෝ කවුරුත් දැන සිටීම එයට හේතුවේ. කෙසේ වෙතත්, මෙම විෂය පිළිබඳව විවිධ පැරණි මත ගැන සලකා බැලුවහොත් ශුද්ධ වූ කුර්ආනය පහළවූ කාලයේ මිනිසා පිළිගත් මිථ්‍යා සංකල්ප කිසිවක් ශුද්ධ වූ කුර්ආන් හි ඇතුළත් නොවූ බව දැක ගත හැක.

ක්‍රිස්තු පූර්ව හත්වන වර්ෂයේ මිලෙටස් හී ජිවත් වූ තෙලස් නම් විද්‍යාඥ යෙක්, වේගවත් සුළඟ නිසා සාගරයේ ජලය පොළොවට ඇතුළළු එ◌ෙමන් ඇල, දොල, ගංගා මගින් පානිය ජලය ලැබෙන බවට වාදයක් ඉදිරිපත් කළේය. ප්ලේටෝ ද මෙම මතය පිළිගත් අතර, පතුලක් නොමැති විවරයකින් එම ජලය සාගරයට ආපසු හැරී යන බව ඔහු ප්‍රකාශ කළේය. ඩෙස්කාටස් වැනි ජනප්‍රිය වද්වතුන් පවා මෙම සංකල්පය

නිවැරදි බව පිළිගත්හ. පසෙන් පිටවන ජලයේ වාෂ්ප උකු වී ගල් ලෙන් හී රැස්වී පොළොව පතුලේ වැව් සාදනු ලබන අතර, ඒවායින් උල්පත් මතුවන බව අරිස්ටෝටල් කල්පනා කළේය. පළමුවන ශත වර්ෂයේ ජීවත් වූ සෙනේකා ඇතුළු යුරෝපයේ බොහෝ දෙනෙක් එහුගේ මතය 1877 වසර දක්වා පිළිගත්හ. ජල චක්‍රය පිළිබඳව පැහැදිලි සංකල්පයක් ඉදිරිපත් කළේ 1580 වසරේ බර්නාඩ් පැලිසි නම් විද්‍යාඥයෙකි. වැසි ජලය පස තුලට ගොස්, පොලොව යටින් උල්පත් වශයෙන් එන බව ඔහු පැවසුවේය. එහෙත් එම මතය ජනප්‍රිය නොවනේය. මෙරියට් සහපිරෝල්ට් යන විද්‍යාඥයන් මෙම මතය 17වන ශත වර්ෂයේ සනාථ කළහ. එදා යුරෝපානු අධ්‍යාපනයේ පැවති සැබෑ තත්ත්වය මෙයයි.

මුහම්මද් (සල්) තුමාණෝ ජීවත්වූ කාලයේ පැවති මෙවැනි වැරදි සංකල්ප කිසිවක් ශුද්ධ වූ කුර්ආනයේ දක්නට නැත. එහෙත් ඒ ගැන ශුද්ධ වූ කුර්ආනය පවසන්නේ කුමක් දැයි බලමු.

අල්ලාහ් අහසින් ජලය පහළ කොට, පොළෝවෙහි දිය උල්පත විලාසයෙන් එය ගමන් කෙරෙව්වේය.” ශුද්ධ වූ කුර්ආන් 39-21. මු ලොවම අඳුරේ සිටියදී මෙවා මුහම්මද් (සල්) තුමාණන්ට ඉගැන්වූයේ කවුද?

6.පොළොවෙහි පිහිටා තිබෙන නැම්ම (folds), කඳුවලට අත්තිවාරමක් ලෙස කටයුතු කරන බව භූ විද්‍යාව පිළිබඳ නවක විද්‍යාඥයෝ විස්තර කරති. ඒවායේ ගැඹුරු සැතපුම් එකේ සිට සැතපුම් දහය දක්වා තිබෙන බව සොයා ගෙන ඇත. මෙම ස්වාභාවික නැම්මෙ ප්‍රතිඵලයක් වශනේ පොලොවෙහි

ස්ථාවරත්වය පවතින බවද තව දුරටත් ඔවුහු පවසති. මේ තරම් වැදගත් විෂය ගැන ශුද්ධ වූ කුර්ආනය මෙසේ සඳහන් කිරීම පුදුමයට හේතුවක් නොවේ.

“ඔවුන් සහ එය නොසැලෙනු පිණිස පොළොවෙහි තරසර කඳු පිහිටිව්වෙමු.“ 21-31.

7.ගුවන්තලයේ තිබෙන විදුලි බලය සහ එහි ප්‍රත්ඵලයක් වශයෙන් සිදුවන අකුණු සහ හිම කැට වැස්ස පිළිබඳව ශුද්ධ වූ කුර්ආනය සඳහන් කරන්නේ මෙසේය. “බියක් ලෙසද සතුටක් ලෙසද ඔබට විදුලිය පෙන්වන්නේ ඔහුය. බර වලාකුළුද නිර්මානය කළේය.“ 13-12

අල්ලාහ් වලාකුළු හෙමින් පාවෙන්නට සලසන්නේය. පසුව එය රැස් කරන්නේය. පසුව එය පටල බවට පමුණුවන්නේය. එබ මෙය නුදුටුවෙහිද? එවිට එය අතරින් වැසි වටවන්නේය. ඔහු සිතු කෙනෙකුට එයින් පහර දෙන්නේය. එහු සිතු කෙනෙකුගෙන් එය වළක්වන්නේය. එහි විදුලි යේ ආලෝකය දර්ශනය පැහැර ගන්නට ළංය.“ 24-43.

මෙම වාක්‍යයන් දෙකේ, ජලය දෙන වැසි වලාකුල් සහ හිම වැසි වලාකුල් රැස්විමද ඒවායින් විදුලි බලය නිකුත් විම පිළිබඳවද සම්බන්ධකමක් තිබේ. එක් කරුණකින් මිනිසාට සහන හිමිවන බවද, අනික බියට හේතුවන බවද පෙන්වයි. මෙය සිදුවන්නේ අල්ලාහ්ගේ අණට එකඟවයි. මෙම ස්වාභාවික සිදුවීම නවින විද්‍යාත්මක දැනුම සැසඳෙන බව සලකන්න.

8. මුහුදු මට්ටමේ සිට අධික උස ස්ථානයක සිටින විට කෙනෙකුට අපහසු තාවයක් ඇතිවීම සාමාන්‍යයන් අපි දන්නා දෙයකි. තවත් ඉහලට නඟින විට මෙම අපහසුතාවය තවත් වැඩිවේ. කඳු ප්‍රදේශවල නඟින විට හෝ අජටාකාශ ගමනේදී ද මෙය සිදුවනු ඇත. මේ ගැන "අල්ලාහ් යමකු යහ මාග යවන්නට සිතන්නේද, ඔහුගේ සිත ඉස්ලාම් මගෙහි පුළුල් කරන්නේය. යමකු අයමඟට යවන්නට සිතන්නේද. එහුගේ සිත අහසට නඟින්නෙකු මෙන් තද අවහිර කරන්නේය." 6-125 ලෙස අල් කුර්ආනය පවසයි. ගුවනේ ගමනේ යෙදෙන ගගනාවින් මෙම තත්ත්වය පිළිබඳව හොඳකාර දනිති.

9. සෙවනැල්ලේ ස්වාභාවය ගැන ශුද්ධ වූ කුර්ආන් මෙලෙස පවසයි. "අල්ලාහ් නිර්මාණය කළ දැය ඔවුහු නොදැක්කෝද? එහි සෙවණැලු බැගෑපත්ව අල්ලාහුට සුජූද් කරමින් දකුණෙන්ද වමෙන්ද නැමැන්නෝය." 16-48.

හිර සහ සෙවනැලි අතර තිබෙන සම්බන්ධතාවය එම වාක්‍ය පවසයි. මුහම්මද් (සල්) තුමාණන්ගේ කාලයේ නැගැනහිර සිට බටහිර දෙසට හිරු ගමන් කළ අයුරින් සෙවනැල්ලේ චලනය සිදුවූ බව කවුරුත් විශ්වාස කළ බව මෙහිදි මතක් කළ යුතුයි. මෙම ප්‍රතිපත්තියට එකඟව උදේ සිට හිරු බඟින තුරු වේලාව මනින්නට. හිරු තැටිය (Sundial) සොයා ගනු ලැබිය. එදා පැවැති වැරදි මත ගැන කිසිවක් සඳහන් නොකර. ස්වාභාවික සිදුවීමක් ලෙස මේ කරුණු ශුද්ධ වූ කුර්ආන් ඉදිරිපත් කරයි. මුහම්මද් (සල්) තුමාණන්නට පසුව පැමිණි පරම්නරා ගණනාවක් සූර්යය චලනයයේ මත සත්‍ය

බව පිළිගත් නමුදු, අවසානයේ පෘථිවියේ චලනය සැබෑ බව දැනගත් විගස එම මතව වැරදි බවට පත්විය.

10. ජීවයේ මූලාරම්භය ගැන පවසන විට අල් කුර්ආනය ඉතාමත් ලුහුඬින් කරුණු පවසන බව කොයි කාටත් දැක ගත හැකිය. ඒ ගැන පවසන වැක්‍යයෙහි විශ්වයේ නිර්මාණය ගැනද සඳහන් කෙරේ. “තඅහස් හා පොළොව බද්දව තිබී, අපි ඒ දෙක දෙබෑකෙළෙමු. තවද දිවි ඇති සියලු දෑය ජලයෙන් අපි නිර්මාණය කළෙමු. යයි විශ්වාස නොකරන අය නොදකිත් ද?” 21 – 30

ඇත්ත වශයෙන්ම ජීවයේ මූලාරම්භය ජලය වූ අතර, සියලු ජීවමාන සෛලයන්හී ප්‍රධාන කොටස ජලය වේ. ජලය නොමැති නම් ජීවියක් පැවතිය නොහැක. අති පැරණි ජීවින් ශාක ලෝකයට අයත් බව නවීන දත්ත ප්‍රකාශ කරයි. කේම්බ්‍රියන් යුගය ලෙස හැඳින්වන අති පැරණි භූමියට අයත් අල්ගේ (Algae) දැන්සොයා ගැන ඇත. එම යුගයට පසුව, සත්ව සංහතියට අයත් ජීවීන් පැමිණි අතර. ඒවාද ආරම්භ වූයේ ජලයෙනි.

11. ශාක ලෝකයේ පුනරුත්පාදනය ක්‍රම දෙකකින් සිදුවන බව මතකයේ තබා ගත යුතුය. ජෛව ක්‍රියාවලිය මගින්, උපත දුන් ශාක මෙන් තවත් ශාකයක් පැමිණීමේ ක්‍රමයට පුනරුත්පාදනය කිරීම යන පදය ගැලපේ. ඇතැම් ශාක අලිංගික (Asexual) බෝ කිරීමෙන් සිදුකරන්නේ තම සංඛ්‍යාව වැඩි කිරීමයි. එක ශාකයේම හෝ වෙනත් ශාකයේ පිහිටි පිරිමි සහ ස්ත්‍රී ජාන කොටස් සම්බන්ධවීමෙන් ශාක ලෝකයේ

පුනරුත්පාදනය සිදු කොරේ. මෙම ක්‍රමය පිළිබඳව ශුද්ධ වූ කුර්ආන් මෙසේ පවසයි.

"අහසින් ජලය පහළ කොට, එකිනෙකාට වෙනස් වූ විවිධ උද්භිද ජාතියෙන් ජෝඩු හට ගැන්වියෙමු." 20-53.

ස(z)වුජ් යන පදයට  යන පදයට (අස්(z)සව්වාජ් යනු බහු වචනයවේ) ජෝඩුවක් යන අර්ථයවේ. එනම් එකක් තව එකක් සමඟ එක් වී ජෝඩුවක් සෑදීම. මෙම පදය විවාහ යුවලදට අරාබියෙන් භාවිතාවේ.

12. බඹරා පිළිබඳව ශුද්ද කුර්ආනය මෙසේ පවසයි. "කඳුහිද, ගස් හීද ඔවුන් හෙවින් හෙවිලි කරන දැයෙහිද, මීවද බඳිනු. යි ඔබගේ පරමාධිපති බඹරාට ඉව දුන්නේය. පසුව, සියලු එලයෙන් අනුභව කරනු. ඔබේ පරමාධිපත් පහසු කළ මාර්ගයේ සැරවු. උන්ගේ උදරයන් ගෙන් විවිධ වර්ණවත් පානයන් වැහෙන්නේය. එහි මනුෂ්‍යයාට සුවය එළවන්නේය. ඇත්තෙන්ම මෙනෙහි කරන ජනතාවකට එහි දෘෂටාන්තයෙක්මය." අල් කුර්ආන්16- 68 සහ 69.

මෙම වාක්‍ය දෙකෙහි වැදගත් කරුණු තුනක් අඩංගුවී ඇත.

අ. බඹරාගේ හැසිරීම අල්ලාහ් විසින් තීරණය කරන ලදී. විශිෂ්ට ස්නායු පද්ධතියක් බඹරාගේ හැසිරීමට සහායවෙයි. එක්තරා රැඟුම් ලීලාවෙන්, අනිත් බඹරුන් සමඟ ඔවුන් පණිවුඩ හුවමාරු කරගන්නා බව දැන් විද්‍යාව උගත් කවුරුත් දනී. මේ ක්‍රමයෙන්, රොන් තිබෙන මල් ආති දිසාව සහ දුර ප්‍රමාණය අනිත් බඹරුන්ට දන්වන්නට ඔවුන්ට හැකිවේ. වොන් ෆිස්ෂ් නම් විද්‍යාඥයා සේවක පිලට අයත් බඹරු අතර පණිවුඩ

හුවමාරුව, ඔවුන්ගේ චලනය තුළින් සිදුවන බව පෙන්වා දුන්නේය.

ආ. රෝග රාශිකට ඖෂධයක් වශයෙන් මී පැණි ගත හැක. මේ කරුණු දැනටමත් විද්‍යානුකූලව තහවුරු වී ඇත. ඇමරිකාවේ ෆ්ලොරිඩාවේ පැනාමා නගරයේ පිහිටි අක්බාර් සායනයේ, ශරීරයේ ප්‍රතිශක්ති කිරීමේ හැකියාව සුදු ලූනු. කළුදුරු සහ මී පැණි යන ඖෂධවලින් ලැබෙන සහාය පිළිබඳව 1986 වසන්ත කාලයේ පටන් සාර්ථක පරීක්ෂණ පැවැත් වූ බව ඉස්ලාමික් හොරයිසන් සඟරාවේ 197 නොවැම්බර් මස කලාපයේ වාර්ථා කරයි.

මීපැණි පිළිබඳව සිදු කළ පර්යේෂණයක් කැන, ඇමරිකානි වෛද්‍ය සඟරාවේ පල වූ ලිපියක සාරාංශය දෙස බලමු.

මිනිස් රෝගයට තුඩු දෙන විෂ බීජය විනාශ කිරීමේ බලවත් ශක්තිය මී පැණිවලට තිබේ. විසිවන ශත වර්ෂය දක්වා ඒ ගැන නොදැන, බටහිර ලොව අන්ධකාරයෙහි සිටියේය. ඇමරිකාවේ, ෆෝට් කොලින්ස් නගරයේ, කොලරාඩෝ කෘෂිකර්ම විද්‍යාලයේ ආචාර්ය W.G.සැකට් නම් විද්වතෙක්, කිරි මෙන් මී පැණිද විෂ බීජ තකුරුවන බව විද්‍යානු කූලව තහවුරු කරනු පිණිස පර්යේෂණයක් පටන් ගත්තේය. ඔහුගේ කුතූහලයට තුඩු දෙන පරිදි පිරිසුදු මීපැණියට එහු එකතු කළ විෂ බීජ සියල්ල විනාශ වී යනු ඔහු දුටුවේය. උණසන්නිපාත රෝගයට හේතුවන විෂ බීජය, මිපැණියට මිශ්‍ර කිරීමෙන් අනතුරුව පැය 48කින් විනාශවුනි. ආමාශය තුළ ඉදිමීම සඳු කරන එන්ටරිටයිඩස් නම් විෂ බීජය, පැය 48කින් විනාශ විය. ශ්වාස නාලය ඉදිවීමෙන් සුවන නියුමෝනිය සහ සෙප්ටිස්මියා උණ අති කරණ බලගත්

විශබීජය දින 48කින් විනාශ විය. ඇතැම් තත්ත්තවය යටතේ පෙරිටෝනයිටිස් නොහොත් අන්ත්‍රාවරණය ඉදිමීමේ රෝගය සිදුකරන බැසිලස් කොලි කොමුනිස් නම් විශබීජය, දින 5කින් විනාශවිය. මෙයට අමතරව විෂබීජ විශාල සංඛ්‍යාවක් මි පැණියෙන් විනාශ කළ හැකි බව වෛද්‍ය බොඩොග් බෙක් සනාථ කරයි. මෙසේ සිදුවීමට හේතුව මි පැණියේ තිබෙන ජලාකර්ෂණ ගැණයයි. එනම් විෂබීජයේ තිබෙන සියලු තෙතමනය උරාගෙන, ඒවා වියලි කිරීමේ හැකියාව මී පැණියට තිබීමයි. වෙනත් ජීව වස්තූන් මෙන් විෂබිජයටද තෙමෙනය අවශ්‍යවන අතර,තෙතමනය නොමැතිතත විට එය නැසී යයි. තෙතමනය උරා ගැනීමට මි පැණියට ඇති හැකියාවට සීමාවක් නැත. ලෝහය, විදුරු පමණක් නොව, කලු ගලෙන් පවා තෙත් ගති උරා ගැනීමට මී පැණියට හැකියාවක් අතැ. (රෝසිකෘසියන් ඩයිජස්ට් 1975 සැප්තැම්බර් කලාප පියටු අංක 11.) ශුද්ධ වූ කුර්ආනය නිත්‍ය ප්‍රතාභායීයකි නම් කෘතියේ මව්ලානා වහීදුද් දීන් කාඃන්.

ඇ. ආහර සොයන සේවක පිලේ සියලුම බඹරුන් ගැහැනු සතුන්ය. ශුද්ධ වූ කුර්ආනයේ භාවිතා කෙරෙන ක්‍රියා පදය, ස්ත්‍රී පක්ෂයට අදාලවන අතර, මෙය මහත් විශ්මයට හේතුවකි.මැත කාලය දක්වාම, සෙබල බඹරා පිරිමි සතෙක් බව සැවෝම සිතුවෝය. ශේක්ස්පියර්ගේ කාලයේ පවා මෙම මතය එංගලන්තයේ පැතිර තිබුණි.

සේවක බඹරු ගැන බ්‍රිතාන්‍ය විශ්ව කෝශය මෙසේ පවසයි. ඉතා විශාල සංඛ්‍යාවක් සිටින සේවක බඹරු සියලු දෙනාම ගැහැණු සතුන් වේ. ඔවුන් පැටවුන්ට ආහාර සැපයීම, නිවස

ශුද්ධ වූ පවිත්‍ර කිරීම, අනවසරයෙන් ඇතුළු වන්නන් පලවා හැරීම, වදය නිර්මාණය කිරීම, රොන් සහ මල් පැණි රැස් කිරීම වැනි කාර්ය සියල්ල ඉටු කරති.

13. ගවයන් ගෙන් ලැබෙන කිරිවල උල්පත සැරුරේ කොතැනක දැයි ශුද්ධ වූ කුර්ආනය සපයන දත්ත, නූතන විද්‍යා දැනුමෙන් සම්පූර්ණයෙන් සනාථ කෙරේ.

"සැබැවින්ම, ගවයින් ගෙන් ඔබට පාඩමක් ඇත. උන්ගේ සිරුර තුළ. උදරයන්හී තිබෙන දැයින් සහ ලේ අතරින්, පානය කරන වුන්ට කදිම හා පිරිසිදු කිරි සපයමු." 16-66.

ගවයන්ගේ කිරි ඔවුන්ගේ ස්තන ග්‍රන්ථියේ (Mammary Glands) නිපදවනු ලබයි. රුධිර මාර්ගයෙන් සපයන ගද, ජීර්ණය කරනු ලබන ආහාරයි මෙය පෝෂ්‍ය කරයි. මේ අයුරින් ජීර්ණය කළ ආහාරයෙන් ලබා ගත් පෝෂනය රැස් කිරීම, ස්තන ග්‍රන්ථයට එය ප්‍රවාහණය කිරීම වැනි සියලු කාර්යයන් රුධිරයෙන් සිදු කෙරේ.

මෙහිදී සියලු ක්‍රියාවලිය පටන් ගන්නේ, අන්ත්‍රය තුළ (බඩ වැල) ජීර්ණය කරනු ලබන ද්‍රව්‍ය සමඟ රුධිරය එහිදී මිශ්‍ර කිරීමෙහි රසායන හා කායික විද්‍යාව මෑත කාලයේ සොයා ගත් විස්තර මෙය හා සම්පූර්ණයෙන් සැසඳේ. මුහම්මද් (සල්) තුමාණන්ගේ ජීවිත කාලයට මෙම දැනුම කිසිසේත් අදාල නොවන අතර, මෙම සොයා ගැනීම නූතන යුගයට අයත් එකකි. ශුද්ධ වූ කුර්ආනය පහළ වී වසර දහසක් පමණ පසුව රුධිර සංසරණය (Blood Circulation) පිළිබඳව සොයා ගත්තේ හාර්වි (Harvey) නම් විද්‍යාඥයෙක්ය.

“එම යුගයේ පැවැති දැනුම හා සසඳා බලන විට. මෙවැනි සත්‍ය තොරතුරු අඩංගු වාක්‍ය ශුද්ධ වූ කුර්ආනයේ තිබෙන්නේ කෙසේදැයි පහදා දෙන්නට මිනිසාට කොහෙත්ම නොහැකි බව මම සිතමි.“ යනුවෙන් මොරිස් බුකෙයිල් පිළිගනී.

14. මානව අභිජනනය පිළබඳව ශුද්ධ වූ කුර්ආනයේ වැදගත් තොරතුරු රාශියක් දක්නට තිබේ.

අ. ගැබ් ගෙනීම සඳහාඅවශ්‍යවන්නේ ඉතාමත් සුළු ප්‍රමාණයක ද්‍රව්‍යයයි. මෙම සත්‍යය එකොළොස් වතාවක් ශුද්ධ වූ කුර්ආනය මෙලෙස පවසයි. “ඔහු (අල්ලාහ්) සුළු ප්‍රමාණ (ද්‍රව)යෙන් මිනිසා නිර්මාණය කළේය.“ 16-4

නුත්ෆා යන අරාබි පදයට, සුදුසු පදයක් වෙනත් භාෂාවන්හී නොමැති හෙයින් සුළු ප්‍රමාණය යන වචන මාලාව යොදා ඇත. භාජනයක ඉතිරි වී රැඳී තිබෙන ද්‍රව බේරෙන ක්‍රියාව මෙයින් අදහස් කෙරේ. එනිසා නුත්ෆා යන පදය සුළු ප්‍රමාණයේ ද්‍රව ලෙස පරිවර්ථනවේ.

ආ. මිනිසාගේ සිරුරේ ස්ථාන හතරකින් නිෂ්පාදන කරනු ලැබ, ඒවා මිශ්‍රවිමෙන් අනතුරුව අනතුරුව, ශුක්‍රාණු ද්‍රව ලැබෙන බව දෛව්‍ය විද්‍යාව දැන් සොයා ගෙන අතැ. ශුද්ධ වූ කුර්ආනය මෙය ශත වර්ෂ 14කට පෙර පැවසු ආකාරය කෙසේ දැයි බලමු. “සැබැවින්ම, අපි සුළු ප්‍රමාණයේ ද්‍රව මිශණයෙන් මිනිසා නිර්මාණය කළේමු.“ 76-2.

ඇ. මව් කුස තුළ දරුවෙක් පසු කරන නොයෙක් අදියර පිළිබඳව ශුද්ධ වූ කුර්ආන් සපයන විස්තර දෙස බලමු.

“අහෝ මනුෂ්‍ය යෙනි, ඔබ පුන්රුත්ථානය ගැන සැකයෙහි නම්, අපි ධූලියෙන්ද, පසුව කළලයෙන්ද, පසුව ඝන ලේ කැටියෙන්ද, මූර්තිමත් වූද, මූර්තිමත් නොවූද, මාංශ පිණ්ඩ යෙන්ද, අප ඔබට පැහැදිලි කරනු පිණිස නිර්මාණය කළෙමු. අපි සිතූ දැය නියමිත කලකට ගැබ් හී පිහිටන්නට සලස් සන්නෙමු. පසුව එබ පැටවුන් ලෙස ප්‍රජනනය කරවන්නෙමු.“ 22-5

“ඔහු වත්කරන ලද සුළු ප්‍රමාණ ද්‍රව නොවෙුයේද? පසුව ඔහු ඇලී සිටින ඝන ලේ කැටියක් වුය. පසුව අල්ලාහ් එය අඹා හැඩ ගැස්සුවේය.“75-37, 38.

ඈ. කළලය තුළ අස්ථි (ඇට කටු) සෑදිම සහ ඒවා මාංශයෙන් ආවරණය වීම යන අදියර පහත් සඳහන් ශුද්ධ වූ කුර්ආන් වැක්‍ය පැහැදිලි කරයි.

“පසුව අපි, ඇලී සිටින දැය. ඝන ලේ කැටියක් කෙළෙමු. පසුව ඝන ලේ කැටිය අපි, මාංශ පිණ්ඩයක් කෙළේමු. පසුව මාංශ පිණ්ඩය ඇට කළෙමු. පසුව ඇට, මාංශයෙන් වැසුවෙමු. පසුව එය තවත් නිර්මාණයක් කෙළෙමු.“ 23-14.

ඇත්ත වශයෙන්ම, මෙම අදියර සමහරක් ගැන මිනිසා දැනුම ලැබු වේ 19 ශත වර්ෂයේ දීය. මධ්‍යතන යුගයේ ගර්භාසය පිළිබඳ ශාස්ත්‍රෙය් විවිධ මත එම යුගයේ තිබුණි. පදනම් විරහිත නොයෙක් මත්‍යා මතද ආරම්භ වී ශත වර්ෂ කිහිපයක් ඒ ආකාරයෙන් පැවැතුණි. සියලු ජීවීන් එක බීජුවකින් ආරම්භය ලැබූ බව1651 වර්ෂයේ හාවි නම් විද්‍යාඥයෙක් ප්‍රකාශ කළේය. මේ කාලයේ. සූක්ෂම දර්ශකය

(මයික්රෝස්කෝප්) සොයා ගන්නා ලදුව, විද්‍යාව එයින් විශාල ප්‍රයෝජන ලබන්නට පටන් ගත්තේය. එහෙත්, බීජුව සහ ශුක්‍රාණුවේ ක්‍රියා කලාපය පිළිබඳවමිනිසුන් තවමත් සාකච්ඡා කරමින් සිටියහ. බෆෝන් නම් ස්වාභාව පිළිබඳ විද්‍යාඥයා. බීජ සිද්ධාන්තයට පක්ෂව කථා කළ අතර මිනිසාගේ ආරම්භක මව වන ඊවාගේ කුසය තුළ, මනුෂ්‍ය වර්ගයාගේ සියලු බීජ, එකිනෙක තුළ පොදි වශයෙන් තැන්පත් කර අවසාන බව බෙනට් නම් යුරෝපානු විද්‍යාඥයෙක් පැවසුවේය. මෙම වැරදි මත දහ අට වන ශත වර්ෂයේ යුරෝපයේ කවුරුත් ඒකමතිකව පිළිගත් එකකි.

'අපට වසර දහසකට පෙර කවුරුත් හිතුමතේ අදහස් ඉදිරිපත් කළ යුගයක. ශුද්ධ වූ කුර්ආනය පිළිබඳ අධ්‍යාපනය ලත් මිනිසුන් පිරිසක් සිටියහ. ශත වර්ෂ කිහිපයක් ඉතාමත් වෙහෙස දරා මිනිසා සොයා කත් ඉතා පැරණි සත්‍ය පිළිබඳ තොරතුරු, සාමාන්‍ය වචන උපයෝගි කරමින් ශුද්ධ වූ කුර්ආනයේ එවකට අඩංගු වී තිබුණි.' යනුවෙන් මොරිස් බුකෙයිල් ප්‍රකාශ කරයි.

කැනඩාවේ, ටොරොන්ටෝ විශ්ව විද්‍යාලයේ මාහාචාර්ය කිත් මූර් නම් ලොක ප්‍රකට විද්වතෙක්, සර්භාශය තුළ දරුවෙකුගේ වර්ධනය පිළිබඳව ශුද්ධ වූ කුර්ආය පවසන තොරතුරු දැක මහත් මවිතයට පත්විය. වෛද්‍ය විශේෂඥයන් සඳහා ඔහු රචනය කළ කෘතියේ අල් කුර්ආන් සපයන විස්තර සියල්ල ඇතුලත් කිරීමට ඔහු අමතක නොකළ අතර, ඔහු විසින් ලියන ලද එවැනි පොත් භාෂා අටකින් නිකුත් වන බව මෙහි සඳහන් කළ යුතුයි.

මිත්‍රවරුනි, ඉහත සඳහන් ලයිස්තුවේ ශුද්ධ වූ කුර්ආන් වැකි 20 ක් පමණ සඳහන් කරන ලදී. මේ සියලු වැකි සත්‍ය බව නිවින දැනුම හා තාක්ෂණය සනාථ කරන අතර. ඒවායින් සමහරක අර්ථය ගැන අනාවරණය වූයේ ඉතාමත් සමීප කාලයේධ නාසා වැනි ආයතනයේ මෙහෙය විමෙන් බව මතකයේ තබා ගත යුතුයි. මෙම ලැයිස්තුවේ අඩංගු සම්මිශ්‍රණයෙන් එක් වාක්‍යයක් හෝ එකකට එක වැඩි වැකි හෝ හෝ අඩංගු සම්මිශ්ණය අසත්‍ය බවට පත් වීමේ අවස්ථා 1,048,580 බව ගණිත ශාස්ත්‍රය පෙන්වයි. ඒවා අතර, වාක්‍යයන් විස්සම නැවැරදි වන සම්මිශ්‍රණය එකම එකයි. මෙම වැක්‍ය නිකුත් කරන ලද යුගය.එහි ඓතිහාසික පසුවිම, එහි විස්තර සොයා ගන්නට සුදු වූසංකීර්ණ පරීක්ෂණ සහ වාක්‍යයන්හී දක්නට තිබෙන නිර්දෝෂ හා නිරවද්‍යතාවය ගැන සළකා බලනවිට. මේවා මිනිසා විසින් රචනය කරන ලද වැකි බව කොහෙත්ම පිළිගත නොහැක. මුහම්මද් (සල්) තුමාණන්ට හෝ ඕනෑම ශ්‍රේෂ්ට බුද්ධිමතෙකුට ජීවිතයේ සම්භවය. ප්‍රසාරණය වන විශ්වය, කළල වර්ධනයේ විවිධ අදියර,ගවයන්ගේ කිරිවල ස්වාභාවය සහ ඒවායේ නිෂ්පාදනය යන සියලු විස්තර ගැන සම්පූර්ණ දැනුම සහිතව කථා කළ හැකිවන බව ලිළිගත හැකිද? ශුද්ධ වූ කුර්ආනයේ මෙවැනි තවත් වැකි සිය ගණනාවක් දක්නට තිබෙන අතර, නවීන අධ්‍යාපන ක්‍රමය තුළින් මිනිසා ඒවා දින පතා අවබෝධ කර ගන්නා බව කවුරුත් දනී.

“විශමය ජනක කුර්ආනය“ යන මාතෘකාව යටතේ කථාවක් පැවැත් වූ ගැරි මිලර් නම් විද්වතෙක්, තවත් වැදගත්

කරුණු කිහිපයක ගැන සඳහන් කෙළේය. ඒවායින් සමහරක් උපුටා දක්වමු.

“ඛාලූ“ (Qaloo ඔවුන් පවසති) යන පදය 332 වරක් ශුද්ධ වූ කුර්ආනයේ තිබෙන අතර. ඒවාට පිළතුරු වශයෙන් “ඛුල්“ (Qul පවසනු) යන අණ කිරීම 332 වරක් සඳහන්වී ඇත. මේ වචන දෙකම එකිනෙකට ළඟින් සඳහන් නොමැති බව සළකන්න.

අහස් හත යන පද අල් කුර්ආනයේ හත් වරක් සඳහන් වී තිබේ.

වසරකට මාස දොළොහක් තිබෙන බව අපි දනිමු. “ශහර්“ එනම් මාසය යන පදය දොළොස් වතාවක් අල් කුර්ආනයේ සඳහන් වේ.

“යවුම්“ එනම් දවස යන පදය 365 වතාවක් ශුද්ධ වූ කුර්ආනයේ සඳහන්වේ.

වචන භාවිතය සහ වචනය ගැන සඳහන් කිරීම යන වැදගත් විෂය ගැන මිලර් සාකච්ඡා කරයි. සවස යන පදයේ “ස“ අකුරු දෙකක් තිබෙන බව පවසන විට, අපි සඳහන් කරන්නේ පදයේ අර්ථය නොව. පදය ගැනයි. බයිබලයේ කිසිදු වැරැද්දක් නොමැති බව යම් කෙනෙක් පවසන විට “ඩේවිඩ් වැරැද්දක් කළේය“ යන වාක්‍ය යෙහි එම පදය තිබෙන බව පෙන්විය හැක. එහෙත් බියිබලයේ වැරැද්දක් නොමැති බව කොහෙත්ම සඳහන් වී නැත. මෙවැනි සියුම් කරුණු ශද්ධවූ කුර්ආනයේ දක්නට නොමැති වීම මවිතට හේතුවකි.

“ඔවුහු අල් කුර්ආනය ගැන ඕනෑකමින් සිතා නොබලන්නේද? මෙය අල්ලාහ් හැර වෙන කෙනෙකුගෙන් නම්, එයි බොහෝ විෂමතා දක්නෝය“ යනු 4-82 වාක්‍ය දන්වයි.

“ඉඃතිලාෆන්“ යන අරාබි පදය, විසමතා යනුවෙන් පරිවර්තනය කෙරේ. මෙහිදී ඉඃතිලාෆන් නොමැති බව ශුද්ධවූ කුර්ආනය පවසන් හෙයින් එවැනි ඉඃතිලාෆන් යන තවත් පදයක් යමෙක් ශුද්ධවූ කුර්ආනයේ දුටුවේ නම්, එහි ඉඃතිලානේ කිහිපයක් තිබන බවද, එනිසා ශුද්ධවූ කුර්ආනය දේව ග්‍රන්ථයක් නොවන බවද තර්ක කිරීමට ඉඩ ඇත. ශුද්ධවූ කුර්ආනය මෙවැනි තර්කයට පවා ඉඩ නොදෙයි. සම්පූර්ණ ශුද්ධවූ කුර්ආන හී ඉඃතිලානේ යන පදය සඳහන් වන්නේ, එක් අවස්ථාවක බවද එය 4-82 වන වාක්‍ය යෙහි බවද මිලර් තව දුරටත් පෙන්වා දෙයි.

යම් දෙයක් තවත් එකක් හා සමාන බව ශුද්ධ වූ කුර්ආනය පවසන විට, ඒ දෙකම සඳහන් වන අවස්ථාවන්ද සමාන බව ගැරී මිලහ් පවසයි. ඒපමණක් නොව, එම කරුණු දෙකම එක වාක්‍යයෙහි සඳහන් වන විට, ඒ දෙකසඳහන් වන අවස්ථාවන්ද සමාන වේ. නිදසුනක් වශයෙන් ශුද්ධ වූ කුර්ආනයේ 3-55 වාක්‍ය දෙස බලමු.

“සැබැවින්ම අල්ලාහුගේ සන්නිධානයෙහි ඊසාගේ උපමාව ආදම්ගේ උපමාවට බඳුය. ඔහු (ආදම්) මැටියෙන් ඇඹුවේය. පසුව එයට ‘වනු‘ යයි කීවේය. කෙණෙහිම විය.“

ආදම් ගැන 25 වරක් ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වී තිබෙන අතර, ජේසු තුමා ගැනද 25 වරක් සඳහන් වී තිබේ. වාක්‍යයෙහි දෙදෙනාම සඳහන් වන්නේ 7වන වතාවට බව ආරම්භයේ සිට ගණන් කළ විට. කෙනෙකුට දැන ගත හැකි වේ.

මෙහිදී වැදගත් කරුණක් නම්, ශුද්ධ වූ කුර්ආනය කොටස් වශයෙස් විසි තුන් වසර කාලයක පහළ කරන ලද. 2 වන පර්ච්ඡේද වසර නවයක කාලයකින් පහළ කරන ලද අතර, 70 පමණ වැදගත් කරුණු ගැන එහි සඳහන්වේ.ලොවට ආසා කර, සිය ආශාව පිටුපස ලුහු බැඳ අල්ලාහ්ගේ සංඥා ප්‍රතික්ෂෙප කරන්නා සුනඛයා හා සමාන බව ශුද්ධ වූ කුර්ආනය පවසයි. “අල්ලදීන කද්ද බූ බිආතිනා“ යන වචන මාලාව පස් වරක් ශුද්ධ වූ කුර්ආනයේ සඳහන් වන අතර, සුනඛයා යන පදයද පස් වරක් සඳහන් වී තිබේ.

“ඔහු ලොවට ඇලුම් වී ඔහුගේ ආශාව ලුහු බඳී. ඔහුගේ උපමාව සුනඛයාගේ උපමාවයි මෙය.“ 7-176.

“නරක වචනයක උපමාව පොළෙවෙ මතින් උගුලා දමන ලද නරක ගසක් බඳුය. තිරසාර පැවැත්මක් එයට නැත්තේය.“ 14-26 බව ශුද්ධ වූ කුර්ආනය පවසයි. නරක වචන යන පද එකොලොස් වරක් අල් කුර්ආනයේ සඳහන් වන අරත. නරක ගහ පද එය හා සමාන වාරයක් සඳහන් වේ.

යමක් තවත් දෙයක් මෙන් නොවේ යයි ශුද්ධ වූ කුර්ආනය පවසන වි, ඒවා දෙක සඳහන්වන අවස්ථාවන්ද සමාන නොවන බව වැඩි දුරටත් මිලර් පෙන්වා දෙයි.

# 14. නවීනතර විද්‍යාත්මක තොරතුරු තවත් සමහරක්

1991 වර්ෂයේ මෙම කෘතිය මුද්‍රණය කළායනි පසුව, විද්‍යාඥයෝ තවත් බොහෝ දේ සොයා ගත්හ. ඒවා සියල්ලම ශුද්ධ වූ කුර්ආයෙන් සඳහන් වී තිබෙන බව විවිධ ජාතීන්ට අයත් විද්‍යාඥයින් පිළි ගෙන අවසාන අතර, ඒවායින් සමහරක් මෙහි පෙන්වන්නට අදහස් කරමි.

- මිනිසාගේ චර්මය පිළිබඳව 4-56 වාක්‍ය මෙසේ පවසයි. "සාබාවින්ම, අපගේ ආයාවන් ප්‍රතික්ෂෙප කළ එවුන් අපි ගින්නෙහි ඇතුලු කරන්නෙමු. ඔවුන්ගේ සම් පිලිස්සී යනවාත් සමගම, ඔවුන් දඬුවම් විඳීමපිණිස ඔවුන්ට වෙන සමකින් මාරු කරන්නෙමු." පිලිස්සීම තුවාල පිළිබඳව වේදනා දැනෙන්නේ චර්මයෙනි. චර්මය සම්පූර්ණයෙන් පිලිස්සුනේ නම්, එහි වේදනාව නොදැනී යන විට, යලි අලුත් සම සපයා, නිත්‍ය වේදනාව දෙන බව පවසන් මෙම ශුද්ධ වූ කුර්ආන් වාක්‍ය ගැන සෑහීමට පත් තායිලන්තයේ වියාං මායි විශ්ව විද්‍යාලයේ මහාචාර්ය තේජාන් තේජාසාන් ෂහාදා පවසා මුස්ලිම් බවට පත් විය. තම අවබෝධය ගැන විශ්ව විද්‍යාලයේ දී මහාචාර්ය තුමා දේශනා කළ අතර, ඔහුගේ සිසුන් 5 දෙනෙක් ද මුස්ලිම් බවට පත් වුහ.

- "රෝමානුවරු පරාජය කරන ලද්දෝය. සමීප භූමියෙහි (අද්න් අල් අර්ධ්) ඔවුහු ඔවුන්ගේ පරාජයෙන් පසු

පරාජය කරන්නෝය.“ යනු අල් කුර්ආනයේ 30-2 සහ 3 වාක්‍ය පවසයි.

අද්නා අල් අර්ධ යන පදයට ඉතා සමීප හෝ ඉතා පහත් භූමිය යන අර්ථ දෙකක් තිබේ. අල් කුර්ආනය විවරණය කළ විද්වතුන්, අරාබි අර්ධ ද්වීපයට ඉතා සමීප ස්ථානයේ එම සටන සිදු වූ බවට අදහස් දැක් වූහ. චන්ද්‍ර යානයේ (Satellite) උපකාරයෙන් සකස් කළ පෘථිවියේ සිතියම උපයෝගී කළ මහාචාර්ය පාමර් (Prof.Palmer) නම් ප්‍රකට ඇමරිකානු භූ විද්‍යාඥයෙක් මේ ගැන පරීක්ෂණ පවත්වා. ලොවේ ඉතාමත් පහත් මට්ටමේ භූමිය ඉස්රායීල් හී මළ මුහුද අසල තිබෙන බව සොයා ගත්තේය. ශුද්ධ වූ කුර්ආන් වාක්‍ය සඳහන් කළ අද්නා අල් අරධ මෙය බව ඔහු තහවුරු කළේය.

- ආලෝක කිරණ වර්ණ හතකින් සමන් විතයි. මෙම රශ්විය සාගර ජලයේ වදින විට එය වර්ණ හතරකට විසිරී යයි. සාගර ජලයට ආලෝක රශ්මිය ඇතුලුවන විට, ප්‍රථම ස්ථරයට අයත් පළමු මීටර් දහයේ රතු වර්ණය ඇද ගනු ලැබේ. එනම් මීටර් 30 ක ගැඹුරක කිමිදුම් කරුවෙක් තුවාල වුයේ නම්, එහුගේ සැරුරෙන් පිටවන ලේ ඔහුට නොපෙනේ. මන්ද, රතු වර්ණය එම ගැඹුරට නොයන නිසාය. මීටර් 50ක ගැඹුරේ තැඹිලි පැහැයද, මීටර් 100 ක ගැඹුරේ කහ වර්ණයද, මීටර් 200 ක ගැඹුරේ නිල් වර්ණයද ඇද ගනු ලැබේ. මේ ආකාරයෙන් සාගරයේ වඩා ගැඹුරට යන විට අඳුරු සන වෙයි. මෙවැනි තොරතුරු මිනිසා දැනගත්තේ,

සබ්මරිනය සහ සමුද්‍රයේ කිමිදෙන යන්ත්‍ර සොයා ගැනීමෙන් අනතුරුවයි. එහෙත් ශුද්ධ වූ කුර්ආනයේ 24-40 වාක්‍ය මේ ගැන සඳහන් කර අවසානයි.

“ගැඹුරු සමුද්‍ර යෙහි අඳුරු කඳු බඳුය. රැළක් ඔහු වසයි. එය මත රැළකි. එය මත අඳුරු වලාකුළ්ය. අඳුරු කඳු මත අඳුරු කඳය. යමෙක් එහුගේ හස්තය දිගු කරන්නේද , එය ඔහු නොදකින්නේය. “

- අපේ දෛනික ජීවිතයට යකඩ අත්‍යවශ්‍ය එකකි. එහෙත් යකඩෙහි එක පරමණුවක් නිෂ්පාදනය කිරීමට. මුළු සූර්‍යය ග්‍රහ මණ්ඩලයේ බල ශක්තිය මෙන් සිව් ගුණයක් අවශ්‍ය බව. ඇමරිකාවේ (NASA) ආයතනයේ සෙවය කරන මහාචාර්ය ආම්ස්ට්‍රොං අදහස් දක්වයි. එනම් යකඩ, පෘථිවියට අයත් කණිජ නොවන බවද, සූර්‍යය මණ්ඩලයට අයත් තෘථිවිය, ඉර, හඳ සහ ග්‍රහ මණ්ඩලය එකතු වුවත්, පරමාණුවක ප්‍රමාණයේ යකඩ නිපදවිය නොහැකි බවද එහු පවසයි. යකඩ පිළිබඳව ශුද්ධ වූ කුර්ආනයේ 57- 25 වාක්‍ය පවසන්නේ මෙසේයත “අපි යකඩ පහළ කෙළෙමු. එහි විශාල ශක්තියකිත එහි මිනිසුන්ට අපමණ ප්‍රයෝජනය.“

මෙම මාතෘකාව යටතේ සඳවන කරුණු සියල්ල, අබ්දුල්ලාහ් අල් රුහෙයිලි සකස් කළ මෙයයි සත්‍යය (This is the Truth) නම් කෘතියේ 1999 වර්ෂයේ මුද්‍රණයෙන් උපුටා ගන්නා ලදී.

# අවසාන දේව වාක්‍යය පිළිබඳ මිනුම් දණ්ඩ

මිනිස් සමාජය අන්ධකාරයේ ජීවත් වූ යුගයක අවසාන සංදේශක වරයා මුහම්මද් (සල්) තුමාණන්ව මිනිසා මුදවා ගන්නා පිණිස, මැවුම්කරු ලොවට එව්ය. එතුමාණෝ ගෙන ආ අවසාන නිවේදනය මුළු ලොවට සදා කාලීන යහමඟ පෙන්වීමක් ලෙස පවතින බවට සැකයක් නැත.

සත්‍ය හඳුනා ගැනිමේ මිනුම් දණ්ඩයඃ කුර්ආනය අල්ලාහ් හෙළිදරව් කළ වදන් දැයි පරික්ෂා කිරිම සඳහා පහත සඳහන් කරුණු සහාය දෙයි.

## 1. බුද්ධිමත් ඉගැන්වීම.

අපේ මැවුම් කරු අපට යුක්තිය සහ බුද්ධිය පිරිනැමු හේතුවෙන් සත්‍ය හා අසත්‍ය අතර වෙනස සෙවීම අප කාගේත් වග කීම සහ උරුමය වේ. දෙවියන් වහන්සේගෙන් පහළ වූ නිරවුල් සත්‍ය නිවේදනය සියලු අපක්ෂපාති ජනතාව විසින් යුක්ති සහගත බව පිළිගත හැකිවිය යුතුයි.

## 2. සම්පූර්ණත්වය.

අපේ මැවුම් කරු පරිසමාප්ත කෙනෙකි. ඔහුගෙන් පහළවන නිවේදනය පරිපූර්ණ හා නිරවද්‍ය විය යුතු අතර, ප්‍රමාද දෝෂය, මිත්‍ර වීම හෝ අනුවාදයේ බහුලතාවය වැනි අඩුපාඩුවලින් ආරක්ෂා ලැබිය යුතුයි. එහි සඳහන් තොරතුරු අතර පරස්පරවීම කිසිසේත් සිදුවිය නොහැක.

## 3. මිථ්‍ය කථා හෝ අන්ධ විශ්වාසය.

මැවුම් කරුවාගේ ගෞරවය කෙලසන හෝ මිනිසා පහත් බවට පත් කරන මිථ්‍යා කථා හෝ අන්ධ විශ්වාස කිසිවක් එහි නොකිබිය යුතුය.

## 4. විද්‍යාත්මකවීම.

මැවුම්කරු සියලු දැනුමෙහි හිමිකරු වන හෙයින්, සැබෑ දේව වාක්‍ය ඕනෑම කාලයක ඉදිරිපත්වන විද්‍යාත්මක අභියෝගයට මුහුණු දිය යුතුයි.

## 5. සත්‍ය අනාවැකි.

අතීතය, වර්තමානය, සහ අනාගත පිළිබඳ සියලු දැනුම් සහිත මැවුම්කරු ඕනෑම කාලයක ඉදිරිපත්වන විද්‍යාත්මක අභියෝගයට මුහුණු දිය යුතුය.

## 6. මිනිසාට අනුකරණය කළ නොහැක.

සැබෑ දේව වාක්‍ය නොවරදින එකකි එය මිනිසා විසින් අනුකරණය කිරීම සිදුනොවේ. සැබෑ දේව වාක්‍ය, ජීවමාන ප්‍රාතිහාර්යයකි. එහි අඩංගු සත්‍යතාවය සහ නිසැක භාවය දැක ගනනා ලෙස සියලු ජනයාට විවෘතව ආරාධනා කරයි. කාලය හෝ ස්ථානය එයට වැට නොබඳී.

෴෴

මිනිසා අන්ධකාරයේ ජීවත් වූ යුගයක, ශුද්ධ වූ කුර්ආනය දැන් වූ නොයෙක් විෂයයන් සැබෑ බවට අද විද්‍යාව පිළිගනී. කාලයකට හෝ ස්ථානයකට සීමා නොවන දැනුමේ උල්පතකින් ශුද්ධ වූ කුර්ආනය හෙළිදරව් කරනු ලැබූ බව සාධාරණව කල්පනා කරන අය මෙයින් වටහා ගත්හ.

මිනිසාගේ ඇසට නොපෙනෙන විෂයන් වන ආත්මය, මරණයෙන් පසු ජීවිතය, ස්වර්ගය සහ අපාය වැනි තොරතුරු එම උල්පතෙන්ම ශුද්ධ වූ කුර්ආනයේ හෙළිදරව් වී ඇත. මේ තොරතුරු ද නිරවද්‍ය සහ සත්‍ය බව මිනිසාගේ මරණයට පෙර පිළිගැනීම යුක්ති සහගත පියවරක් නොවේද?

මුහම්මද් (සල්) තුමාණන්ගේ මාර්ගයෙන් හෙළිදරව් කරනු ලැබූ ශුද්ධ වූ කුර්ආනය සහ එතුමාණෝ ගෙන ආ ඉස්ලාම් නම් සමුපූර්ණ නිවේදනය ගැන සලකා බලන්නට ඔබට කාලය එළඹුනේ නැද්ද?

කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ අල් කුර්ආනය හෙළිදරව් කළ කරුණු ගැන අවසානයේ මිනිසා අවබෝධ ලබන්නේය. එහි කතෘවරයා වන දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්නට සහ ඔහුගේ අණට එකගව ජීවත් වන්නට මරණය දක්වා බලා සිටිමට ඔබ අදහස් කරන්නේද?

ඕනෑම කෙනෙකුට සිය කැමැත්තෙන් අල් කුර්ආනය පිළිනොගෙන ප්‍රතික්ෂෙප කළ හැකි නමුත්, ඉහත පෙන් වූ තොරතුරු මත එය ව්‍යාජ ග්‍රන්ථයක් බව හෝ එහි වැරදි තිබෙන බව හෝ තර්ක කළ නොහැක.

මිත්‍රවරුනි. කැමැත්තක් කිරීමේ නිදහස සහිතව උපත ලැබූ මිනිසාට මෙලෝ ජීවිතයේ දේව වාක්‍ය ප්‍රතික්ෂෙප කිරිමේ හෝ පිළිගැනීමේ හෝ නිදහස තිබේ. එම නිදහසින් ප්‍රයෝජන ලබන්නේ කෙසේද යන්න ඔබ මුහුණ දෙන පරීක්ෂණයවේ. විවිධ යුගයේ ජීවත් වූ නොයෙක් ජාතින්ට අයත් උසස් අධ්‍යයන ලත් ජනතාව අල් කුර්ආනය පවසන සත්‍ය අවසානයේ පිළිගත් බව මෙහි පෙන්වන ලදී. ඔබේ නිගමනය ඔබට භාරයි.

අල්ලාහ් සියල්ල දන්නේය. අපේ දැනුම සීමිතයි.

සියලු ප්‍රශංසා මුලු විශ්වය මවා ආරක්ෂා කරන්නා වූ අල්ලාහුට හිමිය. සලාම් සහ සාමය මුහම්මද් (සල්) තුමාණන්ට, එතුමාණන්ගේ පවුලේ අයට, එතුමාණන්ගේ අනුගාමිකයන්ට හිමිවේවා.

සත්‍ය පෙන්වනු පිණිස අප ගත් පියවර අල්ලාහ් පිළිගත්වා.